FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER

FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2021
නොවැම්බර් (ඉල්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

36




**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

**UHF CH 60**
**PEO TV CH 22**
**Dialog Tv 21**
**Dish Tv 2532**

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

**FM 104.4 - 105.7**

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# ඉල් පෝය වර්ණනාව

වස්සාන සෘතුවේ සඳහන්වන අවසාන පොහොය වශයෙන් ඉල් පොහොය හඳුන්වාදීමට පුළුවන. ශාසන ඉතිහාසයෙහි සඳහන්වෙන වැදගත් සිදුවීම් කිහිපයක් මෙම පොහොයට සම්බන්ධ වී පවතී. බුද්ධත්වය පිණිස පාරමී ධර්මයන් පුරණ මෛත්‍රී බෝසතාණෝ දීපංකර බුදුරජාණන් වහන්සේගෙන් නියත විවරණ ලබාගෙන තිබෙන්නේද "ඉල්" පොහෝ දිනකය. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක පිරිසට කථාකොට බොහෝ ජනයාගේ හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන ලෙස අනුශාසනා පවත්වා තිබෙන්නේ ද ඉල් පොහෝ දිනකය.

(චරථ භික්ඛවෙ චාරිකා බහුජන හිතාය, බහුජන සුඛාය අත්ථාය හිතාය දෙවමනුසයානං) යථාවාදී, තථාකාරී ගුණය ප්‍රත්‍යය කරමින් බුදුරජාණන් වහන්සේද පරාර්ථ සේවයෙහි පළමුව යෙදුනේද ඉල් පොහොය මූලික කරගෙන උරුවෙල් දනව්වට වැඩමකළ බුදුරජාණන් වහන්සේ වැරදි මාර්ගයකට අවතීර්නව සිටි තුන්බෑ ජටිලයන්ට (උරුවෙල් කසසප, නදී කසසප, ගයා කසසප) දහම් දෙසා නිවන් මගට යොමු කෙළේද ඉල් පෝය දිනකය. වස් විසූ භික්ෂූන් වහන්සේලා වස් පවාරණය කොට කඨින පිංකම් ආරම්භ වන්නේද මෙම පොහොය මූලික කරගෙනය. අග්‍රශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේ පිරිනිවන් පාන්නේද ඉල් පොහෝ දිනකය.

දෙවනපෑතිස් රජුගේ අනුග්‍රහයෙන් මිහින්තලාව අවට ලෙන්වල වස් විසූ භික්ෂූන් වහන්සේලා ලංකාවේ විවිධ ප්‍රදේශවලට වැඩම කරවීම ආරම්භ වූයේද ඉල් පොහොය දිනකය.ඉල් පොහොය මූලික කරගෙන ලංකාවේ වෙහෙර විහාරස්ථානයන්හි විවිධ පිංකම් සිදුකිරීම දක්නට ලැබෙන්නේ ද විශේෂ පුණ්‍ය කාල පරිච්ඡේදයකය.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# මඟුල් මහා විහාරය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම යෝධ කණ්ඩියේ සිට චිත්ත පබබත හෙවත් සිතුල් පව්වට යන මාර්ගයට යාබදව මෙම මඟුල් මහා විහාරය පිහිටා තිබේ.

මෙම ප්‍රදේශයේ වාසය කළ ප්‍රභූ පිරිසක් විසින් ස්වභාවික ලෙන් සකස් කොට යෝගී භික්ෂූන් වහන්සේලාට පූජාකළ බව හමු වී ඇති සෙල්ලිපි වලින් පැහැදිලි වන්නේය. එබැවින් මෙම ස්ථානය අතීතයේ සිට භාවනා මධ්‍යස්ථානයක් වශයෙන් පැවැති බව පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීමයි.



මාගම්පුරයේ රජකළ කාවන්තිස්ස රජතුමා මෙම ස්ථානයේදී රාජ්‍ය අභිෂේකයට පත් වූ බව ඓතිහාසික තොරතුරුවලින් පැහැදිලි වෙයි. අනුරාධපුර රජකළ ධාතුසේන



රජතුමා විසින් මෙම පුදබිම සංවර්ධනයකර ඇති බවට වංශකථාවල තොරතුරු සඳහන් වෙයි. පුදබිමක් වශයෙන් පමණක් නොව විමුක්ති අරගලයක් ආරම්භ කළ ස්ථානයක් ලෙසින් ද මෙම විහාර ස්ථානය ප්‍රසිද්ධියට පත්ව තිබේ.



මෙම ස්ථානයේ දක්නට ලැබෙන ගරා වැටුණු ස්ථූපයෙන්ද ලෙන් තුළ ඇති බුද්ධ ප්‍රතිමාවන්ගෙන් ද පෙනීයන්නේ මෙය ඉපැරණි බෞද්ධ සිද්ධසථානයක් වන බවයි. කාලයාගේ ඇවෑමෙන් මෙම ස්ථානය නටඹුන් තත්වයට පත්ව ඇති බව පෙනේ. මෙවැනි ස්ථාන වැඳ පුදා ගැනීමට පැමිණෙන බෞද්ධ ජනතාවගේ පරම යුතුකම වන්නේ ආරක්ෂා කොට පෝෂණය කිරීමය.

විජය තලවත්තේගෙදර

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

# යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට බෞද්ධ පාරමිතාවන් උපයෝගීවේ.

පාරමිතා පුරන මෛත්‍රී බෝසතාණන් වහන්සේ නියත විවරණ ලබාගත් පෝය දිනයක් වශයෙන් මෙම පෝය දිනය ඉතාමත් වැදගත්ය. වස්සාන ඍතුවේ අවසාන පෝය දිනයක් වශයෙන් මෙම ඉල් පෝය හැදින්විය හැකිය.ශාසන ඉතිහාසයේ වැදගත් අවස්ථා වැදගත් සිදුවීම් රාශියක් සිදුවූ පෝය දිනයකි. බුදුරජාණන් වහන්සේ තම ශාවකයන් වහන්සේලා අමතා දෙවි මිනිසුන්ගේ හිත සුව පිණිස ධර්ම චාරිකාවේ යෙදෙන ලෙසටයි වදාළේ පුද්ගලයාගේ යහපත සඳහා සමාජයේ යහපත සඳහාත් පාරමිතාවන් උපයෝගී කරගත යුතුය.

''දානං සීලංච නෙක්ඛමමං
පඤ්ඤා විරියේන පංචමං
ඛන්ති සච්චමදිට්ඨානං
මෙත්තු පෙක්ඛාතිමාදස''

දාන පාරමිතා, සීල පාරමිතා, නෛෂ්කම්‍ය පාරමිතා, ප්‍රඥා පාරමිතා, වීර්‍ය පාරමිතා, ශාන්ති පාරමිතා, සත්‍ය පාරමිතා, අධිෂ්ඨාන පාරමිතා, මෛත්‍රී පාරමිතා, උපේක්ඛා පාරමිතා ආදී වශයෙන් දැක්වේ. ඉන් එක පාරමිතාවක් පාරමී, උපපාරමී, පරමාර්ථ පාරමී යනාදී වශයෙන් තුන් වැදෑරුම් වීමෙන් පාරමිතා තිසක් වේ.

යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට පුද්ගලයා යහපත් විය යුතුයි. පුද්ගල සිතේ කරුණාව හා ප්‍රඥාව තිබිය යුතුය.

පුද්ගලයාගේ ඇතිවන දුර්ගුණ වලින් යුක්ත නම් ඔහුට යහපත් කටයුත්තක් කළ නොහැක. එසේනම් අප කල යුතුවන්නේ එම දුර්ගුණවලින් ඈත්වීමයි. පාරමිතා වලින් සිදු කරනු ලබන්නේ පුද්ගලයා යහපත් කිරීමයි. පුද්ගලයා යහපත් කිරීම යනු සමාජය යහපත් කිරීමයි.

පුද්ගලයා නිරන්තරයෙන්ම ක්‍රියා කරන්නේ තෘෂ්ණාව, මානය, වැනි දුර්ගුණ වලින් යුක්තව කටයුතු කිරීමයි. එබැවින් පුද්ගලයා ක්‍රියා කළ යුතු වන්නේ ප්‍රඥාවෙන් යුක්තව කටයුතු කිරීමයි. යහපත් සමාජය යනු ගුණයෙන් හා ප්‍රඥාවෙන් කටයුතු කරන පුද්ගලයන් රාශියකගේ එකතුවයි. එබැවින් අප කළ යුතු වන්නේ යහපත් සමාජයකට අවශ්‍ය කරන්නේ ප්‍රතිපත්ති ගරුක වූ සමාජයක් බිහි කිරීමටයි. ප්‍රතිපත්ති ගරුක වූ සමාජයක් බිහි කිරීමේදී ඉතාමත් වැදගත් කරුණක් වන්නේ ප්‍රඥාවෙන් හා බුද්ධියෙන් කටයුතු කිරීමයි. එහි දී විශේෂයෙන්ම අපි අපේ ජීවිත වලට අනුගතව ක්‍රියා කළ යුතුය.


වීර්‍ය පාරමිතාව

බුදු දහමේ ඇති කරුණු පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයට ධර්ම කරුණුද අදාළ කරගත යුතුය. එම කරුණු වලින් කටයුතු කිරීමේදී පුද්ගලයා යහපත් වේ. ඔහු යහපත් වන විට සමාජයේද යහ පත් වේ. එ වැනි යහපත් ගුණ ගරුක, ප්‍රතිපත්ති ගරුක සමාජයක් බිහි කිරීමේදී ඉතාම වැදගත් කරුණක් වන්නේ යම් කිසි අධි ෂ්ඨානයක් තිබී මයි. ඒ සමගම පුද්ගලයාගේ උත්සාහය, උනන්දුව, ඉවසීම, සත්‍ය ගරුක බව, මධ්‍යස්ථව කටයුතු කර ගැනීමේ හැකියාව යන මේ කරුණු ප්‍රධාන වශයෙන් තිබිය යුතුයි.

වර්තමානයේ සිදු වන්නේ අසීමිත වූ ආශාවන් පසුපස හඹායන මිනිසා එකිනෙකා යට කරගෙන ආත්මාර්ථකාමීව කටයුතු කරන සමාජයක් සමාජ විරෝධි ක්‍රියා කළ පුද්ගලයා යෙදෙන්නේ නික්මවීම පිළිබඳව කිසිම හැඟීමක් නොමැතිවයි. මේ අතෘප්තිකර ආශාවන් පසු පස හඹායාමෙන් සිදුවන්නේ පුද්ගලයාට මෙන්ම මුළු මහත් සමාජයටම හානිකර තත්වයකි. තමන් කරන වරද වරදක් ලෙස පිළිගැනීමට නිහතමානී විය යුතුයි. ගුණගරුක ද විය යුතුයි. ඔහු සුචරිතයේ යෙදීමෙන් එය මුළු මහත් සමාජයේ යහපතටම හේතු වේ.

යමෙකු ඉවසිලිමත්ම කටයුතු සිදු කිරිමෙන් සමාජයේ එකිනෙකා අතින් සිදුවෙන ගැටළු වලින් තොරව ජීවත් විය හැකියි. ඔහුගෙන් අන් පුද්ගලයන්ට, සමාජයට කිසිම හානියක් සිදු නොවේ. දෙදෙනෙක් අතර වුවද වචන හුවමාරුවක් වුවහොත් එම සුළු දෙයින් කිපී විශාල අර්බුධ ඇති කරගනී. ජීවිත හානි පවා ඇති කරගනී. එවැනි දුර්වලතා වර්තමාන සමාජයේ දක්නට ඇත. සාමය, සතුට සඳහා පුද්ගලයා කළ යුතු වන්නේ ඉවසිලිමත්ව කටයුතු සිදු කිරීමයි.

සමාජමය ගැටුමකට ප්‍රධානම හේතුව වන්නේ වංක බවයි. තම තමන් අවංකවම කටයුතු සිදු කරන්නේ නම් වර්තමානයේ පවතින ගැටුම් අඩු කරගත හැකිවෙයි. අනුන් රවටා කටයුතු කරන්න යාමෙන් විශාල විනාශයකට හේතු වෙයි. එබැවින් අවංකව කටයුතු සිදු කිරීම පුද්ගලයාගේ දියුණුවට හේතු වේ. පුද්ගල දියුණුව යනු සමාජ දියුණුවයි.

පළමුවෙන්ම තමන්ට තමන් සත්‍යගරුක විය යුතුයි. සත්‍යගරුක වීමෙන් තමාගේ දියුණුව වාසනාව ලඟා කරගත හැකිය. ස්ථිර අධිෂ්ඨානයකින් යුක්තව තමන්ගේ ජීවිතය සකස් කර ගන්නේ නම් කිසිදාක ඔහු පිරිහෙන්නේ නැත. එබැවින් සෑම කෙනෙකුටම අධිෂ්ඨානයක් තිබිය යුතයි. ස්ථිර අධිෂ්ඨානයෙන් ක්‍රියා කරන පුද්ගලයා කිසිදාක සමාජ අපගාමී පුද්ගලයෙකු නොවන්නේය.

අධික තෘෂ්ණාවෙන්, මෝහයෙන්, වැරදි දෘෂ්ටි වලින් තොරව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුක්තව එදිනෙදා ජීවිතය සකස් කරගත යුතුවෙයි. පන්සිල්, අටසිල් ආජීව අෂ්ඨමක සීලය සාමණේර සීලය උපසම්පදා සීලය වැනි සීල පවතින්නේ පුද්ගලයාගේ යහපැවැත්ම සඳහාය.

නිවැරදිව අන් අයට හිරි හැරයක් කරදරයක් නොමැතිව පසිඳුරන් පිනවන බෝසතුන් පවා ඉන්ද්‍රියන් පිනවීමේ ආදීනව ගැන කල්පනා කොට කාම වස්තූන් කෙරෙහි ඇති ආශාවන් අඩුකර ගනී. ව්‍යවහාර ලෝකයේදී එදිනෙදා කටයුතු වලදී පුද්ගලයාට අවශ්‍ය කරන්නේ ලෞකික ප්‍රඥාවයි. එය සිතීමෙන්, ඇසීමෙන්, කියවීමෙන්, භාවනාවෙන් සකස් කරගත හැකිය.

මේ සෑම දෙයකට නොපසුබට උත්සාහය, උනන්දුව අවශ්‍යයි. එහිදී ඉවසීමෙන් කටයුතු සිදු කළ යුතුය. පන්සිල් රකිමින් ජීවිතය සකස් කරගැනීම ඉතාම වැදගත් වේ.එය යහපත් සමාජයකට හේතු වේ. මුසාවාදයෙන් වැළකීමත් සත්‍ය පිහිටීමෙන් කටයුතු කිරීමෙන් යමක් කිරීමට ස්ථිරව සිතාගෙන කඩනොකොට කටයුතු කිරීම ඉතාම වැදගත් වෙයි. එසේම මෛත්‍රී සහගතව කටයුතු සිදු කිරීම ලෝකයේ සිදුවෙන සියලු සිදුවීම් හේතුඵල ධර්මතා අනුව සිදුවෙන බව තේරුම්ගෙන කටයුතු සිදු කිරීමෙන් පුද්ගල ජීවිතය සාර්ථක වෙනු ඇත. මෙම උතුම් පොහෝ දිනයේ පංචසීලය ආරක්ෂා කරමින් දැහැමි ජීවිතයක් ගත කිරීමට අධිෂ්ඨාන කරගැනීම උතුම් වේ.

ශාස්ත්‍රවේ ගෞරව, අධ්‍යාපන ඩිප්ලෝමා,
එච්.එම්.අයි.හේරත්,
ලෙනදොර,

# පින්බර වස් සමය

වසරකට වතාවක් එළඹෙන පින්බර වස් සමය අප කාටත් පින් සිතුවිලි වඩවන කාල පරිච්ඡේදයක් ලෙස හැඳින්විය හැකිය. තෙමසක් තුළ පවතින එම කාල පරිච්ඡේදය තුළ ගිහි පැවිදි දෙපක්ෂයේම චර්යාමය වෙනසක් ඇති කරවනවා සේම ආධ්‍යාත්මික සුවයද වඩවනු ඇත.


බුදුරජාණන් වහන්සේ දේශනා කළ අවවාද අනුශාසනා වලට අනුව භික්ෂූන් වහන්සේලා විනය ශික්ෂාපද ආරක්ෂා කරමින් වස් සමාදන් වීම හා වස් ශික්ෂා පද ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිද්ධ කරනු ඇත. විශේෂයෙන් මේ කාලය තුළ වත් පිළිවෙත් ගැන ගිහි පැවිදි දෙපක්ෂයේම දැඩි අවධානයක් යොමු කරනු ඇත. ''වත්තන පරි පුරෙන්තො - න සීලං පරි පූරති'' වත් පිළිවෙත් සම්පූර්ණ නොකිරීම තුළින් සීලය වර්ධනය නොවන බව පැහැදිලි කොට ඇත.

එම හේතුවත් සමඟ විශේෂයෙන් පැවිදි පක්ෂය තුළ වෙනදාට වඩා වත් පිළිවෙත් සම්පූර්ණ කිරීමක් දක්නට ලැබේ. පාන්දරින් අවදිවී මලුපෙත් මන් නැමද මුළු දවසම සිත, කය, වචනය සංවර කොට ගෙන ඒ ඒ වත් පිළිවෙත් වල නියැලෙනු ඇත. එම වත් පිළිවෙත් සිදු කරන්නේද ඉතා ඕනෑකමින් හා වගකීමෙන්ය. බෝධිය චෛත්‍යය හා විහාරගෙය යන ත්‍රිවිධ චෛත්‍යය වෙත වැඳීම් පිදීම් හා පිරිසිදු කිරීමේ කටයුතු සිද්ධ කිරීම් ඉතා ඉහලින් සිද්ධ කරනු ඇත. එතුළින් මානසික සහන සීලිතාවය හා නිරවුල් චෛතසික වර්ධනය සිදුවීම අනිවාර්ය කාර්යයකි.

ගිහි පිරිස විසින් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිව් පසයෙන් උපස්ථාන කිරීමේ කටයුතු සිද්ධ කරනු ඇත. වෙනදාට වඩා ඉතා ඕනෑකමෙන් හා ශ්‍රද්ධා ගෞරවයෙන් එම කටයුතු සිදු කිරීමට දායක පක්ෂය වශයෙන් ඔවුන් වගබලා ගනු ඇත. පැවිදි පක්ෂය විසින්ද වෙනදාට වඩා වස් දානය පිළිබඳ සැලකිලිමත් වී ධර්මමය දානයෙන් සංග්‍රහ කටයුතු සිද්ධ කරයි.

සමහරක් විහාරස්ථානවල නොකඩවා සවසට මල් පහන් පූජා, බෝධි පූජා සිද්ධ කරන්නේය. එහිදී පූර්ව ළමා ළපටින් කලින්ම විහාර ස්ථානයට පැමිණ අතුපතුගෑම ඇතුළු පිරිසිදු කටයුතු කිරීම දක්නට ලැබීම වැඩිමහල්ලන්ට පවා සතුට වඩවන කරුණකි. ආගම ධර්මයට අනුව හැදෙන වැඩෙන දූවා දරුවන්ගේ ස්වාභාවය වස් කාලය තුල මනාව ස්ඵුට වේ. විශේෂයෙන් අනාගතය බාර ගැනීමට සිටින කුඩා දූ දරුවන් සඳහා වස්කාලයෙන් ලැබෙන චර්යාමය වෙනස ඉතා ඉහලය.

පින යනු සිත පිනා යෑමය. ''චිත්තං පුනාතීති පුඤ්ඤං'' සිතේ ප්‍රසන්න බව නොහොත් සතුට පිනය. ඒ සඳහා සිත පිරිසිදු විය යුතුය. එනම් අකුසල මූල වූ ලෝභ, ද්වේෂ, මෝහ වෙනුවට අලෝභ, අදෝෂ, අමෝහ




සිතුවිලි පහල වීමය. එම විපර්යාසය වස් කාලය තුළ අනිවාර්යයෙන්ම සිදු වේ. පින් සිතුවිලි වර්ධනය කර ගැනීමට හොඳ දෙයකින් මිස නරක දෙයකින් පුළුවන් කමක් නැත. පිංකම් අතර කඨින පිංකම ශ්‍රේෂ්ඨ හා බලවත් බව දහමෙහි සඳහන් වේ. එම උතුම් උදාර පිංකම පෙරමුණෙහි තබාගෙන වස් තුන් මාසය තුළ සිදු කරන යහපත් ක්‍රියා තුළින් පින් සිතුවිලි වර්ධනය වීම අමුතුවෙන් කිවයුතු නැත. වස් කාලය තුළ සමහර විහාර ස්ථාන වල දායකත්වයක් නොදරන අය පවා පැමිණ විහාරස්ථානයේ වැඩ කටයුතු වලට උදව් උපකාර කිරීමද, ආගමික කටයුතු සඳහා සම්බන්ධ වීමද සිදු කරති. තව කෙනෙකුගේ මඟ පෙන්වීමක් නොමැති වුවත් හොඳ කුසල කටයුතු කිරීමට වස් කාලය තුළ ඕනෑම කෙනෙකු පෙළඹීම සාමාන්‍ය දෙයකි.

බොහෝ දුරට විහාරස්ථානවල නඩත්තු හා අභිවෘද්ධිය පිණිස සිදුවන කටයුතු සඳහා දායකයින්ගේ ආධාර උපකාර ලැබෙනු ඇත. පන්සල් අළුත් වැඩියා කිරීම්, පන්සලේ නැති අංගෝ පාංගයන් ඉදිකිරීම ආදී කටයුතු සිදුවේ. කඨින චීවරය භාරගත් පිංවතා ලොකු මුදලක් ඇති කෙනෙකු නම් ඔහුගේ තනි වියදමෙන් විහාරස්ථානයෙහි නැති වන්දනාමාන කිරීමට අවශ්‍ය දෙයක් හෝ, භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා අවශ්‍ය දෙයක් හෝ ඉදිකර දෙනු ඇත. දුෂ්කර ප්‍රදේශ වල නම් සියලු දායකයින්ගේ පුංචි ආධාර මුදල් එකතු කොට විහාර ස්ථානය අලුත් වැඩියා කිරීම හෝ ඉදි කිරීම් කටයුතු සිදු කරනු ඇත.

ආමිස පූජා හා ප්‍රතිපත්ති පූජා යන පිංකම් දෙකම වස් කාලය තුළ ඉතා ඉහළින්ම සිදුවේ. එළෙසම දාන, ශීල, භාවනා යන ත්‍රී පුණ්‍යක්‍රියා ද සිදුවේ. ඊට අමතරව තෙලෙස් ධූතාංග පිළිබඳවද විහාරස්ථ භික්ෂූන් වහන්සේලා වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

මේ සෑමදේකින්ම සිදු වන්නේ පින් සිතුවිලි වර්ධනය වීමය. පින යනු සත්වයාගේ මෙලොව පරලොව සැපවත් කරවන ශක්තියකි. ''ඉධ මෝදති පෙච්ච මෝධති'' පිං කළ ඇත්තෝ මොලොවදීත් සතුටු වෙති. එබැවින් අපි නිතර නිතර පින් කළ යුතුය. පින් නොමැති වීමෙන් හා අඩුවීමෙන් ජීවිත වල නොයෙක් අඩුපාඩුකම් වගේම සැප විපාක වල අඩුපාඩුකම් සිදුවනු ඇත. එනිසා පින් කිරීමට කම්මැලි විය යුතු හෝ පසුබට විය යුතු නැත.

''අද අද එයි මරු පින් කර ගන්නේ

කෙලෙසද සෙට මරු නේති සිතන්නේ''

යන ලෝවැඩ සඟරාවෙහි කියමනට අනුවද අද අදම පින් කරගත යුතුව ඇත. හෙට, අනිද්දා, තව කාලෙකින් මාරයා එයි කියා නොසිතිය යුතුය. හොඳ දේ කිරීමට උනන්දු විය යුතු අතර නරක දේ කිරීමට ලැජ්ජා බිය ඇති කරගත යුතුය. එම කරුණු සිතට ගෙන තව තවත් පින් සිතුවිලි වර්ධනය කර ගනිමින් මනුෂ්‍යත්වය අර්ථවත් කර ගැනීමටත්, ගුණ ධර්මයෙන් අලංකාර වීමටත් වස් කාලය තුළ විහාරස්ථානය හා සම්බන්ධව තම කායික මානසික දෙඅංශයම යොදවා යහපත් කටයුතු සාර්ථක කර ගන්නා ලෙසට ද ඉල්ලා සිටීමට කැමතියි.

කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනෙහි ආචාර්ය
ගලගෙදර රතනවංශ හිමි



# අභියෝග ජය ගනිමු

ලොව පහළ වූ සත්වයින් අතරින් ඉතා වැදගත් සත්වයා ලෙස බුදු සමයෙහි හඳුන්වාදී තිබෙන්නේ මිනිස් වර්ගයාය. ඒ බව දක්වා ඇත්තේ ''මනං උස්සතීති මනුස්සා'' යනුවෙනි. උසස් මනසක් ඇති සත්වයා මිනිසා ලෙසිනි. මිනිස් වර්ගයා මෙලොව උපදින විට ඉතා පිරිසිදු මනසක් ඇති බවත්, බාහිර වශයෙන් එල්ලවන කෙළෙස් වලින් සිත (මනස) අපිරිසිදු වන බවත්, බුදු දහමෙන් පෙන්වා දී තිබේ. ඒ බව ''පබසසර මිදං භික්ඛවෙ චිත්තං තංචකො ආග නතුනෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ටං'' (මෙම විග්‍රහය මගින් පෙන්වා දෙන්නේ මිනිස් සිතක ස්වභාවයයි) ලොව මෙතෙක් පහළ වූ ශාස්තෘවරුන් අතරින් බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන්නේ මිනිස් සිතකට එල්ලවන අභියෝගයන් ජයගන්නා ආකාරය දේශනා කිරීමෙන් පමණක් නොව ක්‍රියාවේද පෙන්නුම් කර ඇති නිසාය.

මහාමායා දේවියගේ කුසින් මෙලොවට බිහි වූ බෝසතාණෝ ළමා අවධියේ වප් මඟුල් දිනයේ දඹරුක් සෙවනෙහිදී ආනාපාන සතිය වඩා ධ්‍යානාංග උපදවා ගත් බවත්, එය ඉදිරියට පවත්වාගෙන යෑමට ඉටාගත් බව පෙන්වා දී තිබේ. තරුණ වියේදී ඥාතීන්ගෙන් එල්ල වූ අභියෝගයට මුහුණ දුන්නේ එම ක්‍රියාවලියේ ශිල්ප දැක්වීම තුළින්වීම ඉතා වැදගත්ය. සතර පෙර නිමිති හා නාටිකාවන්ගේ විප්‍රකාර දැකීමෙන් පසු සසරින් එතරවීමේ අභියෝගයට මුහුණ දුන්නේ සියළුම සැප සම්පත් අතහැර තම දේවියත් සිඟිති රාහුල කුමරාත් අතහැර දමා මහා අභිනිෂ්ක්‍රමනය කිරීමෙනි. අනෝමා ගංතෙරින් එතරව මහා වනයට පිවිස පලා වර්ග ගෙඩි වර්ග අනුභව කරමින් ඉතා දුක්බර ජීවිතයක් ගත කිරීම මීළග ජීවිත අභියෝගය විය.

දුෂ්කර ක්‍රියා සමය වනවිට කිසිවෙකු විසින් නොවින්ද දුකක් බෝසතාණන් වින්ද බව ''අරිය පරියෙසන සූත්‍රයෙහි'' මැනවින් දක්වා තිබේ. ''කිං සචච ගවේෂීව, කිං කුසල ගවේෂීව, සැරිසැරූ බෝසතාණන් ''ආලාරකාලාම උද්දකාරාම පුත්ත'' වෙතට ගොස් ඔවුන්ගෙන් සත්‍ය සොයාගැනීම සඳහා යොමු විය. එයින් ප්‍රයෝජනයක් නොමැති බව දැන තමන්ගේම නුවණ මෙහෙයවා සත්‍ය අවබෝධයට එළඹියේ ඊළඟ අභියෝගය ජයගැනීම සඳහාය. ''කාම සුකල්ලිකා යෝගයත්, අත්තකිල මතානු යෝගයත් මුලදී අනුගමනය කළ (ශරීරයට අධික ලෙස සැපදීමත්, ශරීරයට අධික ලෙස දුක්දීමත් යන අන්ත දෙක) අනුගමනය කළත් එයින් ප්‍රයෝජනයක් නොලැබෙන බව අවබොධ කරගෙන මැදුම් පිළිවෙතට යොමු වූයේ එය සත්‍ය මාර්ගය ලෙස හඳුනා ගැනීමෙනි. මෙසේ සත්‍ය සොයා ගිය ගමනේදී හමු වූ සියළුම අභියෝග ජය ගැනීමට අධිෂ්ඨානයෙන් ක්‍රියාකළ බෝසතාණෝ ඒ සඳහා බෝධිමූලය වෙත පැමිණ මෙසේ අධිෂ්ඨානයෙන් වැඩ සිටියේය.

''බුදෙධාහං බෝධයසසාමි
මුතෙතාහං මොචයෙ පරෙ
තිණෙණාහං තාරයසසාමි
සංසාරොගා මහබබයා''

(මම පළමුව බුදු බව ලබාගෙන සසරින් එතර වන්නෙමි. දෙවනුව සසර දුක් විඳින සත්වයින් සසර කතරින් එතර කරවන්නෙමි.)

යන අධිෂ්ඨානයෙන් වැඩ සිටි බවත්, එයින් පසු ධ්‍යානංග උපදවා ගෙන සියළුම කෙළෙසු ප්‍රහීන කර බුදුබව ලබාගත් බවත් බුද්ධ චරිතයෙහි සඳහන් වේ. මෙසේ සසර දුක් නිමාකරීම සඳහා බෝධි සත්වයන් තුළ පැවැති අධිෂ්ඨානයත්, අභියෝග ජය ගැනීමත්, පොදුවේ සියළුම මිනිස් වර්ගයාට ආදර්ශයක් ලබාදෙන බව මෙහෙලා සඳහන් කිරීමට පුළුවන.

පළමුවන ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කිරීම මගින් බුදුරජාණන් වහන්සේ මෙසේ උදම් අනූ බව (සතුට ප්‍රකාශ) දැක්වේ.

''අනෙක ජාතී සංසාරං - සන්ධා විසසං අනිබබිසං
ගහකාරකං ගවෙසනෙතා - දුක්ඛා ජාති පුනපපුනං
ගහකාරක දිටෙඨාසි - පුන ගෙහං නකාහසි''

යනුවෙනි. (සසර නොයෙක් ජාතිවල ඉපිද නැවත නැවත දුකට පත්වෙමින් ජීවිතගත කෙළෙමි. අද මගේ ශරීරකූඩුව නැමැති ගෙය සාදන වඩුවා (තෘෂ්ණාව) සහමුලින්ම නැති කළෙමි. එබැවින් නැවත මට ගෙයක් (ජීවිතයක්) ඇති නොකරන්නෙහිය) නොසාදන්නෙහිය. මෙම ප්‍රකාශයෙන් ලබාගත හැකි ආදර්ශය වන්නේ යම් දෙයක ප්‍රතිඵලයක් ලබාගැනීමට නම් දීර්ඝ කාලයක් උත්සාහවන්ත විය යුතු බවයි.

බුදු බව ලබාගැනීමෙන් පසුවද තමන් වහන්සේට එල්ල වූ අභියෝග නින්දා ගැන බුද්ධ චරිතයෙහි මැනවින් දක්වා තිබේ. එකම වෙහෙරෙහි වාසය කළ 'දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේ විනාශ කිරීම සඳහා ගලක් හිස මතට පෙරලීම, නාලාගිරි හස්තියාට රා පොවා බුදුරදුන් එන මගට යොමුකිරීම අනුවායන් යෙදවීම (අජාසත් රජුගේ සහය ඇතිව) ඉතා බරපතල අභියෝගයන් ලෙස දැක්විය හැකිය. චිංචිමානවිකාවගේ අපහාස මාගන්දියා බැමිණිය එල්ල කළ අපහාස බක බ්‍රාහ්මණයාගේ සරදම් ප්‍රකාශ යන මෙවැනි අවස්ථාවන්ට බුදුරජාණන් වහන්සේ මුහුණ දුන්නේ ඔවුන් මහාකරුණාව ඇති කරවමින් එමෙන්ම ඉවසීමත්, උපේක්ෂාවෙන් බැලීමත් නිසාම බුදුරජාණන් වහන්සේ සෑම අවස්ථාවකදීම ජයගත් බව ''බුද්ධ චරිතය'' පෙන්වා දෙයි.

බුද්ධ කාලයෙන් පසුව ජීවත් වූ දාර්ශනිකයින්, ගවේෂකයින් තම අදහස් ජයග්‍රහණය කර ඇත්තේ තමන් වෙතට එල්ල වූ අභියෝගවලට සාර්ථක ලෙස මුහුණ දුන් නිසාම බව එම චරිත ගැන විමසා බලනවිට පෙනීයයි. අපට දැකගත හැකි උපමාවක් ගතහොත් ගංගාවක් ගලා බසින්නේ විවිධ ගල්පරවල හැපී විවිධ හඬ නඟමින් බව පෙනේ. ඒ අනුව අපේ ජීවිතද විවිධ බාධකයන් ඉදිරියේදී හැප්පීම් කම්පාවන්ට මුහුණපෑමට සිදුවේ. එවැනි අවස්ථාවලදී ඒවා ගැන කළකිරීමෙන් තොරව ජීවිතය අථිවත් කර ගැනීමට සිත යොමුකර ගැනීම ඉතා වැදගත් වේ. ඒ සඳහා අපගේ ශාස්තෘවරයාණන් වූ බුදුරජාණන් වහන්සේගේ ජීවන තොරතුරු ගැන අවබෝධය ලබමින් ජීවත් වීමෙන් සෑම ගැටළුවක්ම ජයගත හැකිවනු ඇත. අප ලබාගෙන ඇති දුර්ලභ වූ මිනිස් ජීවිතය සාර්ථක කර ගැනීමේ වගකීම රදා පවතින්නේ අප තුළමය.

''තුමෙහ කිචචං ආතසසං අක්ඛාතාරො තථාගතා'' බුදුවරයන් වහන්සේලා මග පෙන්වා දෙති. එම මාර්ගයෙහි ගමන් කිරීම අපසතු කාර්යය වන්නේය. එය අවබෝධ කරගෙන ජීවිත සාර්ථක කරගැනීමට අධිෂ්ඨාන කරගනිමු.උත්සාහයෙන් ක්‍රියා කිරීම ඉතා වැදගත්ය.

විජය තලවත්තේගෙදර

# රූපයේ යථාර්ථය



සංයුක්ත නිකායේ ඛන්ධ සංයුක්තයේ අරහත්ත වග්ගයේ සියලුම සූත්‍ර දේශනාවන් සකලසත්ව ප්‍රජාවගේ කෙලෙස් දූවිලි පහකරන මුලින් උපුටා දමන නැත්තටම නැති කරන ආකාරය විස්තරාත්මකව පැහැදිළිව දේශනා දේශිතය.

උපාදිය සූත්‍රයෙහි සිත මාරයාට බැඳෙන්නේ වසඟයට පත්වන්නේ කෙසේද?

රූපං ඛො භන්තේ, උපාදිය මානෝ බන්ධෝ මාරස්ස අනුපාදිය මානෝ මුත්තෝ පාපි මතෝ.

ස්වාමිනී රූපයට බැදීමක් ඇති කරගත්තොත් තමයි මාරයාට බැඳෙන්නේ. වසඟයට යන්නේ රූපය කෙරෙහි බැදීමක් ඇතිකර නොගතහොත් මාරයාට බැදෙන්නේ නැත. වසඟයට යන්නේ නැත.

වේදනං උපාදිය මානෝ බද්ධෝ මාරස්ස. අනුපාදිය මානෝ මුත්තෝ පාපිමතො.

වේදනාවට බැදීමක් ඇති කරගත්තොත් තමයි මාරයාට බැඳෙන්නේ. වසඟයට යන්නේ, වේදනාව කෙරෙහි බැදීමක් ඇතිකර නොගතහොත් මාරයාට බැදෙන්නේ නැත. වසඟයට යන්නේ නැත.

සංඛාරේ උපාදිය මානො බද්ධෝ මාරස්ස. අනුපාදිය මානො මුත්තෝ පාපිමතෝ

සංඛාරයන්හි බැදීමක් ඇති කරගත්තොත් තමයි මාරයාට බැඳෙන්නේ. වසඟයට යන්නේ සංඛාරයන්ට බැදීමක් ඇතිකර නොගතහොත් මාරයාට බැදෙන්නේ නැත. වසඟයට යන්නේ නැත.

සඤ්ඤං උපාදිය මානො බද්ධෝ මාරස්ස
අනුපාදිය මානෝ මුත්තො පාපිමතෝ

සංඥාවට බැදීමක් ඇතිකරගත්තොත් තමයි මාරයාට බැදෙන්නේ. වසඟයට යන්නේ. සංඥාව කෙරෙහි බැදීමක් ඇතිකර නොගතහොත් මාරයාට බැදෙන්නේ නැහැ. වසඟයට යන්නේ නැහැ.

විඤ්ඤානං උපාදිය මානො බද්ධෝ මාරස්ස
අනුපාදිය මානෝ මුත්තො පාපිමතෝ

විඤ්ඤාණයට බැදීමක් ඇතිකරගත්තොත් තමයි මාරයාට බැදෙන්නේ. වසඟයට යන්නේ. විඤ්ඤාණය කෙරෙහි බැදීමක් ඇතිකර නොගතහොත් මාරයාට බැදෙන්නේ නැහැ. වසඟයට යන්නේ නැහැ.

පංච උපාදානස්කන්ධයට නොබැදීමෙන් නොඇලීමෙන් මාර වසඟයෙන් නිදහස් වියහැක. මරණයෙන් නිදහස්විය හැක. පරිනිර්වාණයෙන් සැනසෙන්නට පුළුවන. සත්වයා වෙලී පැටලී සිටින්නේ සළායතනයට පැමිණෙන රූප මායාවටය.

1. ඇසට පැමිණෙන වර්ණ රූපය උපාදානය කරගනී. ඒ රූප උපාදානයයි.

2. කණට පැමිණෙන ශබ්ද රූපය උපාදානය කරගනී. ඒ ශබ්ද උපාදානයයි.

3. නාසයට පැමිණෙන ඝන්ධ රූපය උපාදානය කරගනී. ඒ ඝන්ධ උපාදානයයි.

4. දිවට පැමිණෙන රස රූපය උපාදානය කරගනී. ඒ රස උපාදානයයි.

5. කයට පැමිණෙන පොට්ඨබ්බ රූපය උපාදානය කරගනී. ඒ පොට්ඨබ්බ උපාදානයයි.

6. මනට පැමිණෙන ධම්ම රූපය උපාදානය කරගනී. ඒ ධම්ම උපාදානයයි.

මෙසේ වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම, ෂතල රූපස්කන්ධයම ගැන ඇත්ත ඇති සිටියෙන් ප්‍රඥාවෙන් නොදකින නිසා එහි යථාභූත ඥාණ දර්ශනය නොමැති නිසා විනිවිද විදසුන් නුවණින් නොදකින නිසා පංච උපාදානස්කන්ධ මායාවට හසුවේ.

රූප මායාව
වේදනා මායාව
සංඥා මායාව
සංඛාර මායාව
විඤ්ඤාන මායාව

පංච උපාදානස්කන්ධ මායා බන්ධනය මගින් මාර වසඟයට පැමිණෙන බවයි තථාගත ධර්මය වන්නේ. මාර වසඟයට පත්නොවීමට රූපයේ යථාර්ථය දැකිය යුතුය. හැම රූපයක්ම විශ්ලේෂණය කරලා බැලුවොත් කඩලා බෙදලා වෙන්කරලා විදසුන් නුවණින් ප්‍රඥාවෙන් බැලුවොත් පේනවා විශ්වයේ ශක්තිබව. මේ ශක්තින් ගේ ස්වභාවය නුවණින් දකිනවා කියන්නේ පටිච්චසමුප්පාදයට ගලපා බැලීමයි. මේ වෙනස්වීම, චලනය, ප්‍රවර්ථනය වීම, ක්ෂණික වෙනස්වීම සියලුම ශක්තීන් තුළ සිදුවන නිසා රූපය තුලත් අරූපය තුලත් ඒ ස්වභාවය එසේමය. පරම අනුවත්වත් පරම අංශුවක් වත් ස්ථාවර ස්ථිර නොවන ස්වභාවය නිසා ඨිති හෙවත් ඇත යනුවෙන් උපත (සමුදය) පැනවිය නොහැකි බවත් (අත්ථිති ඒකො අනිතො) භංග හෙවත් නැත යනුවෙන් විපත (වය) පැනවිය නොහැකි බවත් (නත්ථිති එකො අන්තො) බුද්ධ භාෂිතයි. එසේ නම් උපත විපත නොමැති තැන ජාතිය නැත. නත්ථිදානි පුනප්භවො යනුවෙන් වදාලේ හිතෙ නැවත උපත විපත නැති නිසා පුනර්භවය නැති බවයි.

මේ ධර්මතාවය ක්ෂණික වෙනස්වීම මොනයම් හෝ උපක්‍රමයකින් උපමා උපමේය විදිහකින් ඉදිරි පත්කර අදහසක් ඉගියක් පලකල නොහැකිය. ඒබ ව ප්‍රඥාවෙන් දකින්න. මන මෙහෙය වන්න. ශක්තීන්ගේ හටගැනීමේ ස්වභාවය වෙනස්වීම තුළින් සිදුවන බව ඉන්ද්‍රිය භාවනාවෙන් විදර්ශනා භාවනා වෙන් තිලකුණු භාවනාවෙන් ඇතිකර ගන්නා විදර්ශනා ප්‍රඥාවෙන් නුවණැසින් දැකිය හැක.

1.අභ්‍යන්තර රූපය වූ ඇසට ගෝචර වන බාහිර වර්ණ රූපය

2.අභ්‍යන්තර රූපය වූ කණට ගෝචර වන බාහිර ශබ්ද රූපය

3.අභ්‍යන්තර රූපය වූ නාසයට ගෝචර වන බාහිර ගන්ධ රූපය

4.අභ්‍යන්තර රූපය වූ දිවට ගෝචර වන බාහිර රස රූපය

5.අභ්‍යන්තර රූපය වූ කයට ගෝචර වන බාහිර පොට්ඨබ්බ රූපය

6.අභ්‍යන්තර රූපය වූ මනට ගෝචර වන බාහිර ධම්ම රූපය

මේ අභ්‍යන්තර බාහිර සියලුම රූප අවකාශය භූමිය කරගෙන ව්‍යාප්ත වෙලා තියෙන ශක්ති සමූහයකි. එසේම අභ්‍යන්තර හා බාහිර රූප සම්බන්ධීකරණයෙන් එක්වීමෙන් ඵස්සය වීමෙන් හටගන්නාවූ චක්ඛු විඤ්ඤාන ධාතුව, සෝක විඤ්ඤාන ධාතුව, ඝාණ විඤ්ඤාණ ධාතුව, ජිව්හා විඤ්ඤාණ ධාතුව, කාය විඤ්ඤාන ධාතුව, මනෝ විඤ්ඤාණ ධාතුව අවකාශය භූමිය කරගෙනමයි. මේ බව මසැසින් දැකිය නොහැක. සියලුම ශක්තින් අවකාශය භූමිය කරගෙන කේන්ද්‍රය කරගෙන ලක්ෂය කරගෙන හටගන්නා බව ප්‍රකාට වන බව අවබෝධ කරගන්නම වෙනවා. ඒ විදර්ශනා අවබෝධ ඤාණයයි. ශක්තීන් ගේ වෙනස්වීම චලනය වේගය නිසා අවකාශය මතින් මතුවන ප්‍රතිබිම්බයක් වශයෙන් ප්‍රකාට වන ස්වභාවයට රූපය නම් වූ සම්මුතිය යෙදී ඇත. ප්‍රකටවන හටගන්නා වූ ගොඩගැසෙන ශක්තිවල ඝනකමටයි (ඝණ සංඥාව) රූප කියන්නේ.

ඉන්ද්‍රිය ගෝචර වන ආකාරයට හැඩතල අනුව පේන මානයට දැනෙන මානයට තමයි නම් ගොත් තබන්නේ. ඒ සම්මුති ෂත්‍යයි. ඒ ඕලාරික තත්වයයි. මේ ධර්මතාවය සම්මුතිය මිස පරමාර්ථය නොවේ. හේතුව රූප ග්‍රහණය කරගන්නේ ඉන්ද්‍රියන් සම්බන්ධ කරගෙන නිසයි. පරමාර්ථ ෂත්‍යයේ ප්‍රකෘර්තිය නුවණැසින් දකින්න යථාභූත ඥාණය අවශ්‍යයි. යථාභූත ඥාණය ඇති වෙන්නේ විදර්ශනා ප්‍රඥාවෙන්මයි.

වෙන් වෙන්ව දක්වන ඇස, ඇසේ ප්‍රසාද රූපය, වර්ණ රූපය, චක්ඛු විඤ්ඤාන ධාතුව, නාමධර්ම පහ, පංච උපාදානස්කන්ධය, (බලන සිත) අවකාශය ධාතුව තුළ ප්‍රකෘර්තිය වසා මතුවන විකෘති ඕලාරික තත්වය විදසුන් නිවණින් විදර්ශනා ප්‍රඥාවෙන් විශ්ලේෂණය කර බලන්න ඕනෑ නැත්නම් නිත්‍ය, සැප, ආත්ම නම් වූ අවිද්‍යා පටලයෙන් ඇත්ත වසාලනවා. ප්‍රකෘර්තිය දකින්න බැරිවෙනවා. මුලා වෙනවා. අවිද්‍යාවෙන් වසාගත්

15 පිටුවට....

පූජ්‍ය ගම්පහ සිරිසීවලී හිමි

# මෙතෙරින් එතෙරට

බුදුපියාණන් වහන්සේ "මෙතෙර නැමැති ලෝකය" හැර දමා "එතෙර නැමැති ලෝකෝත්තර නිර්වාණය සඳහා ගමන් කරන ආකාරය සංයුක්ත නිකායේ සළායතන වග්ගයේ වේදනා සංයුත්තයේ ඇති "ආසිවිසෝපම සූත්‍රය" තුළින් පෙන්වා දුන් සේක.

පෙර භවයේ දී අවසාන සිත හෙවත් චුති සිතට අරමුණු වුන පුඤ්ඤාභි සංඛාරයක් හෙවත් පිනක් නිසා අප සුගති භූමියක උප්පත්තියක් ලබා ඇත. නමුත් චුති සිතට අරමුණු වූයේ අපුඤ්ඤාභි සංඛාරයක් නම් අප සතර අපායේ ඉපදීමට තිබිණි. එමෙන් ම අරූපාවචර ධ්‍යාන චිත්තයක් හෙවත් ආනෙඤ්ජාභි සංඛාරයක් අවසන් සිත අරමුණු වූවා නම් අප අරූපාවචර බ්‍රහ්ම ලෝක යන්හි උප්පත්තිය ලබයි. දුක අවබෝධ කරගෙන නොමැති නිසා හෙවත් අවිද්‍යාව නැමැති මෝඩකම නිසාත් තෘෂ්ණාව නැමති ඇලීම නිසාත් අප නැවත උප්පත්තියක් ලබයි.

සූත්‍ර දේශනාවේ දේශනා සාරය මෙසේය.

සංසාර ගමනේ මගේ නොවන සතර මහ භූතයන් සොරකම් කරගෙන යන සත්වයාට කර්මය නැමැති රජතුමා විසින් උපතේ සිටන් මරණය දක්වා විෂඝෝර සර්පයන් හතර දෙනෙක් වැනි පඨවි ආපෝ තේජෝ වායෝ යන ධාතූන් වලින්න් සැදුන ශරීරයක් ලබාදී ලෝකය තුළ සිරගත කරනු ලබයි. මෙම මෝඩ සත්වයා එම විෂ සර්පයන් හතර දෙනා දැත් වලත්, හිසෙත්, උදරයෙත් වෙලාගෙන තමන්ට ආභරණ ලැබී ඇතැයි උදම් අනමින් ජීවත් වේ. තමන්ට අලංකාර ජවසම්පන්න, බලසම්පන්න ශරීරයක් ලැබී ඇතැයි සිතමින් කටයුතු කරනුයේ මෙම නිසාවෙනි. අරහත් සම්මා සම්බුදු පියාණන් වහන්සේ නමක් ලෝකයට පහලවී "පින්වත් පුරුෂය, නුඹ කවා පොවා සතපවා නඩත්තු කරන ඔය විෂකුරු සර්පයන්ගෙන් අත මිදෙන්න, ඔවුන් ඔබට දෂ්ඨ කිරීමෙන් මරණය හෝ මරණය හා සමාන දුකකට පැමිණෙන්නේය"යි අවිද්‍යා අඳුර දුරලමින් සත්‍ය දේශනා කරයි. එවිට ප්‍රඥාවන්තයා, ධාතු සතරක් තමන්ගේ කරගෙන විඳින දුක අවබෝධ කරගෙන විෂකුරු සර්පයන් අතහැර පළා යයි. වා පිත් සෙම් කිපී අපව ලෙඩ කරන්නේ, මරණයට පත් කරන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතු කිපීමෙනි. භාග්‍යවතුන් වහන්සේ ධාතු මනසිකාරය කමටහන දී ඇත්තේ මෙම විෂඝෝර සර්පයන්ගෙන් මිදීමටය.

මෙසේ සර්පයන් හතර දෙනාගෙන් මිදී පලායන පුරුෂයා නැවත සිරකිරීමට කර්මය නැමැති රජතුමා විසින් වධකයන් සප්දෙනෙක් පිටත් කර යවයි. මේ වධකයන් පස්දෙනා නම් පංච උපාදානස්කන්ධයයි. නමුත් එම පුරුෂයා රූපය පෙණගොඩක් වැනි හරශූන්‍ය දෙයක් පවත්, වේදනාව දියබු බුලක් වැනි ඇතිවන තැනම නැතිවන දෙයක් බවත්, සංඥාව මිරිඟුවක් වැනි ඇතට තිබෙන බව පෙණුනත් කොතරම් ලඟට ගියත් අල්ලාගත නොහැකි මුසාවක් බවත්, සංඛාර කෙසෙල් කඳක් මෙන් එකිනෙකට එතී පවතින අරටුවක් නොමැති දෙයක් බවත් විඤ්ඤාණය මායාවක් මෙන් සත්‍ය වශයෙන්ම නොපවතින දෙයක් පවතින බව අඟවමින් මුලාකරන්නක් බව අවබෝධයෙන් එම වජකයන් පස්දෙනාටත් හසුනොවී පළායයි.

කර්මය නැමති රජතුමා විසින් වධකයන් පස් දෙනා ගෙනුත් මිදී පලා යන පුරුෂයා අල්ලා ගැනීමට වැලිකෙළියේ පටන් එකට සිට එම පුරුෂයාගේ හොඳම මිතුරෙක් හයවෙනි (සවන) වධකයා ලෙස පිටත්කර යවයි. මෙම මිතුරු වේශයෙන් එන සවන වධකයා වනුයේ නන්දි රාගයයි. කුඩාකල සිටන් එකටම මිත්‍රව කටයුතු කරන නන්දිරාගය පලායන පුරුෂයාගේ මනාප අමනාප කම් ඇලීම් ස්වභාවයන් සියල්ල දනී. යමකට කැමති නම්, එයට ඇලෙන්නේ නන්දි රාගය නිසාය. මෙම වධකයාගෙන් මිදීම අපහසුය. නමුත් යමකට ඇලීමෙන් තමන් දුකට පත්වන බව අවබෝධ කරගෙන මෙම පුරුෂයා සවන වධකයාටත් හසුනොවී පලායයි.

මෙසේ පලායන පුරුෂයාට හිස් ගමක් මුණගැසෙයි. මෙහි ඇති ගෙවල් හිස්ය. කෑමට බීමට යමක් සෙව්වත් එහි ඒවා ඇත්තේ නැත. මෙම හිස් ගෙවල් යනු ආධ්‍යාත්මික ආයතන හෙවත් ඇස, කණ, නාසය, දිව, කය, මන වේ. මේවා හිස් ගෙවල් වන්නේ එහි ආහාර නොමැති නිසාය. ඇසට ආහාර ලෙස වර්ණ රූප ලැබේ. කණට ආහාර ලෙස ශබ්ද රූප ලැබේ. නාසයට ආහාර ලෙස ගන්ධ රූප ලැබේ. දිවට ආහාර ලෙස රස රූප ලැබේ. කයට ආහාර ලෙස ඵොට්ඨබ්බ රූප ලැබේ. මනට ආහාර ලෙස ධම්ම රූප ලැබේ. මෙසේ ආධ්‍යාත්මික රූප නැවත නැවත සාදන්නේ ඒවාට අරමුණු ලැබෙනවා නම් පමණි. එසේ අරමුණු නොමැති වුවහොත් ඒවා හිස් ගෙවල් බඳු. අන්ධයාගේ ඇස හිස් ගෙයකි. මන්ද? ඊට අරමුණු ගැනීමට නො හැකි නිසාවෙනි.

මේ යථාර්ථය දැකගත් පුරුෂයා හිස් ගෙවල් වලින් ඉවත්ව ගසක් මුල වැතිරෙයි. එවිට සද්ධර්මය නැමැති කළ්‍යාණ මිත්‍රයා "පින්වත් පුරුෂය, මෙම ගමට ගම් පහරණා සොරු හයදෙනෙක් පැමිණෙන්නේය. වස්තුවක් නැති තොපව සොරකමෙහි යොදවා හෝ වහල් හිමියෙකු විකුණා හෝ ඔවුන්ගේ අරමුණු ඉටුකර ගනීවි. වහාම මෙතනින් පිටව යන්න"යි ප්‍රකාශ කරයි. ඔහු එබස් අසා සොරු හය දෙනාගෙන් මිදී පලායන්නේය. මෙම සොරු හයදෙනා යනු බාහිර රූපයි. එනම් වර්ණ රූප, ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප සහ ධම්ම රූපයි. වර්ණ රූපය ඇස පැහැර ගනී. ඇස විවිධ රූප වලට යොමුකරමින් ඇස සොරකමේ යොදවයි. එමෙන්ම ශබ්ද රූප කණ පැහැර ගනී. ඒ තුළින් කණ විවිධ ශබ්දවල යොමු කරමින් කණ සොරකමේ යොදවයි. මෙලෙස මගේ නොවන දෙයක් මගේ කර ගැනීමට මෙම බාහිර රූප පොළඹවන නිසා ඒවා සොරුන් ලෙස හැඳින්වේ.

ගම් පහරණ සොරුන්ගෙන් මිදී පලායන පුරුෂයාට ගව් සතරක් පළල ගව් සතරක් ගැඹුරු ගංගාවක් මුණගැසෙයි. මෙම ගංගාවෙන් කෙසේ හෝ එගොඩ වන ලෙස සද්ධර්මය නැමැති කළණ මිතුරා උපදෙස් දෙයි. මෙම ගංගාව නම් සතර ඕඝයෝය. එනම් කාමය ඕඝය නැමැති සැඩපහරින්ද, භව ඕඝ නැමැති සැඩ පහරින්ද, දිට්ඨි ඕඝ නැමැති සැඩ පහරින්ද, අවිජ්ජා ඕඝ නැමැති සැඩ පහරින්ද මිදී මෙතෙරින් එතෙරට යා යුතුය.

මෙම පුරුෂයාට ගංගාව තරණය කිරීමට කිසිදු ඒදණ්ඩක් පාළමක් හෝ ඔරුවක් නොමැත. තමන්ගේ මහන් සියෙන්ම නොකැඩෙන පවුරක් සාදාගත යුතුය. මෙම පවුර වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එනම් සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති සහ සම්මා සමාධි යන අංග අටෙන් යුත් මාර්ගයයි.

දැන් එම පුරුෂයා සාදාගත් පවුරෙන් එගොඩ වීමට අතපය වෙහෙසා ගංගාව තරණය කරයි. මෙසේ අතපය වෙහෙසීම වීර්ය ලෙස හැඳින්වේ. එනම් සතර සම්‍යක් ප්‍රධාන වීර්ය වඩා අකුසලයන් මර්ධනය කරමින් කුසලයන් වර්ධනය කරමින් ඉදිරියට යයි. එම පුරුෂයා මෙසේ ගංගාවේ ගව්වක් තරණය කළ තැන සෝතාපන්න වේ. ගව් දෙකක් තරණය කළ තැන සකදාගාමී වේ. ගව් තුනක් ගිය තැන අනාගාමී වේ. ගව් හතරම තරණය කර ආර්ය අෂ්ඨාංගික මාර්ගය නැමැති පවුරද අතහැර දමා එතෙර ඇති අභයභූමියට පැමිණ බ්‍රාහ්මණයෙක් වශයෙන් සිට ගනිමින් ඒ උතුම් පුරුෂයා අරහත්වයට පත්වේ.

මෙතෙර ලෙස හඳුන්වනු ලබන ලෝකය තුළ ඇත්තේ දුකකි. ලෝකය ලෙස හඳුන්වන්නේ බඹයක් පමණ උසට ඇති මනස සහිත කය නැමැති අපගේ ජීවන පැවැත්මයි. පුද්ගලයාගේ ජීවන පැවැත්ම තුළ ජාති, ජරා, ව්‍යාධි, මරණ යනාදි දුක් ඇත. නැවත නැවත ඉපදීමෙන් මෙම දුකින් මිදිය නොහැක. දුකින් මිදිය හැක්කේ ජාතිය ක්ෂය කිරීමෙනි. ජාති, ජරා, ව්‍යාධි, මරණ යනාදී දුක් සියල්ලම සැකවින්ම පංච උපාදානස්කන්ධය ලෙස හඳුන්වයි.



15 පිටුවට....

පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි

# තරුණ පරපුර ධාර්මික පැත්තට යොමු කරමු



රටක දරු පරම්පරාව යනු රටේකොඳු නාරටියයි. කවදා හෝ දිනක රටෙහි අනාගතය බාර වන්නේමේ උදාර පුතුන්ටයි. දරුවෝ වී ඉපිදහැදී වැඩි තරුණයන්ව රට නගන්නටලොව අනෙකුත් රටවල් තරමට නගාසිටුවන්නට ලොව අනෙකුත් රටවල් තරමට නගාසිටුවන්නට ඉදිරිපත් වනුයේ රටක තරුණ පරපුරයි. මේනිසා තරුණ පරපුර ගැන අපි වඩාත් සැලකිල්ලක් දැක්විය යුතුයි.වර්තමානයේ අප රටේ තරුණ පරපුර ගැන විමසිලිමත් වූ විට දක්නට ලැබෙන්නේ නාගරික තරුණයා තරමට ග්‍රාමීය තරුණයා ගේ සිතුවිලි එතරම්ම කිලිටි වී නොමැති බවයි. එහෙත් කඩිසර කමින් බලන කල නාගරික තරුණයා ග්‍රාමීය තරුණයාට වඩා ඉදිරියෙන් සිටීමත් පැසසිය යුතුයි. නාගරික තරුණ පරම්පරාව වෘත්තීය ජිවිතයක් ගත කරන්නට සැලසුම් කරන්නේ අධයාපනය ලබන සමයේදීමය. එහෙත් ග්‍රාමීය තරුණයා වෘත්තීමය රැකියාවන්නට යොමු වූ බව පෙන්නන්නට ඇත්තේ බොහෝ අවම ලෙසිනි. ඒ අය කාලය නිකරුනේ ගතකරනු පෙනේ. නාගරික තරුණයා මීට හාත්පසින්ම වෙනස්. ඔහුට ඇත්තේ තරඟකාරී ජීවන චක්‍රයකි. ඔහු ගනුදෙනු කරනුයේ ගෝලීයකරණය වූ සමාජයකය.

මේ කුමන සමාජයක ගනුදෙනු කළත් "සාරධර්ම" "හොඳ පුරුදු" යහගුණ ජීවිතයට ලං කර ගැනීම පොදුවේ ග්‍රාමීය තරුණයාටත්, නාගරික තරුණයාටත් වැදගත්ය. මන්ද රටේ අනාගතය බාරව ඇත්තේ මොවුන්ට බැවිනි.

මේවන විට මා වැඩ වාසය කරන උඩුවෙල වැලිපැන්න ශ්‍රී සුධර්මාරාමය විහාරස්ථානය කේන්ද්‍රකොට ගනිමින් සෑම වසරකම මාසික ධර්ම දේශනා මාලා වැඩසටහනක් පවත්වනු ලබයි. මේ වැඩසටහන තළින් අපි බලාපොරොත්තු වන්නේ තරුණ පරපුර ධාර්මික පැත්තට යොමු කරගැනිමටයි. බාල හා තරුණ පරපුර වෙත දැහැමි බවක් ඇති කරලීමයි. මෙය අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුත්තකි. තරුණ පරම්පරාවට බාල පරම් පරාවට නිසි මග තෝරා බේරා දී පෙන්වාදීම මහණ අයගෙන් සිදු විය යුතු අනිවාර්‍ය සේවයකි. රටේ මැතකදි බෙහෙවින් ආන්දෝලනයකට පත්වූ සිද්දියකි මැද පෙරදිග ගෘහ සේවයට ගොස් ඇණ ගසා වද හිංසාවට පත් කළ මාතාවගේ කථාව. මේ අහඹු ලෙස මධ්‍යයට විවෘත වු සිද්ධියක් පමණයි. මෙවැනි වද වේදනාවන් වලට ලක් වු අම්මාවරු තව කොතෙක් නම් මෙරට ඇද්ද?

මේ රටේ තත්වය මුදල් හදල් අමාරුකම් දක්නට තිබේන බව සැබැවක්. ජීවත් විම තරමක අසිරු බවක් පෙනෙනවා. ඒත් අපි මේ හැම දෙයක්ම කරන්නේ දරුවන්ට නම් දරුවන් වෙනුවෙන් දෙමාපියන්ට වගකීම් යුතුකම් බොහෝමයක් කරන්නට පැවරී තිබෙනවා. විශේෂයෙන්ම දරුවා ආරක්‍ෂා කිරීම වැදගත්, ඒ සඳහා දරුවා ළඟ අනිවාර්යයෙන්ම රැදිය යුතුය. නමුත් අද පවතින ආර්ථික හේතු මත තාත්තා පමණක් නොව අම්මාද රැකියාවන් හී නිරත විම සුලභව සිදුවන්නකි. පියා පමණක් නොව අම්මා ද රන් කහවනු නැතහොත් සල්ලි ටිකක් යහමින් සොයා එන්නට විදෙස් ගතවෙයි. මෙය මා දකින්නේ දරුවන් විනාශයට ඇද දැමීමේ මාවත විවර කර දිමක් ලෙසය. අඩු තරමින් අම්මා හෝ දරුවා ළඟ දැවටෙනවා නම්. අම්මාවරු හෝ දරුවන් වෙනුවෙන් කැපවෙනවා නම් දරුවෝ නොමඟට යැම වලක්වා ගත හැකි වේවි. අම්මාවරු විදෙස් ගත වීම භායනක වන්නේ දරුවන්
නිසි ලෙස හදා වඩා ගැනීමට නොහැකි වීම නිසාය.

විශේෂයෙන් විදෙස් ගත වන මාපියන්ගෙ දරුවන්ගේ කලදසාව මා නිරතුරුවම දකිනවා. වෙන්නප්පුව දුම්මලදෙනිය ශ්‍රී සුධර්මාරාම පිරිවෙනේ පරිවේනාධිපති ලෙසින් වැඩ වසන විට මම මේ විනාශය බහුල ලෙස දකිනවා. මක් නිසාද කියතොත් වෙන්නප්පුව කියන්නේ බහුතරයක් පිරිස ඉතාලි රටේ ජීවත් වන්නෝයි. අම්මා තාත්තා දෙන්නම ඉතාලියේ දරුවෝ ලංකාවේ, දරුවෝ හැදෙන්නේ ආච්චි අම්මා නැතහොත් වෙනත් ඥාතීන් සමඟයි. මේ දරුවන්ට මුදල් හදල් වලින් කිසිම අඩුවක් නැහැ. නමුත් හරි වැරැද්ද තෝරා බේරා දෙන්න අම්මා තාත්තා ළඟ නෑ. මේ නිසා රට රටවල්වල යන අම්මා තාත්තාගේ දරුවෝ විතරක් නෙවේ. දෙන්නා දෙමහල්ලන් විදෙස් ගතව හම්බකරන හැම කෙනෙක්ගේම දරුවන්ගේ ජීවිත අවදානම්. විශාල ලෙස දරුවන්ගේ අනාගතය විනාශ වී තිබෙනවා. මේ දරුවෝ මත්ද්‍රව්‍ය වලට පෙළඹිලා. වෙනත් නරක ක්‍රියාවන්ට යොමු වෙලා. හරි වැරැද්ද තොරාදෙන්න කෙනෙක් සිටියත් අම්මා තාත්තා ළඟ නැති නිසා පිළිගන්න කැමති නෑ.

කොච්චර මිල මුදල් තිබ්බත් වැඩක් තියෙනවද දරුවෝ හොදට හැදිලා නැත්නම්. හැම දෙමාපියන්ගේ වගකීමක් යහපත් දරුවෝ සමාජයට දායාද කරලීම. මේ ලෝකයේ ලැබිය හැකි උතුම්ම සම්පත දරුවෝ. මේ මොහොතේ මට මතක් වෙනවා විහාරමහා දේවිය හා කාවන්තිස්ස රජුගේ කතාව. විවාහ වී බොහෝ කාලයක් ගත වුවත් මේ දෙන්නට ද රු සම්පතක් තිබුනේ නෑ. මේ දෙන්නා දවසක් "තිස්ස" කියන ස්වාමීන් වහන්සේ මුණ ගැහෙන්නට යනවා. එවිට උන්වහන්සේ මේ දෙන්නට කියනවා ඔය ඇත්තෝ බොහෝ පින්වන්තයි. එනිසයි මේ රාජ සම්පත ලැබුනේ කියලා. ඒ වෙලාවේ විහාරමහා දේවීය කියනවා අපට මොන දේ ලැබුනත් හාමුදුරුවනේ දරු සම්පත් නෑ කියලා. ඒ විට උන්නාන්සේ විහාරමහා දේවිය තුල දරුවකු ලැබීමට ඇති මහත් ආශාව තේරුම් ගෙන ඒ මොහොතේ ගිලන්ව ආසාදන තත්වයේ පසුවන හිමි නමක් බැහැ දැක කථා කරන ලෙස ඉල්ලනවා.

පසුව විහාරමහා දේවියත් කාවන්තිස්ස රජුත් උන්වහන්සේ දක්නට ගොස් සියලු උපස්ථාන කොට අහනවා, ඔබ වහන්සේ නැවත ඉපදීමක් බලා පොරොත්තු වෙනවාද කියලා. එවිට උන්වහන්සේ පවසනවා දිව්‍ය ලෝකයේ උපදින්නට කැමති බව මෙවිට විහාරමහා දේවිය කියනවා දිව්‍යලෝකයේ අයට පින් දෙන්නෙත් මනුස්ස ලෝකයේ අයයි. නැවතත් මනුෂ්‍ය ලෝකයේ උපදින්නට ඇය ආයාචනා කර පන්සලෙන් යනවා. ඒ එන අතර මගදී දේවියත් රජුත් ආ අශ්ව කරත්තය නැම මඩල තෙක් ගිලා බහිනවා. ඊට මාස කීපයකට පසු විහාරමහා දේවිය ගැබ් ගන්නවා. ඔහු තමයි තුන් සිංහලයම එක්සේසත් කළ දුටුගැමුණු කුමාරයා.

ඉතිං මේ කතාවෙන් පැහැදිලි වන්නේ දරුවන්ගේ වටිනාකම විහාරමහා දේවියටත් කාවන්තිස්ස රජුටත් කොයිතරම් වස්තුව තිබ්බත් දරුවෝ නැතිව ශෝකයෙන් හිටියේ. දරු සම්පත කොයිතරම් වටිනා සම්පතක්ද? එහෙම සම්පතක් රන් කහවනු ඉදිරියේ විනාශකර දැමිය යුතතුද? ඒ නිසා අපගේ ඉල්ලීම මව්පිය දෙදෙනාගෙන් විශේෂයෙන් මව දරුවා වෙනුවෙන් කැපවිය යුතු බවයි.

**සාකච්ඡාකර සකස් කරනු ලැබුවේ**
**(රණතුංග රන්දෙණිය)**

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# දේශයේ අනන්‍යතාව සුරකිමු

තමාගේ ඉරණම තමා විසින්ම විසඳාගත යුතු බවත්, තමාගේ දෙවියා නැතහොත් ගැලවුම්කරුවා තමාම වන බවත් බෞද්ධ චින්තනය උගන්වයි.

ඒ අනුව මිනිසාගේ ජීවිතය හා සම්බන්ධ කර්මය, ඉරණම, දෛවය, දෙවියා ආදී සියලු දේ මිනිසාගේ උත්සාහයට සහ ධෛර්යට යටත්ය.

මෙය සරලව කිවහැක්කේ අදේවවාදී බව ලෙසය. කෙසේ වුවද ශ්‍රී ලාංකික බෞද්ධයෝ ඈත අතීතයේ සිටම දෙවි දේවතාවුන් විශාල පිරිසක් උදෙසා වැදුම් පිදුම් සිදුකරනු ලබති. මින් හැඟී යන්නේ බොහෝ බෞද්ධයෝ දාර්ශනික හා ආගමික මතවාද කීපයක් සරණ යන බවය.

ලොව පවතින සෑම රටකටම පාහේ ආගමික අනන්‍යතාවයක් පවතී. එය යම් ආගමකට මුල්තැන දීමේ සිට මූලධර්මවාදීත්වය දක්වා පැතිර යන්නකි.

ශ්‍රී ලංකාව බෞද්ධාගමට මුල්තැන සහ අනන්‍යආගම් වලටද නිසිතැන දෙමින් කටයුතු කරනු ලැබුයේ කලෙක සිටය. එය ශ්‍රී ලංකාවට බුදුදහම ලැබුණු දා සිට ක්‍රමයෙන් වැඩී ආ තත්වයකි. ඒ සඳහා ශ්‍රී ලංකාව සියලු සුදුසුකම් සපුරාලනු ලැබ ඇත. සිරිලක සිව්කොණ පිහිටි බෞද්ධ ආගමික වෙහෙර විහාරස්ථාන මෙන්ම දහස් සංඛ්‍යාත බෞද්ධ පුරාවස්තු ඊට නිදසුන් සපයයි. උතුරු පළාත සැලකූවිටද දඹකොළපටුන, ලංකාපටුන සහ නාගදීපය මුල්කොටගත් බෞද්ධ සංස්කෘතික ත්‍රිකෝණයක් පෙර තිබූ බව ඉතා පැහැදිළිය.

අන්‍ය ආගම් විෂයෙහිලා ආගමික සහනශීලීතාව පෙන්වන නිදසුන් බෞද්ධ ආගමේ අපමණය. දෙවන පෑතිස් රජ දවස මහින්දාගමනයෙන් ඇරඹි පසුව දුමින්දාගමනය, දළදාගමනය ඔස්සේ මෙරට ස්ථාවර කළ බෞද්ධ පදනම සම්බුදුරජාණන් වහන්සේ මහියංගණය, නාගදීපය සහ කැළණිය යන ලංකාගමනයන්ගෙන් පෙර දවස වඩාත් නියත විවරණ ලැබූවකි.

ඒ අනුව මෙරට පවතින සප්‍රාණික බෞද්ධ සංස්කෘතික පදනම ආරක්ෂා කර පෝෂණය කිරීම රජයේ පමණක් නොව ලෝක සංස්කෘතියේ මුරදෙටුවා ලෙස පෙනී සිටින යුනෙස්කෝවේද වගකීමකි. තෝරාගත් වෙහෙර විහාර ලෝකඋරුම මැයෙන් නම්කොට ඒවා සංචාරක ස්ථාන කරනු වෙනුවට සමස්ත ලංකාවටම බෞද්ධ සංස්කෘතික උරුමයක් සේ සලකා සංරක්ෂණය කිරීමට තරම් වටිනා දිවයිනක් බව අප ලෝකයට පෙන්නුම් කළ යුතුව ඇත.

ඉකුත් වසර 50 තුළ ශ්‍රී ලංකාවේ ආගමික ව්‍යාප්තිය වර්ධනය සහ ආගමික ස්ථාන ව්‍යාප්තිය හා වර්ධනය පිළිබඳ නිසි විමර්ෂණයක් සිදුකළහොත් හඳුනාගතහැකි කරුණු රැසකි.

ශ්‍රී ලාංකිකයෝ සැබවින්ම සාමකාමීය. සංහිඳියාකාමීහුය. බුදුදහමින් පෝෂිත මහා කරුණාව සහ මහා ප්‍රඥාවෙන් යුක්තය.

අධිරාජ්‍යවාදී බලපෑම දේශපාලන බලකාමය, අවස්ථාවාදී අන්තවාදය සහ දුරදිග නොබලා කටයුතු කිරීමේ අවසන් ප්‍රතිඵලය වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික දේශයේ අධ්‍යාත්මය විනාශ වීමය. එය ගොඩනැඟී ඇත්තේ බුදුදහම මුල්කොටගත් අන්‍යආගම්හි සහභාගිත්වය මතින් බිහිවූ සබැඳියාවකිනි.

එය සියල්ල කැටිවූ දාර්ශනික දාමයක් වැනිය. එහි මුල්පුරුක් සිඳලුවොත් අවශේෂ දාමයෝද නිතැනින්ම සිඳී බිඳී යනු නිසැකය.

අප දේශයේ ඒකීයත්වය සහ බුදුදහමේ ප්‍රමුඛත්වය පිළිබඳ මෙරට ගරුතර මහා සංඝරත්නය විසින් අවධාරණය කරනු ලැබ ඇත්තේ එවන් පසුබිමකය. අන්‍ය ආගමික නායකයින්ද ඒ බව පසක් කරනු ලැබ ඇත.

මෙම දේශය පුණ්‍ය භූමියකි. මෙහි වාසය කරන්නේ මේ භූමියේ ශ්‍රේෂ්ඨත්වය සහ ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨත්වය ආරක්ෂා කිරීමට බැඳී සිටිති. ඉන් ප්‍රකාශ වන්නේ දේශයේ ජාතිකත්වය සහ ආගමික ප්‍රමුඛතාව පිළිබඳවය. අන්‍ය සාමාජික සහජීවනය පිළිබඳවය.

# ථේර ථේරී ගාථා වලින් හෙළිවන නිර්ව්‍යාජ චරිත

තම හඳ හා කණ ගුරුකොටගත් ථෙර ථෙරීන්ගේ නිර්ව්‍යාජ ප්‍රකාශ මෙමගින් පවසා ඇත. ඛුද්දක නිකායට අයත් මේ ප්‍රකාශන කර ඇත. මේ ප්‍රකාශන වර්තමාන අප ජීවිත වලට කෙතරම් ප්‍රයෝජනවත් වේදැයි දැනගනු පිණිස මේ ථෙර ථෙරී ගාථා ලිහිල් බසින් ලියනු ලබන ලිපිපෙලේ 2 වැන්නයි මේ.

පන්සියයක් පිරිවර ඇති තමන් සියලු කෙලෙසුන් නසා රහත් වූ වගයි. ප්‍රසිද්ධව සිටි උරුවෙල කසුප් හා පිරිවර තුන්සියයක් සමග ශාස්තෘවරයෙකු ලෙස පෙනී සිටි නදී කාශ්‍යපත්, දෙසියයක් පිරිවර පිරිවරා සිටි රහතුන් යැයි ප්‍රසිද්ධ ගයා කාශ්‍යප ආදී චිර ප්‍රසිද්ධ සොහොයුරන් අතරින් ප්‍රධානියා වූ උරුවෙල කාශ්‍යප රහතන් වහන්සේ විසින් බුදුන් වහන්සේ ගැන කියා තිබෙන ගුණ සමුදායෙන්ම එකල ඉන්දියාවේ පැවති මිසදුටු දර්ශනයන්ගේ ස්වභාවය මනාව පිළිඹිබු වේ. හසල කීර්තිය ඇති ගොයුම් ගොත් බුදුන් වහන්සේගේ තුන් දහස් පන්සියයක් පෙරහැර දැක ඊර්ෂ්‍යාවෙන් හා මානයෙන් බුදුන් කෙරෙහි දැක්වූ පිළිවෙත් පුරිසධම්මසාරථී වූ බුදුන් මාගේ සංකල්පය දැන මට නිග්‍රහ කළහ. එනිසා අත්භූත වූ ලොම්දැහැගන්වන සුළු සංවේගයක් මට උපත ජටිල වූ මට ඉතා අල්ප වූ ලාභ සත්කාර ලැබිණි. මම කාම ලෝකය පෙරටුකොටගෙන සිටියෙමි. යාගයෙන් සතුටුවූයෙමි. පසුව බුදු සසුනෙහි පැවිදිව රාග, ද්වේශ, මෝහ සම්පූර්ණයෙන් නසාලමි. දැන් පෙර විසූ කඳ පිළිබඳ දනිමි. දිවැස් ලදිමි, පරසිත් දනිමි, දිව්‍ය ඥානයද ලදිමි. මම යම් අර්ථයක් සඳහා පැවිදි වීම්ද ඒ සියලු සංයෝජනයන්ගේ ක්‍ෂය වූ අර්ථය මා විසින් ලදිමියි උදාන වාක්‍යය ප්‍රකාශ කරන ලදී. තමා ඉන්දියානු සමාජයත් කෙතරම් මුලාවක පැටලී සිටියේ දැයි උරුවෙල් කාශ්‍යප රහතන් වහන්සේලා අවබෝධ වූයේ රහත් බව ලැබීමෙන් පසුවය.

බුදුපියාණන් වහන්සේගේ පියාණන් වූ සුදෝවුන් රජතුමාගේ බලවත් කාරුණික ඇරයුමේ බුදුන් වහන්සේ ශාක්‍ය ජනපදයට වැඩමවා ගෙන ඒම සඳහා පිටත් කළ කාලුදායී ඇමතිතුමන් බුදුන් වහන්සේ වෙත ගොස් පැවිදිව සියලු කෙලෙසුන් නසා රහත් වීමෙන් පසු මඟදෙපස වනා ඇති අයුරු කෙතරම් සුන්දරදැයි පැහැදිළි වේ. වහන්ස, ගස්වැල පරණලා හැර පියා ගිනි අඟුරු මල් ඵල ඇත්තා වූ ඵල හට ගැනීමට ලං වී ඇත. ඒ ගස්වැල් පහන් සිළු මෙන් බබළයි. මල් ඵල හටගත් ඒ ගස්වැල් වලින් හාත්පස සුවඳ හමයි. ඉතාම සිසිල් ද ඉතාම උණුසුම් ද නොවූ මඟට ඉතා සැප සෘතුව වේ. ශාක්‍යයෝද කෝලිතයෝද රෝහිණී නදිය තරණය කරන නුඹ වහන්සේ දකින රිසියෙන් සිටිති. ගොවියෝ පලාසාවෙන් කෙත සාති. බිජුවට වපුරති. ධනාපේක්‍ෂාවෙන් වෙළෙන්දෝ සයුරට වදිති. පුන පුනා වැසි වසිති. රටට පුන පුනා ධාන්‍ය ලැබේ. යදියෝ නැවත නැවත කුලයන් කරා යති. දානපතියෝ පුන පුනා දන්දී සුගතියට පත්වෙති. යම් කුලයක මහා ප්‍රඥා ඇති වීරයෙක් උපන්නේ නම් ඔහු ඒකාන්තයෙන්ම සත් පරපුරක් පවිත්‍ර කරයි. දෙවියන්ට දෙවි වූ භාග්‍යවතුන් වහන්සේට එය කළ හැකි වේ. මම අංගී රස වූ තාදී ගුණ ඇති බුදුන් වහන්සේගේ පුත්‍ර වෙමි. ගෞතමයනි, ශාක්‍ය ජනපදයට යන වේලාව දැන් උදා වී ඇත යනුවෙනි.

සුදොවුන් රජතුමා තම පුත් ගෞතම බුදුන් දැකීමේ බලවත් ආශාව නිසා ඒ සඳහා සුදුසුම පුද්ගලයා වූ කාලුදායී ඇමති පිටත් කර හැරියේ ඔහුගේ ඉල්ලීම් වලටද අවසර දෙමිනි. කාලුදායි ඇමති පැවිදි වීමෙන් පසු කෙසේ හෝ බුදුන් වහන්සේ ශාක්‍ය ජනපදයට වැඩමවාගෙන එන බවට පොරොන්දු වූ නිසා එම පොරොන්දු ඉටු කිරීම කල්යල් බලා මඟ දෙපස මෙන්ම එදා සමාජයේ පැවති සිරිත් විරිත් වර්ණනා කරමිනි. එම ඉල්ලීම ද විරුද්ධ වීමට නොහැකි වූ බුදුන් වහන්සේ විසිදහසක් රහතන් වහන්සේලා පිරිවරාගෙන ශාක්‍ය ජනපදයට වැඩිය බව සඳහන් වේ. අනේක විධ වූ රජ සැප විඳි කාලුදායී ඇමතිතුමා ඒ සියල්ල අත්හැර රහත් වූ පසු ඒ කෙරෙහි කිසිදු ඇලීමක් ගැලීමක් නොමැතිව උන්වහන්සේ වර්ණනා කළේ ස්වභාව සෞන්දර්ය විනා විඳින ලද රජ සැප හා කම්සැප ගැන නොවේ. උන්වහන්සේ ස්වභාව සෞන්දර්ය කෙතරම් ප්‍රිය කළේදැයි එම ප්‍රකාශිත නිරාමිස ප්‍රීතියෙන් මනාව පැහැදිළි වේ.

මහා පණ්ථක රහතන් වහන්සේ තමා දැන් ගතකරන ජීවිතය ප්‍රකාශ කරන නිරාමිස ප්‍රීතිය දෙස බලන විට අද සමාජය පුහු ආටෝප වලින් ඒ කෙරෙහි ඇලී ගැලී සිටින අයුරු පැහැදිළිය. යම් දිනක ශාස්තෘන් වහන්සේ දුටුවේද එදින මට සංවේගය උපන්නේය. ගෙට ආ සිරිතක අතින් පයින් පහර දී පලවා නොහරින්නාක් මෙන් අඹු දරුවන්ද ධනයද හැර කෙහෙ රැවුල් බහා සසුන් ගතවීමි. ඉන්ද්‍රියන්හි මනා සංයමයෙන් යුතුව අධි ශික්‍ෂාවෙන් හා ප්‍රඥාවෙන් අපරාජිත වී තෘෂ්ණා නැමැති හුල නොදල්වා හිඳිමි. මාගේ වීර පරාක්‍රමය බලව. ත්‍රිවිද්‍යාවෝ ලදිමි. පෙර විසූ කඳ පිළිවෙල දනිමි. දිවැස් ලදිමි. කෙලෙසුන් නැසූ උපදි රහිතව දක්ෂිනාර්හ වූ රහත් කෙනෙක් වීමේ මහා පණ්ථක රහතන් වහන්සේ නිරාමිස ප්‍රීතිය ප්‍රකාශ කළහ.

මේ අයුරින් නොයෙකුත් දුක් කම්කටොලු වලින් පීඩාවට පත් ගිහි ජීවිතය ගැන සියළු කෙලෙසුන් නසා රහත් බවට පත් රහතන් වහන්සේලා කෙතරම් සංවේගයක් දක්වන්නේද යන්න උන්වහන්සේලාගේ ප්‍රකාශ වලින් පැහැදිළිය.

පිටුපසින් හා ඉදිරියෙන් කිසිවෙකු නැති විට හුදෙකලාව වනයෙහි විසීමි. බුදුන් වහන්සේ විසින් වනන ලද වන සෙනසුනට යන්නෙමි. තනිව හැසිරෙන නිවනට මෙහෙය වූ සිත් ඇතිව තනිව වෙසෙමි. මතැතුන් විසින් සෙවූ නා ලද වනයෙහි ශ්‍රමණ ධර්මයන්හි වසඟයට ගියෙමි. සුපිපි සිහිල් වූ වනයෙහි ගිරි කඳුරෙහි සිරුරු සෝදා එකලාව සක්මන් කරමි. ආශ්‍රව රහිත වූයෙමි. අවිද්‍යාව හලෙමි. මලෙන් ගැවසුනු එතකින් සිහිල් වූ බෑවුම් ඇති කඳු වළලු ඇති වනයෙහි විමුක්ති සැපයෙන් සිත් අලවා වෙසෙමි.

මම පරිපූර්ණ සංකල්ප ඇත්තෙමි. ලප නොමවන් පූර්ණ චන්ද්‍රයා මෙන් සියලු ආශ්‍රවයන් ක්‍ෂය කළෙමි. නැවතත් ඉපදීමක් නැත. අනන්ත වූ සැප ඇති නිවන අවබෝධ කර ගතිමි. ඒක විහාරීය මහ රජාණන් වහන්සේ තම නිරාමිස ප්‍රීතිය ප්‍රකාශ කර ඇත.

යමෙක් තමන්ගේ මෙන්ම අනුන්ගේ හිත සුව පිණිස හිතන්නේ බුදුන් විසින් දෙසූ පරිදි ආනාපාන සතිය සම්පූර්ණ කර වඩනා ලද ද හෙතෙම වළාවෙන් තොර චන්ද්‍රයා මෙන් මෙලොව බබලයි. මාගේ සිත ඒකාන්තයෙන් පිරිසිදුය. අපමණ සැප ඇති නිවන ප්‍රත්‍යක්‍ෂ කළෙමි. සිව් පිළිසිඹියාපත් අවබෝධ කළෙමි. සියලු කෙලෙසුන් නැසුවෙමි. එනිසා සතර දිශාවේම බබලයි. නුවණැත්තන් ධනයෙන් පිරිහුනත් ජීවත් වන්නේය. ධනයෙන් ආඪ්‍ය වූවත් නුවන නැති අය මළවුන් වැනිය. ප්‍රඥාවන්තයා බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේය. එසේම කීර්ති ප්‍රශංසා ලබයි. දුක් ඇති වුවත් සැපෙන් හා සතුටින් කල් ගෙවයි. යමක් ඇති වනනේද එමෙන්ම එය නැති වන්නේය. යමෙක් උපන්නේ නම් ඔහු ඒකාන්තයෙන්ම මරණයට පත්වේ. මෙය සොබාදහමයි. මෙය පුදුමයක් හෝ ආශ්චර්යයක් නොවේ. මරණයක්

15 පිටුවට...

එච්.එම්.පී.හේරත්
මොරගහවැව - වීතිකුලිය




සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.




## ආදර අම්මේ......... අගනේය ඔබේ සෙනෙහස

අසරණ කමයි ලෝකයේ රජ වුනේ
දුප්පත් කමයි සාමය නැති කලේ
පෙරදා තිබු සාමය කොයිබද ගියේ දුරස් වී
අම්මා ගියේ මෙහෙකාරියක සේ
දුක්බර දිවියේ නිමාව දකින්නයි..............

විෂම වූ ලෝකයට ගොදුරු වු
පියාගේ කරදර ගංඟාවේ
නිමග්න වු ඔබේ දියණිය
කෙසේ නම් ඉවසම්ද ?
අම්මේ
හඩගා අසන්නෙමි............
ඔබේ සෙනෙහසේ සුවඳ
නොලබන්නට තරම්
පව්කාරියක වුනේ කෙසේ ද මා...........
අම්මේ
මවකගේ ආදරණීය උණුහුමක
සුවඳ

හැමදා පතන්නෙමි මා
එපා අම්මේ පුංචි දෝණිට
සුරඟන ලොවක්
එයින් නොහැකිය මා
සනසන්නට
මෙරට තනිවු පුංචි දෝණිට
අගනේය සුර ලොවකටත් වඩා
ඔබේ සෙනෙහස්..........
සුවඳ.............

ඩී.කේ. ලක්මිණි කුමාරි බංඩාර
ගලේවෙල

## සිත

*භවය පුරා සැරිසරමින්*
*පිනටම තන්හාවෙන්*
*නිවනද ඇත මග අරිමින්*
*සසරද අනේ දුක් විඳිමින්*

*කුසල් වඩා සිත සීලෙන්*
*කරන පිනන් කුසල් මගින්*
*බියකරු බව කෙටි කරමින්*
*නිවනද ඇත සිත සන්සුන්*

*එම්. ජී. මානන්ගොඩ- වැලිමඩ*

## ජීවිතය....

ගලන ගඟක් සේ ගලායන ජීවිතය
විඳවන්නට ඇති දෙයක් නොව
විඳින දෙයකි..........
එහෙත් කිම...........
විවිධ ඝණ දුර්ග මැදින් යනවිට
ඒ ජීවිතය නැමැති ගංඟාව වරෙක
එපාවෙයි.
කටුක බවෙන් පිරී ඉතිරෙන
ඒ ජීවිතයට
නව පිණිබිඳුවක් වී
වැටෙන්න සැනසිල්ල
එයයි ජීවිතය ලබන
ලොකුම දායාදය.............

ෂෙහානි ශෂිනිකා
ආනන්ද ජාතික පාසල
පුත්තලම.

## සෑ රජුන්



සෑ රජුන්
මඳ සමඟ වෙලී
බෝ මළුවෙ සිලිය ම
පින් බරවු සෑ රජුන්
නැගුණි නිලඹර උසට

සොම් නැසින් පිරි හද
නෙතු රැඳුන විටදී සැම
සෑ රජුන් අහස උස
අපේ විස් කමක් නොව

අපි ලගින් නිති සරණ
උතුම් මිනිස් හදේ
පැතුම් ඉටුවී තැනුන
රුවන් විමනක්ය මෙය

බැතින් හදතුල රැඳුන
වැඳුම් නිරතුරු වදිමු

යූ.ජී.නිලූකා සේනාරත්න

## දහසක් වැව් බැඳි රජරට



කුට්ටම් පොකුණු ඇත් පොකුණු ඈ
නෙක සිරින් මත් කළ
පඬු අබා කල සිට
නෙක දනෝ කළ දිය කෙළි
සිහිකරයි මහාවංශය..........
මව් කුසේ නොදැනුවත්ව කළ
දිය කෙළි ජය කෙහෙළි කොට
අපේ දරුවන්ට ලොව නගන්නට
ගහකොල වැව් දිය එක්ව
දිවි ගෙවන්නට
අගනා දිවි අපමණ මුදාලන්නට
දුන් හැඩ වැඩ හඬ
හදවතම ඇමතූ බව
අදරැති පියෙකු සේ
තුති පුදමු මේ නිල් දියවරට
සේම
රත්නයක් වන් සිසු දරුවනට එකසේ රැඳුණු......
දෙගුරුන් ලෙස අපේ තුති කවි මල් පුදමිනේ.....
නිදුක් නිරෝගීව සරන්නට ලැබ
මේ නිල් දියවරේ......රැදේවා ඔබෙ නම
දිය සිඹින සුලඟසේ.........

ජී.වයි.එච්. උදේනි විතානගේ ගුරු මාතාව
අ/ තම්මැන්නාපුර විදුහල
අනුරාධපුර.

## දූ දන ගති

| | |
|---|---|
| හෙට මොනවද | වෙන්නේ |
| මනිසුනි නැත | දන්නේ |
| කොහිදැයි මේ | යන්නේ |
| නැත යන තැන | දන්නේ |
| | |
| පෙන්වන සැම | ගුණ |
| සිත යට ඇත | කුණ |
| දෙසනවා වැදි | බණ |
| හරි මඟ නැත | දැන |
| | |
| දෙවියන් යැද | සෙත |
| සැනසෙන යටි | සිත |
| මියැ දෙන තුරු | ගත |
| වනසති යහ | පත |
| | |
| වැඩ තිබුණත් | ගොඩ |
| කර දුන්නත් | හැඩ |
| දුන්නොත් ළඟ | ඉඩ |
| ඉල්ලන් කකන | දඩ |
| | |
| නොතකන අණ | ගුණ |
| ජගතුන් සැම | තැන |
| ඇති තැන යහ | ගුණ |
| වනසති, සැම | දින |
| | |
| පණ දෙන්නට | කතා |
| කළ ගුණ නැත | සිතා |
| දුදනන් ගැන | කතා |
| මොනවද? තව | කතා |

සිති ගමගේ

## සිත් අහසට සුභ පැතුම්

*සිත් අහස බිලිදෙකි*
*ඉපැදිලා සතියකි*
*දිදුලන සඳවතකි*
*රන්ගිර වාසනාවකි*

*රන්කිරි මුවෙහි ගෑ දින*
*වැණුවා උතුම් මව් ගුණ*
*ඒ මහා බලයෙන*
*රැදේවා රන්ගිරි ගුවන*

*අහසක් තරම් වන හිතේ ඇති සිතුවිලි*
*රහසක් නොකොට ලොවටම බෙදා කර හෙළි*
*සහසක් සිතුම් හෙළි කරන්නට නොව මැලි*
*දිරියක් ලැබේවා රැදෙනට නොසෙල්ලි*

*සුරනි නර්මදා ගාල්ලගේ*
*කුරුදුගහ හැතප්ම - ඇල්පිටිය*

## සංවර්ධනය

අහස සිපගත් උස්
ගොඩනැගිලි
ජීවන බරට පමණක්
දෙවනි වන.....
.
ගුවනින් ගොඩබිමින් පාලම්
දසත
සිනහවක් නොදත් මිනිසුන්

මාරුවන......

හන්දියක් ගානෙ බුදු පිළිම
නිවනට නොයන බස්,
නැවතුමයි එතැත......

විශ්ව ගම්මානයකි ලොවම
පැය විසිහතර
මදි කියන......

භාග්‍යා එම්. හේරත්
කැකිරාව

06 පිටුවෙන්....

# රූපයේ යථාර්ථය

අවිද්‍යාවෙන් වසාගත් පසු හිත සංකාර බවට පත්වී කර්ම බවට පත් වෙනවා. මේ ශක්තීන්ගේ ස්වභාවය ගැඹුරෙන් ගැඹුරට විදූ ඇසින් බලා පරම අනු ඉක්මවා ගිය ස්වභාවය තැන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව විදූමනසට ප්‍රත්‍යක්ෂ වශයෙන් ගෝචර කරගත යුතුය.

ධාතුන්ගේ හෙවත් ශක්තීන්ගේ සුද්ධ ධර්මයන්ගේ පරිවර්තනශීලා බව අතරක් නැතිව නිරන්තර පෙරලෙන බව, වෙනස්වන බව ධම්මට්ඨිතාවයයි. ධම්ම නියාමතාවයි. මෙහි ධම්ම යන්නෙන් අදහස් කරනුයේ හට ගැනීමේ නිරුද්ධවීමත්, නිරුද්ධවීමේ නැතිවීමත් ප්‍රකට කිරීමයි.
හටගැනීමේ ශූන්‍යත්වය නිරුද්ධවීමයි.
නිරුද්ධවීමේ ශූන්‍යත්වය හටගැනීමයි.
ඇතිබවක් නැතිවේ. නැතිබවත් නැතිවේ. අනිත්‍යයි.

මේ ස්වභාවයට පුනර්භව වචනය යෙදී ඇත. පුනර් යනු නැවත යන්නයි. භව යනු පහලවීම හෙවත් හටගැනීමයි. ලෝකධාතුන්හි යම් කිසි සංකත ධර්මතාවයක් වේ නම් ඒ සියල්ල මේ පුනර්භව ධර්මතාවයට යටත්ය.

මේ බව සංයුක්ත නිකායේ පච්චය සූත්‍රයේ උප්පාදාවා තථාගතා නං අනුප්පාදවා තථාගතානං ඨිතා ච සධාතු ධම්මාට්ඨිතා ධම්මා නියාමතා ඉධප්පච්චයතා.... යනුවෙන් පැහැදිළි කරති.

තථාගතයන් වහන්සේලා ලෝකයේ පහල වූවත් පහල නොවූවත් ධාතුන්ගේ ශක්තින්ගේ ඇතිවීම නැතිවීම (අනිත්‍ය බව) සදාකාලිකවම ලොව විද්‍යාමානයි. ශක්තින්ගේ ස්වභාවය නිරන්තරයෙන් වෙනස්වීමයි. පරිවර්නශීලී ක්‍රියාකාරිත්වය සදාකාලිකව සිදුවන නිසා කිසිදු පරම අංශුවක් වත් ඒකියත්වයක් තුළ ස්ථාවරව නොපවතී.

මේ මහා චලිතය මහා වේගය, ශක්තීන්ගේ විෂමය තුළ නිරතුරුව සිදුවන අන්‍යොන්‍ය වෙනස අතරත් නැතිව ඉඩසක් නැතිව අසංඛ්‍යම වේ. මේ මහා විශ්ව ධාතුන්ම මහා චලිතයකි. ලෝක යට වේගයකි. එහි ආරම්භයක්, අවසානයක් පැනවිය නොහැක. මේ ශක්ති ජාලයේ ස්වභාවය අනිත්‍ය තාවය ලෙස භාග්‍යවතුන් වහන්සේ වදාලහ. මේ අනිත්‍ය තාවයට යටත් නොවන සජීවී අජීවී ලෝකයේ කිසිවක් නැත. සත්වයා සම්බන්ධ ව ඇති අභ්‍යන්තර ඇස, කණ, නාසය ආදී රූපත් බාහිර වර්ණ රූප, ගන්ධ රූප ආදියත් ඵස්සයෙන් හටගන්නා වූ විඤ්ඤාණ ශක්තිය ද මේ නිසා අනිත්‍ය වේ. විඤ්ඤාන ශක්තිය තුළින් නිකුත් වන නාම ධර්ම පහ පංචඋපාදානස්කන්ධය නිත්‍ය සැප ආත්ම වශයෙන් අල්ලා ගැනිම දුක ලංකරගත්තා වේ. රූපාදී සංකත ධර්මවල යථාභූත ඥාණ දර්ශනය පහල කර ගැනීමෙන් දුක අතහැරේ. ලෝකයා අතහැරේ. රූපයෙන් නිදහස් වීම යනු දුකෙන් නිදහස් වීමයි. හෙවත් ලෝකයෙන් නිදහස් වීමයි . රූපමය මන තුළ නිවන නොවන නිසා, සංයුක්ත නිකායේ අස්සු සූත්‍රයේ මෙසේ සඳහන් වේ.

යාවඤ්චිදං භික්ඛවේ අලංමේව සබ්බ සංඛාරේ
සු නිබ්බින්දදි තුං - අලං විරජ්ජිතුං - අලං විමුච්චිතුං

ඒ නිසා මහණෙනි, හටගත් සියළු සංස්කාරයත් පිළිබඳව නිර්වින්දනයට, විරාගයට, මිදීමට, පැමිණීමට සුදුසු වන්නේය.

භාග්‍යවතුන් වහන්සේ විශ්ව පදාර්ථ පිළිබඳව නිරීක්ෂණය, පරීක්ෂණය, නිගමනයේදී යථාභූත ඥාණ දර්ශනය පිළිබඳව අවබෝධ ඥාණයේදී ස්කන්ධයේ පදාර්ථය ඉක්මවා පරම අනුව ඉක්මවා ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන න්‍යෂ්ඨියේ ශක්ති පුංජයක් ඉක්මවා පරමාණු ඝර්භයේ ශක්තිය ඉක්මවා අවකාශයේ මායිම් ඉක්මවා මහා විශ්වයේ අචින්තය වෙත මනසින් පැමිණියහ. ජීවිතයත්, චලනයත් දෙකක් නොවේ. ද්විත්වයක් නොමැත. චින්තනය චින්තනයක් මිස චින්තකයෙක් නැත. චින්තනය ඉවත්කළ විට චින්තකයාද ඉවත් වේ. බලමි, අසමි, ආඝ්‍රාණය කරමි. රස බලමි. පහස ලබමි. සිතමි. අත්හල විට මම ද ඉවත් වේ. මම සිටින තාක් මර වසයම වේ. මම ඉවත්වීමම මාරවසඟයෙන්ද ඉවත්වීම සිදුවේ.



# පරිසරයට ගරු කරමු

අප ජීවත්වන වටපිටාව පරිසරය ලෙස හැඳින්වීමට පුළුවන. මෙම පරිසරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්වීමට පරිසරවේදීහු ඉදිරිපත් වී සිටිති. මිනිස් වර්ගයාත්, සත්ව වර්ගයාත්, ජීව කොටසටත්, ගොඩනැගිලි, කඳුහෙල්, ගංගා, ප්‍රෘථිවිය ආජීව කොටසටත් අයත් වෙති.

විශ්වයේ ආරම්භයත් සමඟ පරිසරය ගැන විවිධ අදහස් චින්තකයින් විසින් ඉදිරිපත්කර තිබුණි. පරිසරය ගැන නිවැරදි ඉතාවැදගත් අදහසක් ඉදිරිපත් කළ ශ්‍රේෂ්ඨ චින්තකයා වශයෙන් සලකනු ලබන්නේ බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ පරිසරයට හිතකාමී වූවා පමණක් නොව ආරක්ෂා කිරීමට ක්‍රියාවෙන්ද පෙන්නුම් කළ සේක.

භික්ෂූන් වහන්සේ පරිවරාගෙන චාරිකාවේ හැසිරෙන අවස්ථාවේ සොබා සෞන්දර්යයෙන් යුක්ත වනාන්තරයක් දැක ''රමණීයානි, ආරඤ්ඤානි'' යනුවෙන් භික්ෂූන් වහන්සේලාට විනය නීති පැනවීමේදී වෘක්ෂලතා කපා දැමීමත් තණකොළ ගලවා විනාශ කිරීමත්, විනය විරෝධී ක්‍රියාවන් ලෙස පෙන්වා දුන් බුදුරජාණන් වහන්සේ පරිසරය නිරතුරුවම ආරක්ෂා කරන ලෙසට අනුශාසනා පැවැත් වූ සේක. බුදුවීමට උපකාරී වූ බෝධීන් වහන්සේ වෙනුවෙන් සතියක් පුරා ''අනිමිස ලෝචන පූජාව පැවැත් වූයේද කෙළෙහිගුණ සැලකීමත් වෘක්ෂයන්ට සැලකීමත් පෙන්වාදීම සඳහාය.

පරිසරය විනාශ කරන්නන් ගැන දක්වා ඇත්තේ දුෂ්ඨ පුද්ගලයන් ලෙසටය. ''අරඤ්ඤගතොවා, රුක්ඛ මූල ගතොවා'' යනුවෙන් පෙන්වා දී තිබෙන්නේ ද වනගතව රුක් මුල්හි වාසය භික්ෂූන්ට යෝග්‍යවන බවයි. ජලයද පරිසරයේම කොටසක් වන බැවින් එය ආරක්ෂා කිරීමට බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට උපදෙස් ලබාදුන් සේක. ජලයට කෙලගැසීම, මළ - මූත්‍රා දැමීම වෙනත් අපද්‍රව්‍ය (කසල) දැමීම නොකළ යුතු බවත්, ජලය පෙරා පානය කළ යුතු බවටත්, ජල නාස්තිය කිසිවිටකත් නොකළ යුතු බව බුද්ධ දේශනාවේ වැඩි දුරටත් සඳහන් වී තිබේ. උපකාර වන පිරිසිදු වාතය ලබාදෙන්නේද සත්ව වර්ගයාගේ ජීවත්වීමට උපකාරවන පිරිසිදු වාතය ලබාදෙන්නේද අවට ඇති පරිසරය මගිනි. එවැනි පිරිසිදු වාතයක් ලබාදෙන පරිසර විනාශය සමාජයට සිදුකරන අපරාධයත් ලෙසට දහමෙන් පෙන්වා දී තිබේ.

විවිධ කර්මාන්තශාලා මගින් වාතයට මුසුවෙන අපද්‍රව්‍ය කැබිලි මගින් පරිසරයට සිදුවන හානිය ඉතා විශාලය.ජලයට මුසුවීමෙන්ද ජලය විනාශයට පත්වෙයි. මිනිසුන්ටත් සත්වයින්ටත් එම ජලය භාජනය වේ. එබැවින් පරිසරය විනාශ කරන කවර පුද්ගලයෙකුට වුවද උපරිම දඬුවම් ලබාදීමට රාජ්‍ය පාලකයන් ක්‍රියාකළ යුතුවේ. පරිසරයට



හිතකාමී උයන්වතු වැවීම, වනාන්තර ඇති කිරීම, පැන්හල් කරවීම, පොකුණු සෑදීම, දිවා රාත්‍රී පින් වැඩෙන ක්‍රියාවන් ලෙස බුදුදහමෙහි දක්වා තිබේ.

විවිධ ක්‍රම මගින් පරිසරයට මුදාහරින ''කාබන්ඩයොක්සයිඩ් වායුව'' පිටකරයි. ආත්මාර්ථකාමී පුද්ගලයින් තම අභිලාෂයන් ඉටු කරගැනිම සඳහා වනාන්තර කපා විකුණා ගනිති. වඳවී යන කළුවර, බුරුත, කුඹුක් වැනි වෘක්ෂයන් හොර රහසේ කපාගෙන වැඩි මිළකට විකුණා සැපවත් ජීවත ගතකිරීමට ක්‍රියා කරති. සුළු පිරිසක් විසින් සිදු කරනු ලබන මෙවැනි ක්‍රියාවන්ගේ විපාක විඳීමට සියළුමදෙනාට සිදුවෙන බව පැවැසිය හැකිය. ලෝකයේ ජීවත්වෙන පරිසරවේදීන්ගේ වාර්තාවන්ට අනුව පරිසරයට එල්ලවන හානිය විශාලය. දැනුවත්කමින් හෝ නොදැනුවත්කමින් පරිසරයට සිදුකරනු ලබන හානිය නතර කළ යුතුවේ.

එසේ නොවුවහොත් මිහිතලය සත්ව වාසස්ථානයට නුසුදුසු තැනක් බවට පත් වී යනු නොඅනුමානය යන ප්‍රකාශය අප සැමදෙනා විසින්ම සිහි තබාගත යුතුවේ. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයින්ට පරිසරයේ ඇති වැදගත්කම පෙන්වා දුන්නේ එමගින් අනෙකුත් ප්‍රජාවට අවබෝධය ලබාදීම සඳහාය. විනයනීති වශයෙන් ශ්‍රාවකයන්ට පෙන්වා දුන් බොහෝ කරුණු (තණකොළ ඉවත් කිරීම, අතු කැඩීම වැනි දේ හැරුණු විට) සෑම ජන කොට්ඨාශයකටම පිළිපැදිය යුතු කරුණු බව පෙන්වා දීම සුදුසුය. පරිසරය සුරැකීම ජාති,ආගම්, කුල භේදයෙන් තොරව මිහිමත ජීවත්වන සියළුම මිනිස් වර්ගයා විසින් ඉටුකළ යුතු වගකීමක් වන බව සිතේ තබාගෙන තම කාර්යයන් සිදුකළ යුතු වන්නේය.

ඇම්.ඩී.විජයවර්ධන

# බුදු සමයට පසු



මෙරට බුදු සමය පැමිණෙන්නට පෙර සිටද සිංහල ජනතාව මෙහි ජීවත් වූ බවට සාධක තිබුණත් බුදු සමය පැමිණීමත් සමඟම සමාජය තුළ පමණක් නොව ලාංකීය මිනිසා තුළද ප්‍රබල වෙනස්කම් රාශියක් සිදු විය. බොහෝ විට සිදුව ඇත්තේ එතෙක් පැවති දේශීය ඇදහිලි විශ්වාස පද්ධතියත්, පසුව පැමිණි බුදු දහමත් එකතු වී පාරිභාෂිත නැතහොත් ව්‍යවහාරික බුදුදහම නිර්මාණය වීමයි. මෙහි ප්‍රතිඵලය බුදුසමයෙන් විශික්ෂිත වූ ජන කොට්ඨාශයක් මේ රටේ ඇති වීමත්, බුදු සමයෙන් වියුක්ත කොට මේ රටේ ජනතාව විග්‍රහ කළ නොහැකි වීමත්ය. අතීතයේ පටන් හෙළ ජනතාව ගැයූ දහස් ගණන් කවි කරනුයේ අප රටට අනන්‍යවූ මේ සිංහල බෞද්ධ ලකුණයි.

"කල් බලා නොවෙද ගොවිතැන් කරන්නේ
මල් වරා නොවෙද කිරි වැද පැසෙන්නේ
හෙනහුරා නොවෙද වැහිපල නොදුන්නේ
ලොව්තුරා බුදුන් කවදද දකින්නේ"

මෙරට බොදු ජනතාව තම පෞද්ගලිකත්වයට වඩා සැළකිලිමත් වූයේ ආගමික කටයුතු වලටය. ඔවූහු නොකා නොබී දුක සේ ජීවිත ගත කළත් බුදුන් වෙනුවෙන් කරන ලද කැපවීම නොසලකා හැරියේ නැත. මේ කවියේ කථකයාද ඒ අතීත සිංහල ලකුණ අපූර්ව ලෙස පෙන්වා දෙන්නකි. මේ කවියේ කථකයා ගොවිතැන පාලු වීම පිළිබඳ පසුතැවිලි නොවේ ඔහුට එන පසුතැවිල්ල නම් අස්වැන්න පාලු වීම නිසා මෙවර අළුත් සහල් මංගල්‍යයට සහභාගී වන්නේ කෙසේද යන්නයි. බුදුන් වෙනුවෙන් එසේ සිතුවත් තම අඹු දරුවන් පවා අමතක වීම, සිහිපත් නොවීම පුදුමයට කරුණක් වෙයි. බුදුන් වහන්සේට ගොවියා එදා දැක්වූ ගෞරවය තම දරුවන් පවා සිහිපත් නොවීමට හේතුවන්නට ඇත.

"දුම්බර බැද්දේ මඟ ඉදලා මැදින් සමු
කඩා පලු වීර කාලා වතතුර බොමු
අඟන බිලිඳු හට නැවතී කිරි පොවමු
මහියංගනේ වැඳලා අඬ අඬා යමු"

මේ කවියේ උපාසිකා මාතාව නුවර සිට මහියංගනය වඳින්නට ගිය ශ්‍රද්ධාවන්තියකි. ඇය මහියංගනය මහා විහාරය වැඳ හඬමින් නැවත පැමිණි වගක් සඳහන් වෙයි. මේ කවියෙන් හෙළි කරන්නේ එදා බෞද්ධ ජනතාව තම දිවිය දෙවනි කොට වන්දනා ගමන්වල නිරතවූ අයුරුයි. නඩයට එකතුවන කිසිවකුටත් නැවත යහතින් එන්නට ලැබෙතියි යන්න පිළිබඳව සහතිකයක් දිය නොහැක. කුමන හෝ ආකාරයේ විපත්වලට මුහුණ දෙන්නට එවුනට සිදුවිය හැකිය. එහෙත් අපූර්වතම දෙය නම් තම ජීවිත වලට වඩා මේ මිනිසුන් බුදුන් දැකීම, වැඳීම ශ්‍රේෂ්ඨ කර ගැනීමයි. එසේම මේ අයට මහියංගනය වැනි දාගැබක් ගඩොල් ගොඩක් වූයේ නැත. මේ ශ්‍රද්ධාවන්ත ජනතාවට මහියංගන සෑ සමිඳු යනු බුදු සමිඳුන්මය. දාගැබ වැඳ පුදා ගෙන නැවත එන්නට යද්දී ඔවුන් හඬා වැලපුනේ ඒ නිසාවෙනි.

"සතර දෙපෝදා පුන් සඳ බැබ ලෙනනවා
අහර කයට නැතිදා බල අඩු වෙනවා
නෑර කළ කුසල් අකුසල් පල දෙනවා
වේර පිටිය චේතිය අද බැබ ලෙනවා

ලාංකීය සමාජයේ පිරිමියා ආගම දහම කෙරෙහි බොහෝ දුරට නැඹුරු වන්නට පෙළඹෙන්නේ කය බල නැතිව වියපත් වූ විටය. එයට හේතුවද ජීවිතයේ කායබල ඇති කාලය පුරාම කෙතට හේනට දිවිය කැප කිරීමයි. අඹුදරුවන් වෙනුවෙන් කාලය ගත කිරීමයි. කෙමෙන් කෙමෙන් අබල දුබල වෙද්දී සංසාරික බියක් සිංහල බෞද්ධයා තුළ ඇති වෙයි. එවිට ඔවුන් පෝයට සිල් ගනිමින් ආගමික ජීවිතයකට නැඹුරු වෙති. නමුත් ලාංකීය කාන්තාව නම් කුඩා කළ පටන්ම ආගම දහමට ලැදි ශ්‍රද්ධාවන්ත අයෙකු බවට පත්වෙයි.

"දෙතනේ රත්‍රං කිරි එරෙනා බෝ
කොතැනේ වදිතත් වට සිටිනා බෝ
නීතියේ සව් සිරි සත රකිනා බෝ
හිතුසේ වදින්නනට යමු සිරිමා බෝ"

ලාංකීය බෞද්ධ සමාජය තුළ ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඇත්තේ ශ්‍රේෂ්ඨ ස්ථානයකි. එක් පසකින් එය අපේ කල්ප වෘක්ෂය සේ හැඳින්විය හැකිය. ඉහත කව ගැයූ ගැමියා බෝධින් වහන්සේ මිනිසාට ලබා දෙන සම්පත් ත්‍රිත්වයම කුමක්දැයි හෙළි කරයි. එනම් දරු සම්පත්, සියලු භෞතික සැප හා මනුෂ්‍යාගේ ආරක්ෂාව යන ඒවායි. මෙයින් පෙන්වා දෙන්නේ සිංහල බෞද්ධයා තුළ බෝධීන් වහන්සේ පිළිබඳව ඇති විශ්වාස පද්ධතියයි. අදත් සිංහල ගැමියෝ මෙම කරුණු තුන සාක්ෂාත් කරගන්නට ශ්‍රී මහා බෝධියේ පිහිට පතයි.

"මහියංගනේ ආසෙනගේ නිමක් නැති
ඒ සෙනගේ නුඹ වාගේ කෙනෙක් නැති
ගලා කඳුළු මගේ දෙනුවන් පිරෙනු ඇති
මා කළ පිනෙන් නුඹටත් පංගුවක් ඇති"

සිංහල ගැමි බෞද්ධයා හෙළ බුදු සමයෙන් කෙතරම් වික්ෂිත වූයේද කිවහොත් ඔහුගේ සිතතුම් පැතුම් චර්යා රටා පමණක් නොව හැඟීම්ද තීන්දු කරන්නට ඒ බුදු සමය අති මහත් බලපෑමක් කළේය. මේ පද්‍යයේ පෙම්වතා තමන් පෙම් කළ ගැහැණිය මහියංගන විහාර භූමියට පැමිණ සිටී දැයි විමසයි. ඒ ඇයගේ ජීවිතය විනාශ කරන්නට නොව හුදෙක් ඇය දැකගැනීම සඳහා පමණි. හේතුව තමන්ගෙන් ඈත් වුවද ඔහුට ඇය වටිනාම ගැහැණිය වන නිසාවෙනි. මේ සොඳුරු සබැඳියාවේ අග්‍ර ඵලය නම් විහාරය වැද පුදා ලබන පින් කදින් භාගයක්ම ඇයට අනුමෝදන් කිරීමයි. මෙබඳු උසස් මිනිස් බවක් හෙළයාට මතු වූයේ බුදුසමයේ විශිෂ්ඨ බලපෑම නිසාවෙන්මය.

"ගහක පොල් කඩා දානේ උයන්නම්
විලක මල් කඩා යහනේ පුදන්නනම්
පාරේ තියන අඩි බල බල අඬන්නම්
මගේ අම්මා මින් මත්තට පතන්නම්"

සිංහල සමාජය තරම් තම ඥාති පරම්පරාවට ආදරය කරන ජන කොට්ඨාශයක් තවත් නැත. එම නිසාවෙන් තමන් ආදරය කරන ඥාති පරම්පපරාව නැවත නැවත සසර පුරා මුණ ගැසීම තරම් සතුටක් සිංහලයාට නැත. ඒ වෙනුවෙන් ඔවුන් පිහිට ප්‍රාර්ථනා කළේද බුදු දහමින්ය. පින් කළහොත් තම මෙලොව පරලොව සියලු අරමුණු ඉටු කරගත හැකිය. යන අදහසට සිංහලයා පැමිණෙයි. එසේම ඒ වෙනුවෙන් ඉහළම පින්කමක් වුව කරන්නට සිංහලයා එකඟ වී තිබෙයි.

සිංහල බුදු සමය විසින් සිංහල සමාජ සංස්ථාව මෙන්ම සිංහල පවුල් සංස්ථාවද යහපත් ලෙස ගොඩ නගන්නට ඉමහත් දායකත්වයක් සැපයීය.

15 පිටුවට...

එස්. දිල්රුක්ෂි අබේකෝන්
පහළ ඇරැවුල
දඹුල්ල.

# පෝතලීය සූත්‍රය ඇසුරින් ආර්ය විනයෙහි කර්මාන්ත වලින් කෙසේ මිදෙමුද?

තුන් ලොවක් ශ්‍රී සද්ධර්මයෙන් සනසා වදාළ භාග්‍යවතුන් වහන්සේ එක් දිනක් පිඩු සිඟා වළඳා දිවා විහරණය පිණිස අංගුත්තරූප ජනපදයෙහි කුඩා වනයකට වැඩම කළ සේක.

පෝතලීය නම් එක්තරා පුරුෂයෙන්ද කුඩයක් ඉසලා පාවහන් සහිත ශරීර ව්‍යායාමය සඳහා මේ වනරොදට පිවිසියේය. පෝතලීය සම්බුදු පියාණන් දැක ඉතා සතුටට පැමිණ පසඟ පිහිටුවා වැද එකත් පස්ව හුන්නේය. එවිට තථාගතයන් වහන්සේ සුදුසු තැනකින් අසුන් ගන්නා ලෙස පෝතලීයහට වදාළේ "ගෘහපතිය" යන ආමන්ත්‍රණයෙනි.

මෙම නාමයට පෝතලීය අකමැති බැවින් තුන් වතාවක්ම භාග්‍යවතුන් වහන්සේ ආරාධනා කරන තුරු ඉවසා සිට "භාග්‍යවතුන් වහන්ස, ගෘහපතිය යන නාමයට මම සුදුස්සෙක් නොවෙමි. ගෘහපතියා යන නාමයට මම සුදුස්සෙක් නොවෙමි. ගෘහපතීහු ධනය ඉපයීම සඳහා කරනු ලබන කර්මාන්ත සියල්ලෙන් මම ඉවත්ව සිටිමි. තිබුණාවූ රන්, රිදී, මුතු, මැණික් ආදී සියල්ලක් දරුවන්ට පවරා දී නිදහස් වුණෙමි. මා සන්තකව ඇත්තේ ඇග වසන ඇඳුමක් හා ශරීර පැවැත්මට ආහාර පාන පමණකි. මම ගෘහපති භාවයෙන් මිදුණෙමි'යි පෝතලීය පැවසීය. එවිට සම්බුදු පියාණෝ "පෝතලීය, ඔබ කර්මාන්ත වලින් මිදිම ගෘහ බන්ධනයෙන් මිදීමට තරම් ශක්තිමත් නැත. ඔබ කැමති නම් ආර්ය විනයෙහි කර්මාන්ත වලින් මිදීම මිදෙන ආකාරය මට දේශනා කළ හැකියි. මෙසේ දේශනා කරන කල්හි ආර්ය විනයෙහි සියළු කර්මාන්ත වලින් මිදෙන ආකාරය ඇසීමට පෝතලීය උත්සුක විය.

"පෝතලීය කර්මාන්ත හෙවත් ව්‍යවහාර මුලින්ම සිඳලීම සඳහා ධර්මතා 08ක් වේ."

1. ප්‍රාණඝාත නොකිරීම භාවිතා කිරීමෙන් ප්‍රාණඝාතාදිය ප්‍රහාණය කළ යුතුය.
2. දුන්දෙය පමණක් ගැනීම භාවිත කිරීමෙන් සොරකම ප්‍රහාණය කළ යුතුය.
3. සත්‍ය වචන භාවිත කිරීමෙන් මුසාවාදය ප්‍රහාණය කළ යුතුය.
4. කේලාම් නොකීම භාවිත කිරීමෙන් කේලාම් කීම ප්‍රහාණය කළ යුතුය.
5. ගිජු ලෝභය නැතිකම භාවිත කිරීමෙන් ගිජු ලෝභය ප්‍රහාණය කළ යුතුය.
6. නින්දා අපහාස නොකිරීම භාවිත කිරීමෙන් නින්දා අපහාස ප්‍රහාණය කළ යුතුය.
7. ක්‍රෝධ උපායාස නොකිරීම භාවිත කිරීමෙන් ක්‍රෝධ උපායාස ප්‍රහාණය කළ යුතුය.
8. නිහතමානි බව භාවිත කිරීමෙන් අතිමානය ප්‍රහාණය කළ යුතුය.

මේ ආකාරයෙන් ආර්ය විනයෙහි සියලු කර්මාන්ත හෙවත් ව්‍යවහාරය පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කළ කල්හි පෝතලීය එය දීර්ඝ වශයෙන් විස්තර වශයෙන් පැහැදිලිකර දෙන මෙන් බුදුපියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය.

මෙහිදී අප කර්මාන්ත හෙවත් ව්‍යවහාරය තේරුම් ගත යුතුය. කර්මාන්ත යනු පුද්ගලයා විසින් කරන්නාවූදේය. මෙය ආර්ය විනයට අනුව ප්‍රාණඝාතයෙන් වැළකිම, සොරකම් කිරීමෙන් වැළකීම, කාමය වරදවා හැසිරීමෙන් වැළකීමය. එසේ නම් ප්‍රාණඝාත, අදත්ථාදාන, වැරදි හැරීමෙන් වැළකීම යන කයින් සිදුවන අකුසල ධර්ම තුනෙන් වැළකී සත්ව කරුණාව, අන්සතු දේ නොගැනීම, නිවැරදි හැසිරීම් රටාව පවත්වාගෙන යෑමය. ව්‍යවහාරය යනු ද මෙයටම නමකි. එදිනෙදා ජීවිතය නිවැරදිව පැවැත්වීම, යහපත් ආකාරයෙන්, සුදුසු ආකාරයෙන් පාවිච්චි කිරීම යනු ව්‍යවහාරයයි. මෙම කරුණු තේරුම් ගෙන අත්හල යුතු දේ අත්හැරීමත්, කළ යුතුදේ කිරීමත් ව්‍යවහාර වේ. එසේනම් මෙහිදී පෝතලීය ආර්ය ව්‍යවහාරය මුලින්ම සිඳ දැමීමට පත් නොවුණේ කුමකින්ද? මෙහිදී පෝතලීය රන්, රිදී, මුතු, මැණික් ආදිය අතහැරියා නොව ගෘහස්ථයෙකු නැතහොත් පියකු විසින් කළ යුතු දේ කළ පමණි. තමාගේ කුටුම්භයේ දරුවන්ට පවරා දී ඇත. ඔහුගේ ගත වසා ඇති ඇඳුම්, හිස්වැසුම් පාවහන් හා ගමන් විලාශයද ගිහිකෙුගේ ඒවාය. එසේ නම් ගිහිගෙදරක වාසය කරන පෝතලීය සෑම අතින්ම ගෘහස්ථයෙකුය. ගිහි ගෙයක සිට සියල්ලෙන් මිදීම හෙවත් සසුන් බඹසර පිරිය නොහැකිය.

සසුන් බඹසර විසීමට නම් මුලින්ම ගිහිකම ඉවතලා කය මනස දෙකම පැවිදි කළ යුතුය. එසේම මතු දැක්වූ කරුණු අටද සපුරාලිය යුතුය.

1. ප්‍රාණඝාත භාවිත නොකිරීමෙන් ප්‍රාණඝාතය ප්‍රහාණය කළ යුතුය.

පාණ + අතිපාතා = පාණාතිපාතා යනුවෙන් දැක්වෙන්නේ ප්‍රාණය නැතිකර දැමීමය. යමෙකුගේ ප්‍රාණය නැතිකර දැමීම කරණකොට ගෙන අපට සිදුවන්නේ කුමක්දැයි ආර්ය ශ්‍රාවකයා ප්‍රඥාවෙන් විමසයි.

යම් කෙලෙස් බැඳීමක් හේතුකොට ගෙන මා ප්‍රාණඝාත කරන්නෙක් වන්නේ නම් ඒ කෙලෙස් බැඳීම ප්‍රහාණය කරණු පිණිස ප්‍රතිපත්තියෙන් යුක්ත වෙමි.

මා ප්‍රාණඝාත කරන කෙනෙක් වුවහොත් ඒ කිලිටි කර්මය නිසා මගේ හදවත මටම දොස් නගාවි.

ප්‍රාණඝාත හේතුවෙන් සිල්වත්, ගුණවත් බුද්ධිමත් අය මා හෙලා දකිවි.

ප්‍රාණඝාත හේතුවෙන් කය බිඳී මරණින් මතු දුගතියෙහි ඉපදීමට කැමති විය යුතුය.

එසේ නම් ප්‍රාණඝාතය වනාහී සසර අපව මුලාවට පත් කරන බැඳීම හෙවත් සංයෝජනයක්ම වෙයි. එම සංයෝජනයෙන් මිදීම නීවරණ ප්‍රහාණයයි. තමන් ප්‍රාණඝාතය කිරීම කරන කොටගෙන දුකකට, සන්ථානයකට පත් වනතේ නම් ප්‍රාණඝාතය නොකරන්නාට එය නිදුකක්මය.

02. දුන්දෙය පමණක් භාවිත කිරීමෙන් සොරකම ප්‍රහාණය කළ යුතුය.

පංචශීලයේහි දෙවන ශික්ෂාපදය බොහෝ දුරට අප අර්ථ ගැන්වෙන්නේ සොරකම් කිරීමෙන් වැළකිම යන්නය. එහෙත් අදින්න ආදාන = අදින්නාදාන වේ. එය නිර්වචනය විය යුත්තේ නොදුන්දේ ගැනීමෙන් වැළකීමය. උදාහරයක් දැක්වුවහොත් ඔබගිහිගෙයි වාසය කරන ට මුදල් අවශ්‍යතාවයක් වේ. තමා ළඟ මුදල් නැත. තම දරුවෙකු සතුව තිබෙන මුදලක් ගෙන ඔබගේ අවශ්‍යතාවය පිරිමසා ගනී. ඔබට මෙය ගැනීම හේතුවෙන් දෙවන ශික්ෂාපදය බිඳී යයි. දරුවා ඔබට මුදල දුන්නා නොව ඔබ විසින්ම ගැනීම නුදුන් දේ ගැනීමයි. එහෙත් ඔබ තුළ වංචනික හැඟීමක් හෝ සොරා ගැනීමේ සිතුවිල්ලක් නැත. දරුවා පැමිණි පසු තමා මුදල් ගත් බව ඔබ පවසයි. එහිදී ඔබ නිවැරදි නොවේ. එබැවින් නිවන අපේක්ෂාවෙන් සසුන් බඹසර වෙසනෙ උපසම් පන්න භික්ෂුවට හා භික්ෂුණියට විනය ශික්ෂා පැනවීමේදී මේ සම්බන්ධව කරුණු ගණනාවක්ම දේශනා කොට තිබේ.

තම විහාරස්ථානයට දායකයා විසින් දන්ගෙන එන්නේ භික්ෂූන් වහන්සේලා/ භික්ෂුණීන් වහන්සේලා උදෙසාය. එහෙත් දානය ගෙනවිත් තබා දායකයා ආපසු ගියේ නම් ඒ තිබෙන දානය වැළඳිය නොහැකිය. අවම වශයෙන් පන්සලේ සිටින කැපකරුවා විසින් හෝ පිළිගැන්විය යුතුය. නැතහොත් දායකයා භාජන පිටින්ම හෝ පිළිගැන්විය යුතුය.

භික්ෂුව මහමග වඩින කල්හි කිසිවෙකුට මේ ගස මගේ යැයි කිවනොහැකි ගසකින් පළතුරු ගෙඩියක් වැටී තිබේ. කුසගින්න, ආහාර අවශ්‍යතාවය, කොතෙක් තිබුණද එය අහුලා වැළඳිය නොහැකිය. ඒ මන්ද යත් එය භික්ෂුවට කිසිවෙකු විසින් නොදුන් දෙයක් බැවිනි.

දැන් ඔබට ආර්ය විනයෙහි ශික්ෂා ආරක්ෂා කළයුතු ආකාරය වැටහෙයි. ඒ නිසයි පෝතලීයහට බුදුරජාණන් වහන්සේ ගෘහපතිය යන ඇමතුමින් ආමන්ත්‍රණය කළේ. එසේම මෙම ශික්ෂාව බිඳීමෙන් තමා ලබන අකුසලයන් හා පාපයන් පිළිබඳව ඔබ ප්‍රඥාවෙන් බැලිය යුතුය.

අන්‍යයන් හෝ ස්වභාව ධර්මයට අයත් දෙයක් මා සතු කරගැනීමෙන් මාගේ උතුම් වූ ශීලය ශික්ෂාවන් බිඳී යයි. එසේ වීමෙන් උත්තරීතර ශීල පාරමිතාව පිරිය නොහැකිය.

මේ කරුණ හේතුවෙන් මා තුළ කෙළෙස් බැඳීමක් සිදුවේ. මා විසින් ඒ කෙළෙස් බැඳීම ප්‍රහාණය කිරීම පිණිස උත්සුක වෙමි.

සොරකම හේතුවෙන් මාගේ හදවත මටම දොස් නගාවී. එයින් මට සතර අපායෙන් එකකට යෑමට සිදුවේ.

එබැවින් මේ ශික්ෂාව කඩකිරීම සංයෝජනයක්ම වේ. එය නිවන වසාලන (නීවරණ) ධර්මතාවයකි. සොරකම හේතුවෙන් මාගේ කල්‍යාණ මිත්‍රයන් මා භාජනයෙන් ඉවත්වේ. මෙලොව වශයෙන්ම මානසික අසහනය, පීඩනය ඇතිව බොහෝ සිත් වේදනා ඇති කරයි. සොරකමින් මිදුනහුගේ සිත සන්සුන් වේ. සිසිල් වේ.

03. සත්‍ය වචන භාවිතයෙන් බොරුකීම ප්‍රහාණය කිරීම.

බොරුකීමෙන් වැළකී සත්‍ය වචන කථා කිරීමට ඔබට අවශ්‍ය නම් ඔබ පළමුව බොරුකීමෙන් ඔබට මෙලොව පරලොව සිදුවන හානිය පිළිබඳව ප්‍රඥාවෙන් බැලිය යුතුය.

යම් කෙළෙස් බැඳීමක් හේතුකොට ගෙන මම බොරු කියන්නේ නම් මෙලොව වශයෙන් මගේ කල්‍යාණ මිත්‍රයන් හා හැර දමාවි.

සත්‍ය දහම වන ශ්‍රී සද්ධර්මය මට අවබෝධ කරගැනීමට නොහැකි වේවි.

යම් දවසක මේ නරක ක්‍රියාව නිසා මගේම හිත මටම දොස් නගාවි.

බොරුව නම් ක්ලේෂය සසර දුක් වැඩිකරන නිවන දුරට යන ක්‍රියාවක් නිසා මුසාව ප්‍රහාණය කිරීමට උත්සුක වෙමි.

සසරට ඇද දමන සසර අනේක විධ දුක් හා අපා දුක් ඇති කරවන මේ මුසාව සංයෝජනයකි. නිවන වසාලන නීවරණයකි. මෙලොව වශයෙන් පිරිහීමට පත්වේ. මානසික පීඩනය අසහනය ඇති කරයි. එබැවින් නුවණ මෙහෙයවා මෙම සංයෝජනයෙන් මිදී සිටින්නාහුගේ සිත මෙලොව වශයෙන් සතුටට, ප්‍රීතියට, සැනසීමට පත් කරයි.

04. කේලාම් කීම, පරුෂ වචනකීම නම් අකුසල කර්ම දෙක ද ඉහත අයුරින් බලන්න.

05. පරිත්‍යාගය දියුණු කොට ගිජු ලෝභය ප්‍රහාණය කරන්න.

ඉහත කරුණ සම්බන්ධයෙන් ආර්ය ශ්‍රාවකයා ප්‍රඥාවෙන් මෙසේ විමසිය යුතුය. ගිජු ලෝභය හෙවත් දැඩි ලෝභය ඇති කරගැනිමෙන් පුද්ගලයා මෙලොව, පරලොව දෙලොවම පරිහාණියට පත්කර ගනියි.

දැඩි ලෝභයෙන් කටයුතු කරන්නාට ඥාති සම්පත්තිය හා මිතුරු සම්පත් හීනවේ.

දනක්, පිංකමක් කළත් ලෝභ සිතුවිලි නිසා එයින් සාර්ථක ප්‍රතිඵලයක් ගෙන නොදේ.

ඇසුරු කරන්නන්ට මහා කනස්සලු ඇති කරයි.

බුද්ධිමතුන්ගේ ගර්හාවට ලක්වේ.

ජීවිත අවසානයේ එතෙක් පැවති ගිජු ලෝභය සිහිවී සතර අපායට පත්වේ.

ගිජු ලෝභය හේතුවෙන් මෙලොව සහනය නැතිවේ. පරලොව සුගතියද අහිමි වේ.

තමා විසින් කරන ලද අකුසල් නිසා තමාගේ සිත තමාටම දොස් නගයි.

එබැවින් ගිජු ලෝභය සංයෝජන උපදවන්නක් බව දැන දෘඪ අධිෂ්ඨානයෙන් බලා ගිජු ලෝභය අත්හැරිය යුතුය.

06. නින්දා අපහාස නොකිරීම භාවිතයෙන් නින්දා අපහාස ප්‍රහාණය කිරීම.

ඉහත දැක්වූ කරුණු අනුව මෙහි ඵල විපාක විසඳාගත යුතුය.

07. ක්‍රෝධ උපායාස නොකිරීම භාවිත කිරීමෙන් ක්‍රෝධ උපායාස ප්‍රහාණය කළ යුතුය.

ක්‍රෝධය යනු දැඩි ලෙස වෛර බැඳගැනීමයි. උපායාස යනු ක්‍රෝධය කරණ කොට ගෙන යම් යම් ස්ථාන හා අවස්ථාවල වචන මගින් හා ක්‍රියා මගින් කම්පනය ඇති කිරීමයි.

මෙයද ඉහත අයුරින් ප්‍රඥාවෙන් බලා මේ හේතුවෙන් ලැබෙන මෙලොව පරලොව දඬුවම් බලා ක්‍රෝධ උපායාස දුරුකර ගත යුතුය.

11 පිටුවට....

ශාස්ත්‍රවේදී වත්තේගම
කුසලධම්මා මෙහෙණින් වහන්සේ


වේදි ගාථා ඇසුරෙන්
11
සැකසුම - චිත්‍ර
...මගේ එකම දියණිය සාදා.. නුඹ හිමිවෑව සිත් ඇතිවයි. ඊයින්නෙ ඇයගේ ඉල්ලීම නුඹව නිදහස් කර ඇයට කරකාර වින්දවා දෙන ලෙසයි
එසේ නම් ඉටු කරන්නේ ඇයගේ ඉල්ලීම... මේ සිටු මැඳුරෙන් පිටතට නොයනු..
හොඳයි සිටු තුමනි මම ඔබතුමා කියන ආකාරයටම සිටින්නම්...
සේවිකාවනි.. මේ පුරුෂයාට සුවඳ පැණින් නාහවා ප්‍රණීත ආහාර පාන දී.. සරසවා ගෙන එනු....
යහපති සිටුතුමනි..
එසේ වුවහොත් රජතුමාට මේ.. රහස හෙළිවී අප සියලු දෙනාටද හිස් ගැසුමා කන්ට සිදුවේවි..
ඔන්න දියණිය... අර සත්තකව සිපිරි ගෙයින් බේරා ගෙන.. සිටු මැඳුරට ගෙන්වා ගත්තා
නුදුරු දිනක අතපැනී වත්කර නුඹ මාගේ සරණ බන්ධනය සිදු කර දෙන්නම්..
දියණිය සාදා- දැන්වත් නුඹට සතුටුයිද... මමත් පියාණනුත් නුඹ වෙනුවෙන් මොන තරම් දේ කැප කරනවද මිං..
ඔහු සුවඳ පැණින් නා පිරිසිදු වී.. ඔබ හමුවට පැමිණේවි.. නුඹෝ අභිරුචිය පරිදි ඔහු හා අල්ලාප සල්ලාපයේ යෙදෙනු.
ඒ.. නුඹට තිබෙන ආදරේටයි.. දැන් ඔබත් සැරසී සිටින්ට සුදුසු තලයට ගොස් ඔහු හා කථා කරන්ට..




# හිත පුරාම නුඹ රැඳී නිසාම නුඹ ගැන හිතනු බැරී....

ගැ: ආදරේ නැතුවා
නුඹ මට ආදරේ නැතුවා
කෙළි කවට හිතක - පෙර දිනක ඉතිර ගිය
ආදරේ නැතුවා..

පි: ආදරේ ඇතුවා
මට එය කියාගන්න බැරුවා
නිල් කෙතට බැඳුණු - වැව් දියක තරමට
හිතේ පිරී ඇතුවා

පි: කැටපත් පවුරට රන්වනු රුසිරි ගයනු බැරී
මහනුවර වැවට දළදා බිම අසිරිය කියනු බැරී
හිත පුරාම නුඹ රැඳී නිසාම නුඹ ගැන හිතනු බැරී.

ගැ: ආදරේ නැතුවා / /

පි: රන්කීරිය මල් පුසුඹද කිරි සුවඳකට හැරී
බිරිඳකි නුඹ මට යෙහෙළියකි මවකි දරුවනට හිමී
හිත පුරාම මගේ දිවි පුරාම මම නුඹ ළඟින් ඉමී

ගැ: ආදරේ නැතුවා

පි: ආදරේ ඇතුවා

**ගේය පද: රත්න කේ. ප්‍රේමසිරි**
**සංගීතය/තනුව: කරුණාරත්න විජේවර්ධන**
**ගායනය: කිත්සිරි ජයසේකර/ නෙලු අධිකාරි**

වෙනස් වන ලෝකයේ වෙනස් නොවන එකම දෙය වෙනස් වීමයයි කියමනක් තිබේ. මේ අනිත්‍යතාව තුළද ප්‍රේමයට හිමිවන තැන කුමක්ද? සදාකාලික නොවූ ලෝකයක සදාකාලික ප්‍රේමයක් සොයා යෑම මුලාවක් යැයි ඇතැම්හු පවසති. එසේ නම් අති නිර්මල යැයි අප සිතන ප්‍රේමයද ලොව නොපවතින ශුන්‍ය දෙයක් වනු ඇතිද?

ප්‍රේමයේ නිත්‍ය අනිත්‍ය බවට තර්ක විතර්ක කොපමණ කෙලෙස තිබුණද මියෙනතුරා ප්‍රේමයෙන් බැඳී ජීවත්වූවන්ද අපට හමුවේ. සිද්ධාර්ථ හා යශෝධරා දෙදෙන අඹු සැමියන් ලෙසින් මහත් ප්‍රේමයෙන් ආත්ම ගණනාවක් යළි යළි හමුවෙමින් අවසන් ආත්ම භවය දක්වාම පැමිණියහ. නකුල පිතා සහ නකුල මාතාවද මෙලෙසින්ම ආත්ම ගණනාවක් ප්‍රේමයෙන් බැඳී සිටියහ. අනිත්‍ය වූ ලෝකයේ තම ප්‍රේමය නොවෙනස්ව පවත්වාගෙන යන්නට හැකිවූ අයද සිටි බව මෙයින් පැහැදිළිය. එනමුත් එවන් පෙම් බැඳුම් දුලභය.

විවාහයක් බැඳී තිබෙන සවිමත් යදම් පුරුක් වන්නේ ප්‍රේමයත්, අන්‍යෝන්‍ය අවබෝධයත් යන කරුණු දෙකයි.

විවාහයක් සිදුවන්නේ නොගැලපෙන දෙදෙනෙකු අතරේය.ගැහැනියක් පිරිමියාත් එකිනෙකට වෙනස්ය.ගැහැනියට ආවේණික ලක්ෂණවූ සියුමැළි බව, කරුණාව, දයාව, ලාලිත්‍යයට ප්‍රතිවිරුද්ධ ලක්ෂණ පිරිමියාට ඇත. හැඩි දැඩි බව, රළු බව, ඉක්මන්කාරී බව ආදී ලක්ෂණ රැසක් ඔහු සතුව ඇත. විවාහයට ගැලපෙන්නේද පිරිමියාගේත් ගැහැනියගෙත් ඇති නොගැලපෙන ගතිගුණයි. මේ නොගැලපීම තුළ අපූර්ව සුන්දරත්වයක් ඇත.

එසේ නොමැතිව දෙදෙනාම රළු, හැඩි දැඩි අය හෝ දෙදෙනාම සුකොමල ළඳ බොළඳ වූවා නම් එතැන ගැලපීමක් නැත. එක් අයෙක් ගින්දර වන විට අනෙකා ඒ ගිනි නිවන සිහිල් පැන් පොදක් විය යුතුය. ගැහැනියගේත් පිරිමියාගේත් පවතින එකිනෙකට පරස්පර ලක්ෂණ ජීවිතයට සුන්දරත්වයක් එක් කළද ඇතැම් විට ඔවුන් අතර ගැටළු මතුකරන්නේද මේ නොගැලපීමයි. රත්න කේ. ප්‍රේමසිරි නම්වූ ගේය පද රචකයා තම ගේය පද රචනයට තේමා කරගන්නේ පොදුවේ සෑම විවාහක යුවළ අතර පවත්නා ගැටළුවකි.

විවාහයට පෙර මහත් ප්‍රේමයෙන් බැඳී දිවි ගෙවූ පෙම්වතුන් විවාහයෙන් ටික කලක් ගතවත්ම, ඔවුන්ගේ බැඳීම් ලිහිල්ව ඇති සෙයක් ඇතැම් විට දක්නට ලැබේ. පෙර පැවති ආදරය බැඳීම දැන් නැතැයි බිරිඳ සැමියාට හෝ සැමියා බිරිඳට චෝදනා කරයි.

විවාහය නිසා ඇතිවන වගකීම් සමුදාය නිසාත්, ජීවත්වීමට දරන අරගලයෙන් හෙම්බත්වීම නිසාත් සැමියාට පෙර මෙන් සැහැල්ලුවෙන් සතුටින් තම බිරිඳ හා දිවි ගෙවන්නට නොහැකි විය හැකිය. බිරිඳටද නිවසේ කටයුතු, දරුවන්ගේ කටයුතු රැකියාවේ කටයුතු නිසා පෙර මෙන් සැමියා හා සතුටෙන් සැහැල්ලුවෙන් දිවි ගෙවීම අපහසු විය හැකිය. එනමුත් එකිනෙකාගේ අවබෝධය ආදරය විවාහය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍යම අංගයකි.

මේ ගීතයට පසුබිම් වන සිදුවීම විවාහයට පොදු ගැටළුවක් වුවද මෙතෙක් කිසිදු ගීතයක සාකච්ඡාවට බඳුන් නොවූ සිදුවීමකි. බිරිඳ පවසන්නේ තම සැමියා පෙර මෙන් ඇයට ආදරය නොකර බවයි. නමුත් සැමියා පවසන්නේ ඔහුගේ සිතේ ආදරය පෙර මෙන්ම ඇති බවය. එසේ නම් වරද කොතැනද?

බිරිඳගේ බලාපොරොත්තුව විවාහයට පෙර තිබුණු සැහැල්ලුවෙන් සතුටෙන් පිරුණු හදවතට දැනෙන ආදරයකි. එනමුත් සැමියාගේ හදවත බිරිඳ කෙරෙහි ප්‍රේමයෙන් බරව තිබේ. ඒ ආදරය වචනයෙන් විස්තර කරන්නට ඔහු අපොහොසත්ය. ගැහැණියත් පිරිමියාත් එකිනෙකට වෙනස් චරිත උසුලන නිසාවෙන් ඔවුනට මේ තුළ ඇති ගැටළුව වටහා ගැනීමට අපහසු වේ. ගැහැණියට පිරිමියෙකු ලෙසින් සහ පිරිමියාට ගැහැණියක ලෙසින් සිතීම අපහසු කයුත්තකි. එනමුත් එකිනෙකාගේ සිතැ;ගියාවෙන් විවෘතව සාකච්ඡාවන්නේ නම් ගැහැණියත් පිරිමියාත් අතර පවතින වෙනද ගැටළුවකට මග පාදන්නේ නැත. වර්තමානයේ විවාහයන් දික්කසාදයන්ගෙන් කෙළවර වන්නේ තම සිතැගි විවෘතව බිරිඳ හා සැමියා සාකච්ඡා නොකිරීම නිසා ඇති වන සැකය දුර දිග යාමෙනි.

රත්න කේ.ප්‍රේමසිරි මෙවන් වාතාවරණයක් තුළ විවාහක යුවළකගේ සංවාදයක් මගින් අපට ඉදිරිපත් කරන ප්‍රේමය පිළිබඳව වන දැක්ම සමාජයේ සාකච්ඡාවට බඳුන්විය යුතුම තේමාවකි. ගේය පද රචකයා ගීතය තළ සැමියා තුළ සැඟව පවතින ප්‍රේමය ඉස්මතු කරයි. අනෙක් පසින් සැමියාත් බිරිඳත් එකිනෙකාගේ සිතුවිලි හඳුනාගෙන පොදු මතයකට එකඟව අන්‍යෝන්‍ය අවබෝධයෙන් දිවිගෙවිය යුතු බව පෙන්වා දෙයි. ගීතය වැනි ජනප්‍රිය, පොදු මාධ්‍යයකින් මෙතෙක් සාකච්ඡාවට බඳුන් නොවුණු තේමාවක් ඉස්මතු කරමින් සංවාදයට බඳුන් කරමින් රත්න කේ. ප්‍රේමසිරි සමාජයට සැල කරන මෙහෙය ප්‍රශංසනීයයි.

ඔහු ගීතයට යොදාගන්නා උපමා රූපක ගීතයේ රසය වැඩි කරලන්නටත් අරුත ඉස්මතු කරලන්නටත් සමත් වෙයි. වැවක් සහ එහි දියවර මුළු රටටම බත සපයයි. ජීවය සපයයි. එවන් වැවක දියවරෙහි වටිනාකම අමිලය. වැවක දිය බිඳු ගණන් කළ නොහැක. එය අසීමිතය. බිරිඳ කෙරෙහි මේ සැමියාගේ ආදරයද වෑ දියමෙන් අමිලය, අසීමිතය.

කැටපත් පවුරේ කෙතරම් ගී ලියැවුණද රන්වන් සීගිරි ලලනාවන්ගේ රුව වර්ණනා කර අවසන් කරන්නට නොහැකිය. දළදා මාලිගය අසල වසර ගණනාවක් සිටියද මහනුවර වැවට එහි අසිරියද කියා නිම කළ නොහැකිය. මොහුගේ ප්‍රේමයත් එලෙස වදනින් කියා නිමකළ නොහේ. ඔහුගේ හිත පුරාම රැඳී ඇත්තේ තම බිරිඳයි.

"රන් කීරිය මල් පුසුඹද කිරි සුවඳකට හැරී
බිරිඳකි නුඹ මට යෙහෙළියකි මවකි දරුවනට හිමී,
හිත පුරාම මගේ දිවි පුරාම මම නුඹ ලඟින් ඉමී.

ගීතයේ මේ පද පෙළ ඇසෙන විට මට තවත් නිර්මාණ දෙකක් මතකයට නැගේ. ඉන් පළමු වැන්න ගුණදාස අමරසේකරයන්ගේ "ගැබ්ගත් ළඳ" නම් නිර්මාණයයි.ගුණදාස අමරසේකරයන් තම නිර්මාණ ආරම්භ කරන්නේ

නිවී සැනසුණු දෙනෙත්
සුදු මැලිවූ දෙකම්මුල්
සුකුමාල අඟ ලසඟ
මගේ හද කකියවයි
බැති සුවඳ වගුරවයි.

පෙර දින පෙම්වතියක ලෙස හැසිරුණු බිරිඳ දැන් මවක් වන්නට සූදානම්ය.

රාග මල බැහැර කළ
බැති සුවඳ වතුරුවන
පෙම්වතිය ඔබ සිරුර
දැන්
අහෝ භක්තියෙන්
මගේ හද හකුළවයි.

මවක් වන්නට සූදානම් වන බිරිඳ පිළිබඳ ඔහුගේ සිතේ නැගෙන්නේ භක්තියකි. රාගය ඔහු සිතින් බහැරවෙයි. මේ සමඟින් මතකයට නැගෙන අනෙක් නිර්මාණය සුනිල් ආරියරත්නයන් රචනා කළ පණ්ඩිත් අමරදේවයන් ගයන "තාත්තා වුණත් මා බත සරිකරන" ගීතයයි. ගීතය අවසන් පද පෙළ මෙලෙසින් ගැයේ.

"බැතිබර හැඟුම් දනවන ඔබගේ සුවඳ
සුරතල් පුතුගෙ මුව කමලෙහි ඇත නිබඳ
අම්මා කෙනෙකු මිස නුඹ මගෙ බිරිඳ ලෙස
නොහැගේ ළඟින් හිඳ මගේ හිස සිඹින සඳ"

රත්න කේ. ප්‍රෙමසිරි , ගුණදාස අමරසිංහ, සුනිල් ආරියරත්න යන නිර්මාණ කරුවන් තිදෙනාම බිරිඳ පිළිබඳ ප්‍රකාශ කරන්නේ අප්‍රමාණ භක්තියෙනි. බිරිඳ තම පැරැණි පෙම්වතිය නොව ඇය මවකි යන්න මොවුන්ගේ සිතේ රැඳී ඇත.


මවක් වීම නිසා වගකීම් වලින් බැඳුණද, රූසිරියෙහි වෙනසක් සිදුවුවද බිරිඳගේ සිත තුළ පැරැණි පෙම්වතිය සැඟවී සිටියි. ඇයට තම සැමියා, දරුවන් සිටින පියෙකු වුවද ඈ පළමුවෙන් දුටු පෙම්වතාය. තම සැමියාගේ ප්‍රේමය පෙරට වඩා පැතිරුණු ගැඹුරු එකක් වුවද ඇයට එය තේරුම් ගැනීමට අපහසුවෙයි. පෙර මෙන් ආදරයක් නැතැයි ඇය සිතන්නේ සැමියාගේ හදවතේ පතුලට වැද ඇති ප්‍රේමය නොදකින නිසාවෙනි. අඹුසැමියන් අතර ගැටුම ඇතිවන්නේද මෙනිසාමය. වත්මන් මනෝ වෛද්‍යවරු දැනෙන්නට ආදරය කරන්නැයි පවසන්නේ මෙනිසාය.

රත්න කේ. ප්‍රේමසිරි නම් පද රචකයාගේ ගීත තේමාව අපේ බුද්ධියටත් හදවතටත් ආමන්ත්‍රණය කරමින් අඹු සැමියන් අතර පැවතිය යුතු ප්‍රේමය , අවබෝධය පිළිබඳ පුළුල් සංවාදයක් ගොඩ නඟයි. නෙලූ අධිකාරිගේ සහ කිත්සිරි ජයසේකරයන්ගේ හඬ මුසුවත්, කරුණාරත්න විජේවර්ධනයන්ගේ තනුව හා සංගීතයත් පද රචකයාගේ අරමුණ සාක්ෂාත් කරන්නට සමත්ව තිබේ.

මේ කලාකරුවන් සිව්දෙනාගේ උත්සාහය සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාව කරා ගෙනයාම බව ගීතය අසන විට අපට හැගේ.

**චාමිකා ජනානි**

# බෞද්ධ සදාචාරයේ ප්‍රවේශය දැනුම අවබෝධය සහ ප්‍රඥාව



බෞද්ධයකුගේ නිත්‍ය ශීලය පංච ශීලයයි. සමාදන් වීමේන් පමණක් නොනැවතී එය ප්‍රයෝගික ජීවිතයට සම්බන්ධ කර ගැනීමෙන් එයින් ලැබෙන පිටි වහල සුළුපටු නොවේ. පන්සිල් සමාදන් වීමට පෙර තෙරුවන් සරණ යෑම පිළිගත් සාම්ප්‍රදායකි.

පංච ශීලය නැමැති මූලික බෞද්ධ සදාචාරයේ ප්‍රවේශය සරණා ගමනයයි. සරණා ගමනය යනු බුදුන් , දහම් , සඟුන් යෑම යි. මෙහිදි බුදුන් සරණ යෑම යනුවෙන් අදහස් කරන්නේ අප තිලෝගුරු සාස්තෲවරයාගේන් ලත් ප්‍රඥව බෝධයේ අග්‍රඵල එහෙයින් "බුද්ධං සරණං ගච්චාමි" යනුවෙන් අදහස් වනුයේ ප්‍රඥාවබෝධය පිහිට කොට ගැනීම හා යම් ශක්ති ප්‍රමාණයෙන් අප පිහිට කොට ගෙනීම හා යම් ශක්ති ප්‍රමාණයෙන් අප ජීවිතයට ආදේශ කර ගැනීම. වශයෙන් හැදින් විය හැකිය.

දහම්සරණ යෑම සරණා ගමනයේ දෙවැනි පියවරයි. විශිෂ්ඨතම සදාචාර මාර්ගය උපයෝගි කොට ගැනීම හා අපගේ ජීවිත වලට ආදේශ කරගැනීම ලෙස හැදින් විය හැකිය.

සඟ සරණ යෑම සරණාගමනයේ තෙවැනි පියවරයි. මෙහිදී අප සරණ යනුයේ බොදු දහමට අනුව ගමන් ගත් අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයයි.

ලොව විශිෂ්ඨතම ප්‍රඥාවන් සදාචාර මැර්ගයෙන් සරණ පිහිට කොට ගෙන අප ජීවිත වලට ආදේශ කර ගැනීම ඉතාම වැදගත් වේ. තෙරුවන් සරණ යෑමට අමත රව පංචශීල ප්‍රතිපදව ඒසේත් නැත්නම් පන්සිල් පිළිබදව දැන් විමසා බලමු. බුද්ධ ධර්මයට අනුව මූලික වන්නේ ශීලයයි. ශික්‍ෂා පද යනු හික්මෙන පදයයි. ඒ අනුව සාර්ථක ජීවිතයකට අවශ්‍ය වන මූලික පදනම පංචශීලය තම ජීවිත වලට හැකි අයුරින් සම්බන්ධ කර ගැනීම පළමු කොට සිදු කළ යුතුයි.

පරපණ නැසීම අන්සතු දේ ගැනීම කාමයෙහි වරදවා හැසීරිම බොරු, කේලාම් කීම, මත්පැන් පානය යන මේවායින් බාහිරව සිදුවන අයහපතට වඩා අභ්‍යන්කරවෙ තමන්ට අත්වන දැවීම අති විශාලය. නොයෙකුත් මානසික පීඩාවන්ට මානසික පසුබෑම් වලට හා නොයෙකුත් ව්‍යසන වලට මුල්වේ. එම නිසා පන්සිල් සමාදන් වීම මෙන්ම තම ජවීත වලට ආදේශ කර ගැනීමේන් මනසට වඩාත් සිසිල් බවක් ඇතිවේ. තමසිත තමන්ට රිසි ලෙස නතුකර ගතහැකි වන්නේ එවිටය.

නූතන අධ්‍යපනයෙහි දැක්වෙන දැනුම යනු යම් යම් තොරතුරු වලින් ලබන දැනුම මුල්කර ගෙන තමන් තුල පවත්නා විචක්‍ෂණතාවයෙන් මනස තුල ඇති කරගන්නා ස්ථාවරයයි.වර්ථමානයේ අපේ අධ්‍යපනයට වඩා දැනුමට වැඩි අගයක් දෙන බව පෙනේ. අධ්‍යපනයේ අරමුණ විය යුත්තේ දැනුමට වඩා අවබෝධයයි. නමුත් බුදු දහමට අනුව යථාවබෝධය ඥානය ලබා ගැනීම සඳහා ප්‍රඥාව මහෝපකාරී වේ.

තිසරණ කෙරෙහි අවබෝධාත්මක ශ්‍රද්ධාවක් ඇති කරගෙන සම්මා දිට්ඨියෙන් ( චතුරාර්ය සත්‍ය පිළිබඳ අවබෝධය පිණිස ඇතිවන සිත නුවණින් විමසීමයි. ) යුක්ත ශීලය රැකීමේදී යථාගත ඥාණයන් අවබෝධය ඥාණයන් ඇතිවේ. ප්‍රඥාව යනු විශේෂ දැන ගැනීමයි. විඥ්ඥාණය යනු අවබෝධ කරන දෙයකි. ප්‍රඥාව ආධාරයෙන් විඥ්ඥාණය අවබෝධ කළ යුතුය. එවිට අකුසල් සිතුවිලි දුරස් වී සිකෙහි සන්තිස් බෝධී පාක්ෂික ධර්ම වැඩෙන්නට පටන් ගනී. එවිට සිතේ ප්‍රීතිය ප්‍රභාශ්වර ගතිය සිත හාකයෙහි සැහැල්ලුකම ඇතිවේ බුදුරජාණන් වහන්සේගේ දහමට අනුව ජීවත් වීම පන්සිල් පද පහ රැකීම ඉතාම වැදගත්ය.

ඒසේම නිවන් මාර්ගය ඉතාම ප්‍රීතීමත්ය. සැනසිලි දායකය. සැනසුන සිත ප්‍රීතිමත් සිත ප්‍රබෝධමත් කරයි. ප්‍රීතීමත් සිත ප්‍රබෝධමත් සිත පහසුවෙන් සමාධිගත වේ. සමාධි ගතවු සිතෙහි ප්‍රඥාව පහළ වේ. දියුණු කර ගන්නා වු ප්‍රඥාව නිවනට මගයි.

අවබෝධයෙන් තිසරණ සරණ යමු. පිරිසිදු බුද්ධ වචනය සියළුම බෞද්ධයින් තුල සනාථ කරමු. ශීල සමාධි, ප්‍රඥාව, ගුණධර්ම දියුණු කරමින් අර්ය මාර්ගයයේ ගමන් කර ආර්ය ශ්‍රවකයන් බවට පත් වෙමු. පෘතග්ජන භාවයෙන් මිදෙමු. සිහිණුවණින් අවබෝධයෙන් ප්‍රඥාවෙන් ජීවත් වෙමු. භාවනා කරමු. පරමාර්ථ දහමට අනුව ජීවත් වෙමු. භාවනා කරමු. අපේ ජීවිත වලට ආරක්‍ෂාව ලංකර ගනිමු.

චවින්ද්‍රා වෛද්‍යරත්න

# ජන කවියා දුටු

## බුදුන්, බුදු සමය සහ සිංහල සමාජය

"කල් බලා නොවෙද ගොවිතැන් කරන්නේ
මල්වරා නොවෙද කිරි වැද පැසෙන්නේ
හෙනහුරා නොවෙද වැහිපල නොදුන්නේ
ලොව්තුරා බුදුන් කවදද දකින්නේ"

මෙරට බුදු සමය පැමිණෙන්නට පෙර සිටද සිංහල ජනතාව මෙහි ජීවත් වූ බවට සාධක තිබුණත් බුදු සමය පැමිණීමත් සමඟම සමාජය තුළ පමණක් නොව ලාංකීය මිනිසා තුළද ප්‍රබල වෙනස්කම් රාශියක් සිදු විය. බොහෝ විට සිදුව ඇත්තේ එතෙක් පැවති දේශීය ඇදහිලි විශ්වාස පද්ධතියත්, පසුව පැමිණි බුදු දහමත් එකතු වී පාරිභාෂිත නැතහොත් ව්‍යවහාරික බුදුදහම නිර්මාණය වීමයි. මෙහි ප්‍රතිඵලය බුදුසමයෙන් ශික්ෂිත වූ ජන කොට්ඨාශයක් මේ රටේ ඇති වීමත්, බුදු සමයෙන් වියුක්ත කොට මේ රටේ ජනතාව විග්‍රහ කළ නොහැකි වීමත්ය. අතීතයේ පටන් හෙළ ජනතාව ගැයූ දහස් ගණන් කවි කරනුයේ අප රටට අනන්‍යවූ මේ සිංහල බෞද්ධ ලකුණයි.

"කල් බලා නොවෙද ගොවිතැන් කරන්නේ
මල් වරා නොවෙද කිරි වැද පැසෙන්නේ
හෙනහුරා නොවෙද වැහිපල නොදුන්නේ
ලොව්තුරා බුදුන් කවදද දකින්නේ"

මෙරට බොදු ජනතාව තම පෞද්ගලිකත්වයට වඩා සැළකිලිමත් වූයේ ආගමික කටයුතු වලටය. ඔවුහු නොකා නොබී දුක සේ ජීවිත ගත කළත් බුදුන් වෙනුවෙන් කරන ලද කැපවීම නොසපකා හැරියේ නැත. මේ කවියේ කතකයාද ඒ අතීත සිංහල ලකුණ අපූර්ව ලෙස පෙන්වා දෙන්නකි. මේ කවියේ කතකයා ගොවිතැන පාලු වීම පිළිබඳ පසුතැවිලි නොවේ ඔහුට එන පපසුතැවිල්ල නම් අස්වැන්න පාලු වීම නිසා මෙවනර අළුත් සහල් මංගල්‍යයට සහභාගී වන්නේ කෙසේද යන්නයි. බුදුන් වෙනුවෙන් එසේ සිතුවත් තම අඹු දරුවන් පවා අමතක වීම, සිහිපත් නොවීම පුදුමයට කරුනක් වෙයි. බුදුන් වහන්සේට ගොවියා එදා දැක්වූ ගෞරවය තම දරුවන් පවා සිහිපත් නොවීමට හේතුවන්නනට ඇත.

දුම්බර බැද්දේ මඟ ඉදලා මැදින් සමු
කඩා පලු වීර කාලා වතතුර බොමු
අඬන බිලිඳු හට නැවතී කිරි පොවමු
මහියංග නේ වැඳලා අඬ අඬා යමු"

මේ කවියේ උපාසිකා මාතාව නුවර සිට මහියංගනය වඳින්නට ගිය ශ්‍රද්ධාවන්තියකි. ඇය මහියංගනය මහා විහාරය වැඳ හඬමින් නැවත පැමිණි වගක් සඳහන් වෙයි. මේ කවියෙන් හෙළි කරන්නේ එදා බෞද්ධ ජනතාව තම දිවිය දෙවනි කොට වන්දනා ගමන්වල නිරතවූ අයුරුයි. නඩයට එකතුවන කිසිවකුටත් නැවත යහතින් එන්නට ලැබෙතියි යන්න පිළිබඳව සහතිකයක් දිය නොහැක. කුමන හෝ ආකාරයේ විපත්වලට මුහුණ දෙන්නට එවුනට සිදුවිය හැකිය. එහෙත් අපූර්වතම දෙය නම් තම ජීවිත වලට වඩා මේ මිනිසුන් බුදුන් දැකීම, වැඳීම ශ්‍රේෂ්ඨ කර ගැනීමයි. එසේම මේ අයට මහියංගනය වැනි දාගැබක් ගඩොල් ගොඩක් වූයේ නැත. මේ ශ්‍රද්ධාවන්ත ජනතාවට මහියංගන සෑ සමිඳු යනු බුදු සමිඳුන්මය. දාගැබ වැඳ පුදා ගෙන නැවත එන්නට යද්දී ඔවුන් හඬා වැලපුනේ ඒ නිසාවෙනි.

සතර දෙපෝදා පුන් සඳ බැබලෙ නනවා
අහරකයට නැති දා බල අඩු වෙ නවා
නෑර කළ කුසල් අකුසල් පල දෙනවා
වේර පිටිය චේතිය අද බැබ ලෙනවා

ලාංකීය සමාජයේ පිරිමියා ආගම දහම කෙරෙහි බොහෝ දුරට නැඹුරු වන්නට පෙළඹෙන්නේ කය බල නැතිව වියපත් වූ විටය. එයට හේතුවද ජීවිතයේ කායබල ඇති කාලය පුරාම කෙතට හේනට දිවිය කැප කිරීමයි. අඹුදරුවන් වෙනුවෙන් කාලය ගත කිරීමයි. කෙමෙන් කෙමෙන් අබල දුබල වෙද්දී සංසාරික බියක් සිංහල බෞද්ධයා තුළ ඇති වෙයි. එවිට ඔවුන් පෝයට සිල් ගනිමින් ආගමික ජීවිතයකට නැඹුරු වෙති. නමුත් ලාංකීය කාන්තාව නම් කුඩා කළ පටන්ම ආගම දහමට ලැදි ශ්‍රද්ධාවන්ත අයෙකු බවට පත්වෙයි.

දෙතනේ රත්‍රං කිරි එරෙනා බෝ
කොතැනේ වදිතත් වට සිටිනා බෝ
නීතියේ සව් සිරි සත රකිනා බෝ
හිතුසේ වදින්නනට යමු සිරිමා බෝ"

ලාංකීය බෞද්ධ සමාජය තුළ ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඇත්තේ ශ්‍රේෂ්ඨ ස්ථානයකි. එක් පසකින් එය අපේ කල්ප වෘක්ෂය සේ හැඳින්විය හැකිය. ඉහත කව ගැයූ ගැමියා බෝධීන් වහන්සේ මිනිසාට ලබා දෙන සම්පත් ත්‍රිත්වයම කුමක්දැයි හෙළි කරයි. එනම් දරු සම්පත්, සියලු භෞතික සැප හා මනුෂ්‍යාගේ ආරක්ෂාව යන ඒවායි. මෙයින් පෙලන්වා දෙන්නේ සිංහල බෞද්ධයා තුළ බෝධීන් වහන්සේ පිළිබඳව ඇති විශ්වාස පද්ධතියයි. අදත් සිංහල ගැමියෝ මෙම කරුණු තුන සාක්ෂාත් කරගන්නට ශ්‍රී මහා බෝධියේ පිහිට පතයි.

මහියංගනේ ආ සෙනගේ නිමක් නැති
ඒ සෙනගේ නුඹ වාගේ කෙනෙක් නැති
ගලා කඳුළු මගේ දෙනුවන් පිරෙනු ඇති
මා කළ පිනෙන් නුඹටත් පංගුවක් ඇති"

සිංහල ගැමි බෞද්ධයා හෙළ බුදු සමයෙන් කෙතරම් වික්ශිත වූයේද කිවහොත් ඔහුගේ සිතතුම් පැතුම් චර්යා රටා පමණක් නොව හැඟීම්ද තීන්දු කරන්නට ඒ බුදු සමය අති මහත් බලපෑමක් කළේය. මේ පද්‍යයේ පෙම්වතා තමන් පෙම් කළ ගැහැණිය මහියංගන විහාර භූමියට පැමිණ සිටී දැයි විමසයි. ඒ ඇයගේ ජීවිතය විනාශ කරන්නට නොව හුදෙක් ඇය දැකගැනීම සඳහා පමණි. හේතුව තමන්ගෙන් ඈත් වුවද ඔහුට ඇය වටිනාම ගැහැණිය වන නිසාවෙනි. මේ සොඳුරු සබැඳියාවේ අග්‍ර ඵලය නම් විහාරය වැද පුදා ලබන පින් කදින් භාගයක්ම ඇයට අනුමෝදන් කිරීමයි. මෙබදු උසස් මිනිස් බවක් හෙළයාට මතු වූයේ බුදුසමයේ විශිෂ්ඨ බලපෑම නිසාවෙන්මය.

පොල් කඩා දානේ උයන්නම්
විලක මල් කඩා යහනේ පුදන්නම්
පාරේ තියන අඩි බල බල අඬන්නම්
අම්මා මින් මත්තට පතන්නම්

සිංහල සමාජය තරම් තම ඥාති පරම් පරාවට ආදරය කරන ජන කොට්ඨාශයක් තවත් නැත. එම නිසාවෙන් තමන් ආදරය කරන ඥාති පරම්පපරාව නැවත නැවත සසර පුරා මුණ ගැසීම තරම් සතුටක් සිංහලයාට නැත. ඒ වෙනුනේ ඔවුන් පිහිට ප්‍රාර්ථනා කළේද බුදු දහමින්ය. පින් කළහොත් තම මෙලොව පරලොව සියලු අරමුණු ඉටු කරගත හැකිය. යන අදහසට සිංහලයා පැමිණෙයි. එසේම ඒ වෙනුවෙන් ඉහළම පින්කමක් වුව කරන්නට සිංහලයා එකඟ වී තිබෙයි.


සිංහල බුදු සමය විසින් සිංහල සමාජ සංස්ථාව මෙන්ම සිංහල පවුල් සංස්ථාවද යහපත් ලෙස ගොඩ නගන්නට ඉමහත් දායකත්වයක් සැපයීය. මේ එබඳු කවියකි.

අන් හිමි එපා වෙන්නේ යම රජු දැකලා
අන් හිමි එපා වෙන්නේ යමයෝ දැකලා
අන් හිමි එපා වෙන්නේ ඉබුලේ දැකලා
අන් හිමි එපා වෙන්නේ අවිචිය දැකලා"

සමාජය යහපත් වන්නේ පවුල් සංස්ථාව යහපත් වුවහොත් පමණි. හෙළ ජන කවියා බුදු සමයෙහි ශික්ෂිත වනවාත් සමඟම පින් පව් පිළිබඳව දැඩි විශ්වාසයක් තැබීය. අපාය, යමරජු, කටු ඉබුල ආදිය අකුසල් කළහොත් ලැබෙන විපාකය මේ පිළිබඳව සඳහන් කරන විට ගැමියා කුඩා දරුවන්ට පවා බුදු සමය කොතරම් සියුම් ලෙස හදවතට ඇතුල්කර ඇත්තේද යන්න පැහැදිළි වෙයි. බුදු හිමියන් සහා බුදු සමය පිළිබඳව හෙළ බොදු ජන මනස තුළ ඇති විශ්වාසයත් බදු සමයෙන් සිංහල සමාජය කෙතරම් පෝෂනය වී තිබේද යන්නත් මින් අපට මනාව පැහැදිළි වන කරුණකි.

එස්. දිල්රුක්ෂි අබේකෝන්
පහළ ඇරැවුල
දඹුල්ල.

# පස්කම් සැපයට ගිජුවී නොයමු අප සැම නිරයට



අද ලොව කැළඹෙන්නේ කරුණු තුනක් පාදක කරගෙනයි. පළමුවැන්න අධිසුඛෝපභෝගී ජීවන රටාවකට කෑදර වූ බලවතුන් ලෝකයේ සම්පත් බහුතරයක් තමා සතුකර ගැනීමේ තෘෂ්ණා බරිත අධිවේගී ගමනයි. දෙවැන්න නම් තමන් පමණක් බලවතා විය යුතු යැයි පුද්ගලයින් හා රටවල් අසාධාරණ මිත්‍යාමතයක එල්ලී තමා පරයා නැගී සිටින්නවුන් පාගා දැමීමට ගෙනයන තරඟකාරී ක්‍රියාමාර්ග. තුන්වැන්න නම් ඉහත කී දෙපාර්ශවය විසින් විශ්වයට මුදාහරින නරක දුෂ්ට සිතුවිලි තරංගයක් මගින් සත්ව සහතිකයේ පැවැත්මට සුභවාදී මෙහෙවරක් යෙදුනු ස්වභාව ධර්මයේ ක්‍රියාදාමය විකෘති ගෙන දෙන පීඩා.

බුදුරජාණන් වහන්සේ පිවිතුරු දහම් මඟට පිටුවා විකෘති මානසිකත්වයෙන් යුක්ත වූ මිනිසුන් ගෙනයන මේ අපරාධකර ක්‍රියාමාර්ග අභිමුවෙහි අප කුමක් කළ යුතුද? නොදරුවන් රෙදිපිළි ගේ දොර අපිරිසිදු කරයි. වැඩිහිටියන් ඒවා පිරිසිදු කොට යථා තත්වයට ගනී. අනුවණා වූ මිනිසුන් ලෝකය වනසද්දී නැණවතුන් යළි යළිත් එය සනසාලිය යුතුය. පව්කාරයන්ගේ සිත්වලින් මුදාහරින දූෂිත චේතනා මර්ධනය කොට බලවත් ලෙස නැගී සිටිය හැකි යහපත් චේතනා යහපත් මිනිසුන් විසින් මුදාහල යුතුය. ඉවසීම, කරුණාව, මෛත්‍රිය වැනි බුද්ධ පාක්ෂික සාධු චරියාවන් ඒ සඳහා යොදාගත හැකිය. දූවෙන සිත් නිවන්න, මෙත් වඩන්න, සෙත් පතන්න. එවිට අපට ලෝකය නිවැරදි කිරීමට දායක විය හැකිය.

ධම්ම පදයෙන් උපුටාගත් මේ ගාථා ධර්මය කියවා බලන්න.

පුප්ඵානිහේව පචිනන්තං - බ්‍යාසත්ත මනසං නරං

සුත්තං ගාමං මහෝ සොව - මච්චු ආදාය ගච්ඡති

කාමය, ලෝක පැවැත්ම තහවුරු කරන තදබල බැඳීමකි. ලෝකය ලෙස අදහස් කළේ පෘතුවිය හෝ වෙනත් ග්‍රහලෝකයන් නොව අපගේ මේ ස්කන්ධ පංචකයයි. (රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ) භාවය ලෙසද මේ ලෝකය හඳුන්වයි. ආත්මභාවය ලෙස එයට උරුමයක් ද ලබාදී තිබේ. මේ ආත්මභාවය නැමැති ලෝකය මගේ ලෝකය ලෙස අයිතිකරගෙන සැප සොය සොයා වෙහෙසෙන්නේ කාමයේ උත්තේජනය පදනම් කරගෙනයි. වස්තු කාම, ක්ලේශ කාම යැයි කාමය දෙවැදෑරුම්ය . ගේ දොර, වතුපිටි, ඉඩ කඩම්, යාන වාහන, මිල මුදල් ඇඳුම් පැලඳුම් ආදී ආකර්ශනීය යුගලපද ලේඛනයකින් හඳුන්වා ඇති සකලවිධ වස්තු සියල්ල කෙරෙහිම අප තුල ඇති ආශාව වස්තු කාම ලෙසත්, ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංච ඉන්ද්‍රියන් මගින් ලබාගන්නා පංචකාම (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ) කෙරෙහි පවතින දැඩි ආශාව ක්ලේෂ කාම ලෙසත් බුදුදහමේ හඳුන්වා තිබේ.

මේ සියලු ආකාරයේ කාමයන් කෙරෙහි බැඳී ලද දෙයින් තුටු නොවී නොලද දෙය ගැනම සිත සිතා දුක් වෙවී අකුසල් සිත් උපදවා මරණින් පසු දුගතියෙහි උපදින බවයි. මේ ගාථා ධර්මයෙන් කියා දෙන්නේ.

සැවැත්නුවර පසේ නදී කොසොල් රජතුමා දිනක් උඩු මහලේ සිට මහමඟ ගමන්කරන පිරිස් දෙස බලාසිටියදී සිත් පහන් කරවන දසුනක නෙත ගැටුණි. එනම් විශාඛා සිටු දියණිය අනේපිඩු සිටුතුමා ආදී සැදැහැ සිත් ඇතිමහෝ පාසිකාවනගේ නිවෙස් කරා දන් පිණිස වඩින භික්ෂූන් වහන්සේලාගේ දසුනයි.

අනතුරුව කොසොල් රජතුමා ද බුදුරජාණන් වහන්සේ බැහැදැක තම නිවසට ද දන් පිණිස වඩින ලෙෂ බුදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට ආරාධනා කළහ. මේ අනුව සත්දිකන් මුළුල්ලෙහි බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දන් පිළිගැන්වූහ. සත්වන දිනයේ දී ද මහ රජු පසුදින දානයට ආරාධනා කරද්දී බුදුවරු දින හතකට වඩා එකම ස්ථාන යකින් නොවළදන්නේ යැයි දේශනා කළ බුදුරජාණන් වහන්සේ එම ආරාධනාව ආනන්ද මහ තෙරුන් වහන්සේ වෙත භාර කළහ. ආනන්ද මහ තෙරුන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ සතියක් එහි පිළිවෙලින් දන් වැළඳූහ. අටවෙනි දිනයෙහි කොසොල් රජතුමා රාජකාරි කටයුතු වෙනුවෙන් වෙන්වී දානමය කටයුතුවල යෙදීමට නොහැකි විය. රජ ගෙදරින් අණක් නොලැබුණු කල්හි එහි සේවක සේවිකාවෝද දන් පිළියෙල කිරීමෙහි නිරත නොවී සිටියහ. දානය පිණිස මාළිගාවට වැඩි බොහෝ භික්ෂූන් වහන්සේ බලා සිට කල් ඉකුත්ව ඇති බැවින් ආපසු වැඩම කළහ. එදින මහ රජු පන්සීයක් දෙනා වහන්සේ සඳහා පිළියෙල කළ ආහාර එසේම තිබෙනු දැක කිපී බුදුන් වහන්සේ වෙත ගොස් භික්ෂූන් මා ගැන නොසිතා යාමට හේතුව කුමක්දැයි ප්‍රකාශ කළහ. එවිට තථාගතයන් වහන්සේ භික්ෂූන් අතර වරදක් නැත මහරජ, ඔබ කෙරේ මගේ ශ්‍රාවකයන් තුළ කිසිදු විශ්වාසයක් නැත. එනිසා එහි නොගියේය. යනුවෙන් වදාළ සේක. එහිදි තථාගතයන් භික්ෂූන් අරඹයා කරුණු නමයක් පෙන්වාදී භික්ෂූන් වහන්සේලා එම ස්ථානවලට පමණක් යා යුතු යැයි දේශනා කළහ.

එම ස්ථානයන් මෙසේය.

1.භික්ෂූන් එනු දැක සතුටු සිතින් නැගිට සිටීම

2.සතුටු සිතින් වඩා හිඳුවා පසඟ පිහිටුවා වැඳීම.

3.සතුටු සිතින් සුදුසු අසුන් පනවා වඩා හිඳුවීම.

4.ඇති දෙය නොසඟවා දීම.

5.බොහෝ ඇතිවිට බොහෝ කොට දීම.

6.මිහිරි දෙයම සකස් කොට දීම.

දෙන දෙය සකස් කොට දීම.

7.අනුමෙවෙනි බණ අසන්නට ලැඳිව හිඳීම.

8.බණ අසන විට කන්දී මනාව ඇසීම.

මෙම දේශනාව අවසානයේ රජතුමා තීරණය කළේ බුදුරජාණන් වහන්සේ ඥාතී සම්බන්ධතාවයක් තිබෙන නම් මෙතරම් මා අවතක්සේරු නොවනු ඇත කියාය. උන්වහන්සේ ඥාතී කුලයකින් විවාහයක් කරගතහොත් බුදුන් වහන්සේ ඥාති රජවරුන් නිතර මා හමුවීමට පැමිණේවි යැයි සිතා මට සරණ පිණිස දියණියක් එවන්න යැයි ශාක්‍යයන් වෙත පණිවුඩයක් යැවීය. කුල මානයෙන් මත්ව සිටි ශාක්‍යවංශිකයෝ තම වංශයට නොගැළපෙන රජ කෙනෙකුට සිය කුමරියන් පාවා දීමෙන් සිය වංශයට සිදුවන හානිය සළකා මහානාම ශාක්‍ය රජහට දාව දාසියකගේ කුසින් උපන් වාසභ ඛත්තියා නම් තරුණියක් ඒවා කොසොල් රජ මුලා කළේය. ඇය නොබෝ කලකින් බිහිකළ පුතු විඩූඩභ නම් විය.

විඩූඩභ කුමරු දාසය වන වියට පත් කල්හි මුතුන් මිත්තන් දකින්නට කිඹුල්වතට ගොස් ආපසු පැමිණි විට දාසියකගේ පුතු වාඩිවූ පුටුව යැයි කියමින් සේවිකාවක් ඔහු වාඩිවූ පුටුව යැයි කියමින් සේවිකාවක් ඔහු වාඩිවූ පුටුව සෝදන්නට විය. විඩූඩභ කුමරුගේ සේවා භටයෙක් සිය ආයුධයක් අමතකවීම නිසා රැගෙන එන්නට ආපසු ගියවිට මේ ක්‍රියාව දුටුවේය. ඔහු සැනෙකින් පැමිණි කුමරුට සියළු තොරතුරු දැන්වීය. කුමරු ඒ අසා කුපිතව යම් දිනක මා රජ වූ විට ඔවුන්ගේ බෙලි කපා ලේ වලින් මා හුන් ඒ පුටුව සෝදවමියි අදිටන් කොට ගෙන සිටියේය .

කොසොල් රජු මිය ගිය විට විඩූඩභ රජ පැමිණ නොබෝ දිනකින් ශාක්‍යයන්ට එරෙහිව යුද සෙනඟ පිරිවරා කිඹුල්වතට යාමට පිටත් විය. බුදුරජාණන් වහන්සේ එදවස ලොව බලා වදාරා තම ඥාතින්ට එරෙහිව විඩූඩභ යුද වදින්නට සැරසෙන බව දැන එහි වැඩම කොට අතරමඟ තනී සෙවණ සහිත ගසක් මුල වැඩ සිටියහ.

විඩූඩභ බුදුරජාණන් වහන්සේ දැක සමීපයට ගොස් වැඳ මෙසේ විමසයි. ස්වාමීනි, මේ ග්‍රීෂ්ම වෙලාවෙහි තුනී සෙවණැති ගස මුල වැඩ සිටින්නේ ඇයි? එවිට බුදුරජාණන් වහන්සේ ඥාතී සෙවණ සිසිල් වෙයි. යනුවෙන් දේශනා කළහ.

බුදුරජාණන් වහන්සේ ඥාතීන්ට උපකාර පිණිස පැමිණි බව දැන විඩූඩභ ආපසු සැවැත්නුවරට ගියේය. මේ අයුරින්ම දෙවන තුන්වන වර ද සිදුවිය. සතරවන දින ද විඩූඩභ යුදයට ගොස් අචිරවතී ගඟ අසල කඳවුරු බැඳගෙන සිටියදී රාත්‍රී මහා ගංවතුරක් ගලා විත් විඩූඩභ රජු ඇතුළු පිරිස මුහුදට ගසා ගෙන ගියේය. මල් කඩ කඩා රැස් කරන තැනැත්තෙකු මෙන් මෙලොව පසකම් නැමැති මල් සොයන්නා වූ එහි තදින් ඇලුනාවූ සත්වයා නිදා සිටි ගමක් මහ මුහුදට ගසාගෙන යන පරිදි මෘත්‍යුමාර විසින් ෂතර අපාය නැමැති මුහුදට රැගෙන යයි. මේ විෂකුරු සසරේ අප ලද මිනිසත් භාවය මුළාවට නොව සසරින් මිදීම පිණිස යොදාගෙන කටයුතු කිරීම වැදගත් බව මේ ධම්මපදයෙන් ප්‍රකාශ වෙයි. ඔබ සැමට ඒ දහම් මඟ විවර වේවා.

ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු

9 පිටුවෙන්....

## ථෙර ථෙරී ගාථා වලින් හෙළිවන නිර්ව්‍යාජ චරිත

මරණය සඳහා අන්‍යයන් අඩන්නේද වැලපෙන්නේද එය නිෂ්ප්‍රයෝජන දෙයකි. සොබාව ධර්මය අනුව එය සිදු වන්නේය. හැඩීමෙන් ඇසද සිරුර ද වර්ණය හා බලයද නුවණ ද පිරිහේ. සතුරෝ සතුටු වන අතර මිතුරෝ දුක්වේ.

යම් සේ පිරුණු ගංගාව නැවකින් පවුරකින් පාරුවකින් තරණය කරන්න දේ එසේම ඥාණවන්තයින් මේ සියළු දුක් කම්කටොලු වලින් නිදහස්ව සදා සැප ඇති නිවන අවබෝධ කරගනී. යනුවෙන් මහා කප්පින රහතන් වහන්සේ තම නිරාමිස ප්‍රීතිය ප්‍රකාශ කර ඇත.

මාගේ ඥාණ ශක්තිය අන්ධ විය. මාව හෝ දක්නා ලදුවෙමි. මාගේ සොහොයුරුද තෝ දූන් ගෙට යවයි එළවන ලදී. එවිට මම ශාසනීය අපේක්ෂා ඇතිව නොසතුටින් සිටියෙමි. එවිට බුදුන් වහන්සේ මාගේ හිස පිරිමැද මට අනුකම්පාවෙන් පා පිස්න කඩක් දී අධිෂ්ඨාන කොට භාවනා කරවයි වදාළහ.

මම බුදුනගේ බස් අසා සසුනෙහි ඇලුනෙමි. උතුම් පරමාර්ථයට පැමිණීම සඳහා සමාධිය ඉපදීමි. පෙර විසූ කඳ පිළිවෙල දනිමි. ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ. ඉන්පසු කාලය දන්වන තුරු රම්‍ය වූ අඹ වනයෙහි තම පිළිරු දහසක් මවාගෙන සිටියෙමි. ඉන්පසු බුදුන් වහන්සේ කල් දන්වමින් මා වෙත දූතයෙකු එවන ලදින් මම අහසින් එහි ගියෙමි. බුදුන් වැද එකත්පසුව සිටියෙමි. ඉන්පසු මා පිළිබඳ සියළු තොරතුරු සිවුවනක් පිරිස මැද විස්තර කරන ලදැයි චූල පන්ථක රහතන් වහන්සේ ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කර ඇත.

එමෙන්ම කප්ප මහ රහතන් වහන්සේ මේ ශරීරය පිළිබඳ ප්‍රකාශ කරන ආකාරය දකින විට පෘතග්ජන අපට ඇති වන පිළිකුල් සහගත සිතුවිලි කොපමණ දැයි කිව නොහැක. නොයෙකුත් මළ වලින් පිරුණු වැසිකිළියක් සේ පිළිකුල් වූ මච්කුසින් පැරණි හරක් මඩුවත් වූ ලෙයින් මසින් නහරවලින් පිරුණු වරවසින් බරවූ මේ කය හැම කලහිම කුහුම පවතී.

සැටක් මහ නහරින් බැදුණු මාංශ සංඛ්‍යාත ලේ පියෙන් අනූන වූ චර්ම සංඛ්‍යාත කුණුකයින් යුක්ත වූ මේ කුණුකය නිෂ්ප්‍රයෝජනය. අට සැකිල්ලෙන් ගඨන ලද නහර හුයෙන් බදනා ලද මේ කය ෂතර මහා භූතයින්ගෙන් ඉරියව් පවත්වන මරණය කරා නිරතුරුව පැමිණෙන මේ කය හැර දමා යන්නේය. අවිද්‍යාව නැමැති නීවරණයෙන් වැසී ඇත. මෝහ නැමැති කැමැත්තෙන් සොයන ලද මේ කය සම්පත්තිය විපත්තිය කෙළවර කොට ඇත. අඳ බාල වූ යම් පෘතග්ජන කෙනෙක් මේ කය කෙරෙහි ආලය කරත්ද ඔහු පුනර්භවය නැවත නැවත ඇතිකර ගන්නේ යයි ප්‍රකාශ කර ඇත.

මෙසේ ථෙර තේරණින්ගේ හෘදයාංගම හැගීම් ප්‍රකාශ කර ඇත. සියළු කෙලෙසුන් නසා රහත්බවට පත් වූ රහතන් වහන්සේලා තම අතීත ජීවිත ගැන කෙතරම් සජවේගයකින් පසු වන්නේ යැයි පැහැදිළිය. මතු ආත්මයන් ගැන විශ්වාසයක් නොමැතිව තම කටයුතු කරන නූතන සමාජයට මෙම ප්‍රකාශන කෙතරම් අගනේදැයි සිතිය යුතුය.

07 පිටුවෙන්....

## මෙතෙරින් එතෙරට

සක්කාය දිට්ඨිය ලෙස හඳුන් වන්නේ පංච උපාදානස්කන්ධය නිත්‍ය, සුඛ, ආත්ම ලෙස ගැනීමයි. බුදුපියාණන් වහන්සේ පුරුෂයා ලෝකය හෙවත් මෙතෙර තුළ බැඳ තබන බන්ධනයන් මෙසේ උපමා උපමේය ඇසුරින් දේශනා කරයි.

රජතුමා - පුරුෂයා සසරේ ගෙනියන කර්මයයි.

විෂඝෝර නාගයන් සතර දෙනා - සතර මහ භූතයන්ය. (එනම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ)

වධකයින් පස්දෙනා - පංච උපානස්කන්ධයයි.

සවන වධකයා - නන්දි රාගයයි

හිස් ගෙවල් සහිත ගම - ආධ්‍යාත්මික රූප හයයි. (එනම් ඇස, කණ, නාසය, දිව, කය, මන)

ගම් පහරණ සොරුන් හයදෙනා - බාහිර රූපයි. (එනම් වර්ණ රූප, ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, ඵොට්ඨබ්බ රූප සහ ධම්ම රූප)

තරණය කළ යුතු ගංගාව - සතර ඕඝයෝය. (කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝ)

පවුර - ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.

අතින් පයන් වෑයම් කිරීම - උට්ඨාන වීර්යයි.

ලෝකයෙන් එගොඩ වීමට උපකාර කළ යුත්තේ ලෝකය තුළම ඇති දෙයකි. එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයි. නමුත් එතෙර වූවාට පසු මෙතෙර ඇති දේ වලින් එලක් නැත. එබැවින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය නැමැති පවුරත් අතහැරිය යුතුය. දැන් එම පුරුෂයා කිසිඳු බැදීමක් නැති බියක් සැකක් නැති එතෙර නැමැති අභයපුරට ගොඩබැස එහි බ්‍රාහ්මවංශ ඇතිව අභිෂේක ලබනවා මෙන් උතුම් අරහත්වයට පත්වන්නේය.

අපත් අධිෂ් ඨානයෙන් සහ උත්සහයෙන් වීර්යෙන් යුතුව ලෝකයෙන් අතමිදි ලෝකෝත්තර නිර්වාණයට ගමන් කිරීමට සද්ධර්මය පවතින මෙම කාලය තුළම කටයුතු කළ යුතුය. අති දුර්ලභ ව ලැබෙන සද්ධර්මයෙන් ප්‍රයෝජන ගෙන දුක් ඇති මෙතෙරින් දුක් නැති එතෙරට ගමන් කරමු.

13 පිටුවෙන්...

## පෝතලීය සූත්‍රය ඇසුරින් ආර්ය විනයෙහි කර්මාන්ත වලින් කෙසේ මිදෙමුද?

08. අනතිමානීබව ඇති කරගැනීමෙන් අතිමානය ප්‍රහාණය කිරීම.

මානයෙහි අවස්ථා තුනකි. එනම් නිහතමානි බව, අනතිමානි බව හා අතිමානයයි. නිහතමානිබව යනු නි -හත -මාණී = නි යනු නැත යන්නයි. හත යනු ඒකාන්තයෙන් මානි යනු මානය. එනම් මානය සම්පූර්ණයෙන් නැතිකළ යන්නය. හනම් රහතන් වහන්සේය. අනාගාමි උතුමන් ලඟද මානය තිබේ. මානය යනු තමා පිළිබඳවත් අනුන් පිළිබදවත් විවිධාකාරයෙන් මැන බැලීමයි. අතිමානය යනු මානයේ උපරිම කාලයයි. එම උපරිම බව යම් පමණක්ට වර්ධනය කර ගෙන අවබෝධයෙන් බුදුමඟ යන ශ්‍රාවකයා අනතිමානිවේ. අනතමානිබව නැති කරගැනීමට තමා පිළිබඳවත් අන්‍යයන් පිළිබඳවත් සත්‍ය හා සාධාරණ ලෙස ප්‍රඥාවෙන් බැලිය යුතුය. එනම් තමා යනු දෙතිසක් වූ පිළිකුල් සහගත කොටස්ය. එසේම නාම රූප සමුදායක් පමණි. ආදී වශයෙන් දැකීමය.

මෙම කරුණු අට පිළිපැදීමෙන් වුවද ආර්ය විනයෙහි සෑම ආකාර යකින්ම සියළුම ව්‍යවහාර සමුච්ඡේද නොව බව තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළහ. මෙය පැහැදිලි කිරීමට බුදුරජාණන් වහන්සේ උපමා කීපයක් දේශනා කොට වදාළහ.

"පෝතලීය කුසගින්න නිසා පීඩිත වූ බල්ලෙකුට ලේ පමණක් තැවරුන මස් රහිත කටුවක් ලැබේ. පින්වත දැන් බල්ලා කරන්නේ කුමක්ද? මුලින් ලේ ටික ලෙවකා මස් රසය ඇත්තේ ඇතුලතැයි සිතා ඉතාම වෙහෙස වෙමින් මස්කටුව හපයි. එයින් ඔහුගේ අරමුණ සම්පූර්ණවේද? නැත. කුසගින්නෙන් පීඩිත වූවහු තවතවත් අසරණ වෙයි. එනිසා බුද්ධ ශ්‍රාවකයා නුවණින් කල්පනා කරන්නේ බුදුරජාණන් වහන්සේ කාමයට උපමා කොට තිබෙන්නේ සාගින්නට ලැබෙන්නේ මස් කටුවක් බවය. කුසගින්නට ආහාරයට ගත නොහැකි කටුවක් හපා වෙහෙසට පත් වන්නේ කෙසේද මිහිරක් සුවයක් ලැබෙතැයි සිතා කාම ගෝචර වූවන් එයින්ම වෙහෙසට පීඩාවට පත්ව මතු භවයද අපාගත කරගනී. එසේ නම් ඇස, කණ, නාසය, දිව, ශරීරය කියන ආයතන පහ පිළිබඳවත් නුවණින්ම දැන බුද්ධ භාෂිතයට අනුව ගිජුලිහිණියෙක් මස් කැබැල්ලක් ගෙන පියාසර කරන වට පසුපස හඹා එන අනෙකුත් පක්ෂීන්ගෙන් විඳින පීඩාව සේ හොඳින් දැවෙමින් තම අතින් අල්ලාගෙන සිටන කණ හුල සේ සියලු මාර්ගයන් අතහැර මහා ගිණි අගුරු වලක් වෙත යන්නා සේ කිසිදා සත්‍ය නොවන සිහිනයක් සේ මෙම ඉන්ද්‍රිය පහ තුළින් ගෝචර කර ගන්නාවූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නිසා ඇති කරගන්නා වූ කාමයන් හේතුවෙන් බොහෝ දුක් උපදවන බවය. එබැවින් සීල, සමාධි, ප්‍රඥා උපදවා ගෙන සෝවාන් ආදී මගඵල ලබා ගැනීමෙන්ම මෙම සක්කාය දිට්ඨි ආදී සංයෝජන සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම තුළ ආර්ය විනයෙහි කර්මාන්ත වලින් මිදී අමා මහ නිවන ලබත්වා.



12 පිටුවෙන්....

## බුදු සමයට පෙර

"අන් හිමි එපා වෙන්නේ යම රජු     දැකලා
අන් හිමි එපා වෙන්නේ යමයෝ     දැකලා
අන් හිමි එපා වෙන්නේ ඉබුලේ     දැකලා
අන් හිමි එපා වෙන්නේ අවිචිය     දැකලා"

සමාජය යහපත් වන්නේ පවුල් සංස්ථාව යහපත් වුවහොත් පමණි. හෙළ ජන කවියා බුදු සමයෙහි ශික්ෂිත වනවාත් සමඟම පින් පව් පිළිබඳව දැඩි විශ්වාසයක් තැබීය. අපාය, යමරජු, කටු ඉබුල ආදිය අකුසල් කළහොත් ලැබෙන විපාකය මේ පිළිබඳව සඳහන් කරන විට ගැමියා කුඩා දරුවන්ට පවා බුදු සමය කොතරම් සියුම් ලෙස හදවතට ඇතුල්කර ඇත්තේද යන්න පැහැදිළි වෙයි. බුදු හිමියන් සහා බුදු සමය පිළිබඳව හෙළ බොදු ජන මනස තුළ ඇති විශ්වාසයත් බදු සමයෙන් සිංහල සමාජය කෙතරම් පෝෂනය වී තිබේද යන්නත් මින් අපට මනාව පැහැදිළි වන කරුණකි.

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2021 නොවැම්බර්- 2565 ඉල් කලාපය

# සත්වයා පසුපස හඹා එන කුසල් අකුසල්



කුසල් අකුසල් පිළිබඳ බලන කල්හි එය බුදු දහමෙහි මූලික ඉගැන්වීමක් ලෙස පෙන්වා දීමට පුළුවන. එතුළින් සත්වයාට යහපතත්, අයහපතත් කැඳවන්නාහ. බුදුරජාණන් වහන්සේගේ දේශනය වන්නේ විමුක්තිය තමා විසින් ම ලබාගත යුතු බවය. බුදුවරු ඒ සඳහා මඟ පෙන්වන්නාහ. දෙවියෙකුට, බ්‍රහ්මයෙකුට, ඊශ්වරයෙකුට විමුක්තිය උදාකර දිය නොහැක. නොපෙනෙන දෙවියෙකුට, බ්‍රහ්මයෙකුට පුද්ගලයා සුගතියට හෝ දුගතියට පත්කළ නොහැක. එය තමා විසින් කරගත යුතු දෙයකි. බුදුරජාණන් වහන්සේ වනාහි මඟ පෙන්වන මාර්ගෝපදේශකයෙක් මිස විමුක්තිදායකයෙකු නොවේ. බුදු දහමේ අවසාන අරමුණ වන්නේ නිවනයි. ඒ සඳහා හොඳ - නරක, යහපත් - අයහපත්, හිතකර - අහිතකර, හරි - වැරදි වැනි හැසිරීම් හා ඒ පිළිබඳ ඉගැන්වීම් විග්‍රහ කිරීම් වස් ආචාර ධර්ම පිළිපැදිය යුතුය. කුසල් අකසල් පිළිබඳ කරුණු විග්‍රහ කිරීමේදී කරුණු දෙකක් පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. එනම්,

**බුදුරජාණන් වහන්සේ නොකළ යුතුයැයි දේශනා කළ වැරදි - පඤ්ඤත්ති වජ්ජ**
**සමස්ථ ලෝකයා විසින් ම නොකළ යුතුයැයි සම්මත වැරදි - ලෝක වජ්ජ**

කුසල් අකුසල් වලට අමතරව, සදාචාරාත්මක ඉගැන්වීම් රාශියක් බුදු සමය තුළ දක්නට ලැබේ. කුසල් - අකුසල් යන වචන දෙකට ළඟින් යන යුගල පදයන් ලෙස ''පුඤ්ඤ - පාප, සාවජ්ජ - අනවජ්ජ, ධම්ම - අධම්ම, අරිය - අනරිය, පරිසුද්ධ - අපරිසුද්ධ, සුචරිත - දුච්චරිත, සුක්ත - දුක්කත, සප්පුරිස - අසප්පුරිස, කල්‍යාණ - පාපක, සුක්ත - කණ්හ '' හැඳින්වීමට පුළුවන. මෙහිදී කුසල් හා අකුසල් දෙක මූලිකත්වයෙහි තබා ඇති අතර පෙළ සාහිත්‍ය තුළ කුසලාකුසල දෙක ආචාර විද්‍යාත්මක සංකල්පයක් ලෙස දක්වා ඇති අයුරු දැකගත හැකිය. එනම්, ''අත්ථි භික්ඛවේ කුසලාකුසල ධම්මා, සාවජ්ජා නාවජ්ජා ධම්මා'' (මහණෙනි, කුසල් අකුසල් සදොස් හා නිදොස් වශයෙන් ඇත) පුණ්‍ය ක්‍රියා තුළින් දිව්‍ය මානුෂික සැප සම්පත් ලබාගැනීමට හැකි වුවද සසර විමුක්තිය උදෙසා සෘජුවම බලපාන්නේ කුසල ශක්තියයි.

''ඉදං කුසලන්ති බෝපන තේන භගවතා සුපඤ්ඤත්තං ඉදං අකුසලන්ති සුපඤ්ඤත්තං ඉදං සාවජ්ජ'' (ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කුසල් යයි මේ අකුසල් යයි ප්‍රඥාවෙන් දැන) ආදී වශයෙන් දේශනාකර ඇති අතර ''සේවිතබ්බා'' (විමුක්තිකාමිකයෙකු අනුගමනය කළ යුතු අතර) අසේවිතබ්බං (විමුක්තිකාමිකයෙකු අනුගමනය නොකළ යුතු වග කුසලාකුසල විනිශ්චය කිරීමේදී අපට අවධාරණය කළ යුතු කරුණු ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව කුසලාකුසල විමුක්ති සුවය සඳහා සම්බන්ධ වන අයුරු පැහැදිලි වේ.

හොඳ යනු කුසලයයි. නිවැරදි, දක්ෂ, කායසීක්ෂම, උසස්, සත්‍ය, යහපත් යන අර්ථ ද ඒ සම්බන්ධව යොදා ඇත. ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ සම්මා යනුවෙන් හොඳ, නිවැරදි යන අර්ථ ගෙන දී ඇති බව පෙනේ. මෙහි දී හොඳ ගණයට අයත් වන්නේ අලෝභ, අදෝෂ, අමෝහ යන සිතුවිලි හා ඒ සම්බන්ධව තිදොරින් වන දේවල්ය. හොඳ නරක පිළිබඳ තිදොරින් ක්‍රියාත්මක වන අයුරු මෙලෙස විග්‍රහ කරගත යුතුය.

කය හරහා- සතුන් මැරීම නොහොත් ප්‍රාණඝාතය
සොරකම් කිරීම නෙහොත් අදත්තාදානය
කාමයෙහි වරදවා හැසිරීම නොහොත්
කාමමිත්‍යාචාරය
වචනය හරහා- බොරු කීම නොහොත් මුසාවාදය
කේළම් කීම නොහොත් පිසුණාවාචය
නපුරු වචන කතා කිරීම නොහොත්
පරුසා වාචය
හිස් ප්‍රලාප දෙඩවීම නොහොත් සම්ප්‍රප්ඵලාපයට
සිත හරහා-අන් වස්තුවකට දැඩි ලෝභකම දැක්වීම නොහොත්
අභිද්‍යාව
අන් අය නැසීමේ තරහව නොහොත් ව්‍යාපාදය
වැරදි දැකීම නොහොත් මිත්‍යා දෘෂ්ඨිය
එදිනෙදා ජීවන ප්‍රතිපදාව නිවැරදිව පවත්වා ගෙන යෑම සඳහා මෙම කරුණු ඉවහල් වේ.

ඉහත කරුණු දහය නොකර සිටීම දස කුසල් ගණයට ද කිරීම දස අකුසල් ගණයටද ඇතුළත් වේ. අටුවාචාරීහු පෙන්වා දෙන්නේ ''කුච්චිතෙ පාපකෙ ධම්මේ සලෙන්ති කම්පෙන්තීති කුශලා'' (නරක නපුරු පාප ධර්මයන් සොලවා කම්පාකොට විනාශ කිරීම) කුසලය බවය. කුසල් නොවන්නේ අකුසල්ය. දැඩි කුසල මූලික සිත පාප ධර්මයන් නසාලීමට සමත් වන නිසා පවිටු දහම් නසාලීම යන අරුතින් කුසල නාමය යෙදීම සුදුසුය. බුද්ධ ඝෝෂ හිමි ධම්ම සංගනි අටුවාවෙන් කුසල් නොහොත් හොඳ පිළිබඳ අර්ථ දක්වා ඇත්තේ,

1.ආරෝග්‍යා
2.නිරවද්‍ය
3.දක්ෂ
4.සෞභාග්‍ය යන සංකල්පය තුළිනි.

බුදුරජාණන් වහන්සේ කුසල් අකුසල් පිළිබඳ වැදගත් සූත්‍ර රාශියක් දේශනා කොට ඇත. ඒ අතර මංගල, පරාභව, වසල, සිඟාලෝවාද, ව්‍යග්ගපජ්ජ, කරණීය මෙත්ත ආදී සූත්‍ර ඉතා වැදගත් වේ. මෙලොව - පරලොව යහපත පිණිස පවත්නා ආකාරයෙන් පින් දහම් රැසක් සිදුවන සූත්‍ර ලෙස ඒවා හඳුන්වා දීමට පුළුවන. ම.නි. අම්බලට්ඨික රාහුලෝවද සූත්‍රය තුළින් රාහුල හිමියන් මුල් කරගෙන තිදොරින් කුසල් අකුසල් දැන හැඳිනගෙන කළ යුතු ආකාරය පෙන්වා දී ඇති අතරම ''කම්මං කත්තුකාමො'' (කර්මයක් කිරීමට සිතන කල්හිද ''කරොන්තෝනපි'' (කර්මයක් කරන විටද) කත්වාපි (කර්මය කලාට පසුවද) හොඳින පරීක්ෂා කළ යුතු බව දේශනා කරන ලදි. ඒ බව වැඩි දුරටත් මේ අයුරින් දේශනා කළහ.

1.පච්ච වෙක්ඛිත්වා පච්ච වෙක්ඛිත්වා කායේන කම්මං කාතබ්බං
2.පච්ච වෙක්ඛිත්වා පච්ච වෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං
3.පච්ච වෙක්ඛිත්වා පච්ච වෙක්ඛිත්වා මනසාය කම්මං කාතබ්බං

තමන්ගේත් අනුන්ගේත් අහිත පිණිස පවතින ක්‍රියා නොකළ යුතුය. එයට හේතුව එය දුකක් ගෙන දෙන බැවිනි. කුසල්වල ස්වභාවය එය නිරන්තරයෙන්ම තමන්ගේත් අන්යන්ගේත් යහපතට හේතුවන දේවල් ගෙන දීමය. තම නුවණින්ම හොඳ නරක විමසිය යුතු අතර ආත්මාර්ථය සේම පරාර්ථය ගැන ද සිතිය යුතුය. කාලාම සූත්‍රයට අනුව එවකට භාරතීය සමාජය තුළ හොඳ යයි සම්මතව තිබුණු කරුණු පිළිබඳව අනාවරණය වේ. එම කරුණු දහය නම්,

1.අසන ලද කරුණක් අනුව - අනුස්සවේන
2.පාරම්පරික විශ්වාසය අනුව - පරම්පරාය
3.මෙය මෙසේ යැයි පවසා ඇති නිසා - ඉතිකිරාය
4.පොත පතෙහි තිබූ පමණින් - පිටක සම්පදානේන
5.තර්කයට ගැළපෙන නිසා - තක්කහේතු
6.න්‍යායට ගැළපෙන නිසා - නයහේතු
7.කල්පනාවට අනුරූප වන නිසා - ආකාර පරිවි තක්කේන
8.දෘෂ්ටියට ගැළපෙන නිසා - දිට්ඨි නිජ්ඣානක්ඛන්තියා
9.එය හොඳයයි පෙනෙන නිසා - බබ්භරූපතාය
10.ආචාර්‍ය ශ්‍රමණයන් වහන්සේ කී නිසා - සමණෝ ගරූහි

මෙවැනි අදහසක් වීමංසක සූත්‍රය තුළින්ද දේශනා කොට ඇත. එනම්, බුදුරජාණන් වහන්සේ දේශනා කළ පමණින් නොපිළිගෙන හෘදය සාක්ෂියට අනුවම යමක් පිළිබඳ විනිශ්චය කළ යුතු බව එයින් වැඩි දුරටත් දේශනා කොට ඇත. කාලාම සූත්‍රය තුළ ඇති අන්තර්ගතය තුළින් කියවෙන්නේ කුසල් අකුසල් පිළිබඳ වුවද නිගමනයකට ඒමේදී ගතානුගතික අදහස් හෝ කිසිවෙකුගේ අදහසකට හෝ යටත් නොවී නිදහස් චින්තනයට මුල්තැන දී එතුළින් හොඳ නරක නිර්ණය කළ යුතු බවය. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි යුගය තුළ අන්‍යාගමික නායකයින් දේශ
කළේ ''ඉදමේවසච්චං - මෝඝ මඤ්ඤං'' මගේ දහ
පමණක් හරි බවත් අන් අයගේ දහම සහ අන්‍යාගමි
තුළ විශාල පරස්පරතාවයක් දක්නට ලැබේ. බුදු දහ
තුළ ඇත්තේ නිදහස්, නිවහල් චින්තනය හා ස්වාධීන
තමා විසින් ම බැලීමේදී බුදු දහම කොතරම් ඉදිරියෙ
සිටින දර්ශනයක් ද යන්න මනාව පැහැදිලි වේ. ආග
කීපයක අදහස් පිළිබඳ පරීක්ෂාකර බැලීමෙන් ඒ බ
මනාව පැහැදිලි වේ.

1. කිතු දහම - දෙවියන් වහන්සේගේ කැමැත්තට අනු
සියල්ල හොඳය නැත්නම් නරකයට ඒවා අකුසල්
කුසල්ය. වශයෙන් තේරුම්ගත යුතු අතර දෙවිය
විසින් හොඳ නරක විනිශ්චය කරනු ලබයි.
2. හින්දු දහම - එම ඉගැන්වීම්වලට එරෙහි වන්න
ඝාතනය කිරීම කුසල හෙවත් හොඳ ක්‍රියාවක් බ
දක්වන අතර හොඳ නරක පිළිබඳව එකම අදහස
එහි නැති බව පෙන්වා දේ.
3. ඉස්ලාම් දහම - අල්ලාගේ කැමැත්ත පරිදි හො
නරක තීරණය කර ඇති අයුරු දක්නට ලැබේ.
4. බ්‍රාහ්මණ ආගම - මහානුභාව සෘෂීන් පවසන
වේද පාඨවල ඉගැන්වීම් නිවැරදිය. ඒවා සත්‍ය
පිළිගත යුතුය. අනෙකුත් ආගම් තුළ ද මෙබ
ආකාරයෙන්ම කුසල් අකුසල් නොපෙනෙන දෙවියෙකු
භාර කර ඇත.

බුදුදහම වනාහි දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ අ
කිසිවෙන් මත ස්වාධිපත්‍යය හිමි කොට දී නැත. ත
කළ කුසල් අකුසල් තමන්ම විඳිය යුතු බවත්, විමුක්ති
තමා විසින්ම ලද එකක් බවත් දේශනා කොට ඇත. ඊ
අමතරව මනෝ විද්‍යාත්මක පිළිවෙත් ක්‍රමයක් ලෙස,

අත්තාධිපතෙය්‍ය
ලෝකාධිපතෙය්‍ය
ධම්මාධිපතෙය්‍ය

යන පිළිවෙත් ක්‍රම තුන දක්වා ඇති අ
එතුළින් හොඳ නරක විනිශ්චය කොට ජීවන ප්‍රතිපදා
සකස් කරගත යුතු ආකාරයක් දක්වා ඇත. ඒ අනු
කුසල් අකුසල් අප පසු පස ගමන් කරන කරත්
රෝදයක් සේ ද භවයෙන් භවයට ගොස් සැප විපා
ලබාදෙන බවයද සිතිය යුතුය. එතුළින් ජීවිතයට සැ
ගෙන දෙන්නේ කුසල්ය. එය වැඩිදියුණු කරගැනී
සඳහා දාන, ශීල, භාවනා දී ත්‍රිපුණ්‍යක්‍රියා පිරිය යුතු
ඒ බව සිතට ගෙන අකුසල් වලින් වැළකී කුසල් සි
පහල කරගැනීම ප්‍රඥාගෝචර වන්නේය.

මහව, උඩගම ශ්‍රී ඉන්දසුමන මහ පිරිවෙන්හි,
ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛණ ශාස්ත්‍රී
ගලගෙදර රතනවංස ස්ථවිර

මෙම තීරුවට ඔබටත් ලිපි එවිය හැකියි. ඔබේ ලිපි වචන 250කට කැටි කොට එයට අදාළ පින්තූරයක්ද සමඟ අප වෙත එවන්න. අප්‍රකට හා ඓතිහාසික පුණ්‍යභූමි පිළිබඳ විස්තරයන්ට ප්‍රමුඛස්ථානය හිමිවේ. ඔබේ ලිපි සෑම මසකම පොහෝ දිනට සති 2කට පෙර එවන්න.

රංගිරි ශ්‍රී ලංකා පුවත්පත,රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය,දඹුල්ල. (rangirinewspapers@gmail.com)